ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව

# 2017
# වාර්ෂික වාර්තාව

www.pucsl.gov.lk

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව

# වාර්ෂික වාර්තාව

# 2017

# අන්තර්ගතය


## 05
### ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව
ආයතනික තොරතුරු 07
කොමිෂන් සභාව 08
අපගේ මෙහෙවර සහ අපගේ දැක්ම 10
ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ කාර්යයන් 11
දීර්ඝ කාලීන අභිමතාර්ථ 12

## 16
සභාපතිතුමාගේ පණිවිඩය 16

## 17
අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය 17

## 22
2017 සංක්ෂිප්තය 22

## 25
### ප්‍රගතිය
නියාමන කාර්යභාරය 25
පාරිභෝගික සබඳතා 28
විදුලි අයකුම හා ආර්ථික කටයුතු 29
විදුලි ආරක්ෂාව හා පරීක්ෂාව 32
පරිසර, පුනර්ජනනීය විදුලිය හා කාර්යක්ෂමතාවය 35
බලපත්‍ර නිකුත් කිරීම 36
අවම පිරිවැය දිගු කාලීන විදුලි
ජනන සැළැස්ම (LCLTGEP) 38
ඛනිජ තෙල් 39
මහජන දැනුවත් කිරීම් 41
මහජන උපදේශන 42
වාර්තා හා අධ්‍යයනයන් 43
ආයතනික සන්නිවේදනය 44
මානව සම්පත් හා පරිපාලනය 45
තොරතුරු තාක්ෂණ හා කළමනාකරණ
තොරතුරු පද්ධතිය 46

## 13
### විශේෂ අවස්ථා
2016 විශේෂ අවස්ථා 14
2017 විශේෂ අවස්ථා 15

## 47
### 2018 සැලැස්ම
ශ්‍රී ලංකා මහජන උපයෝගිතා
කොමිෂන් සභාවේ 2018 වසර
සඳහා වූ සැලැස්ම 47

## 57
### විගණකාධිපති වාර්තාව
විගණකාධිපති වාර්තාව 57

## 74
### මූල්‍ය ප්‍රකාශනය 2017
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය 74
විස්තරාත්මක ආදායම් ප්‍රකාශනය 75
මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය 76
සම කොටස් විචලනයන් පිළිබඳ ප්‍රකාශනය 77
සාමාන්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති 78
අනාවරණ 82

## 88
### විගණන කමිටු වාර්තාව
2017 වර්ෂය සඳහා වූ විගණන කමිටු වාර්තාව 88

# ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව (කොමිෂන් සභාව) විදුලිබල කර්මාන්තයේ ආර්ථික, ආරක්ෂක හා කාර්මික නියාමක ආයතනය වශයෙන් ජාතික ආර්ථිකයේ ප්‍රධාන කාර්ය භාරයක් ඉටු කරන අතර, ලිහිසි තෙල් වෙළඳපලෙහි ඡායා නියාමක ආයතනය වශයෙන්ද කටයුතු කරයි.

අප විසින් විදුලිබලය උත්පාදනය, සම්ප්‍රේෂණය, බෙදා හැරීම, සැපයුම හා භාවිතය යන අංශ නියාමනය කරන්නෙමු.

අප විසින් සම්පාදනය කරන්නාවූ බොහෝ වැදගත් සේවාවන් අතර, ශ්‍රී ලංකාවේ විදුලිබල අංශය තුළ විදුලි පාරිභෝගිකයන් සඳහා ප්‍රමාණවත් ආයෝජන, වඩා ඉහළ මට්ටමේ විදුලිබල සම්පාදනයක්, කාර්යක්ෂම සැපයුමක් හා වඩා වර්ධනය වූ සේවා ගුණාත්මකභාවයක් සපයා දෙනු ලබන බවට කොමිෂන් සභාව විසින් සහතික වේ.

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනත මගින් පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විදුලිබල අංශය නියාමනය කිරීම සඳහා පිහිටුවනු ලැබ ඇත.

කොමිෂන් සභාවේ අරමුණු, කාර්ය භාරයන් හා නෛතික රාමුව 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනත, 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත සහ 2013 අංක 31 දරන ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත යටතේ අර්ථ නිරූපණය කර ඇත.

පළමු කොමසාරිස්වරුන් කණ්ඩායම හා අධ්‍යක්ෂ ජනරාල්වරයා පත් කරන ලද 2003 වර්ෂයේදී ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව ක්‍රියාත්මක වීම ආරම්භ විය. සාමාජිකයන් පස් දෙනෙකුගෙන් සමන්විත කොමිෂන් සභාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ එකඟතාවය සහිතව ප්‍රතිපත්ති සංවර්ධන විෂය භාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබේ.

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනත මගින් කොමිෂන් සභාව වෙත ජල සේවා කර්මාන්තය හා ඛනිජ තෙල් කර්මාන්තය නියාමනයටද අවශ්‍ය අධිකාරී බලය පවරා තිබේ. කෙසේ වුවද, එකී කර්මාන්ත දෙක නියාමනය සඳහා වූ පනත් පාර්ලිමේන්තුව මගින් සම්මත කළ යුතුව පවතී.

# ආයතනික තොරතුරු

**කොමිෂන් සභාවේ නම**

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව

**නෛතික තත්ත්වය**

2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා
කොමිෂන් සභා පනත මගින් ස්ථාපනය කරන ලදී.

**2017 වර්ෂය තුළ කොමිෂන් සභාවේ සාමාජිකයන්**

සාලිය මැතිව් මහතා - සභාපති
සංජය ගමගේ මහතා - නියෝජ්‍ය සභාපති
මහාචාර්ය රාහුල අත්තලගේ මහතා - සාමාජික
ප්‍රසාද් ගල්හේන මහතා - සාමාජික

**අධ්‍යක්ෂ ජනරාල්**

දමිත කුමාරසිංහ මහතා

**කොමිෂන් සභාවේ ලේකම්**

ජානකී එම්. විතානගම මහත්මිය

**ලියාපදිංචි කාර්යාලය**

6 වන මහල, ලංකා බැංකු වෙළඳ කුලුණ, ශාන්ත මයිකල් පාර,
කොළඹ 3, ශ්‍රී ලංකාව.

විද්‍යුත් තැපෑල : info@pucsl.gov.lk
දුරකථනය : +9411 239 2607/8
ෆැක්ස් : +9411 239 2641
වෙබ් අඩවිය : www.pucsl.gov.lk

**විගණකවරුන්**

විගණකාධිපති දෙපාර්තමේන්තුව, 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල.

**බැංකුකරු**

ලංකා බැංකුව
පළමු හා දෙවන මහල, ලංකා බැංකු වෙළඳ කුලුණ,
අංක 28, ශාන්ත මයිකල් පාර, කොළඹ.

# කොමිෂන් සභාව

කොමිෂන් සභාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ එකඟතාවය මත අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන සාමාජිකයන් පස් දෙනෙකුගෙන් සමන්විත වේ. සාමාජිකයෝ කුසලතාවයන්ගෙන් හා අවංකභාවයෙන් යුත්, ඉංජිනේරු, නීති, ආර්ථික විද්‍යා, ව්‍යාපාර කළමණාකරන, ගණකාධිකරන හෝ පරිපාලන ක්ෂේත්‍රයනට අදාළ ගැටළු නිරාකරණය කිරීමේ හැකියාවන් ප්‍රකට කර ඇති අයවළුන් විය යුතුය. බලශක්ති ව්‍යවස්ථා හා නීති තුළ පනවා ඇති පරිදි, කොමිෂන් සභාවේ තීරණ ගැනීමේ වගකීම් තුළට ක්‍රමෝපාය විධානයන් පැනවීම, ප්‍රධාන ප්‍රතිපත්ති ඉදිරිපත් කිරීම හා කාර්ය මණ්ඩලයට මග පෙන්වීම අයත් වේ.

**සාලිය මැතිව් මහතා** මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ සභාපතිවරයා වේ. 1975 වර්ෂයේදී නීතිඥවරයෙකු වශයෙන් දිවුරුම් දුන් ඔහු දිසා අධිකරණයේ, අභියාචනාධිකරණයේ හා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීති වෘත්තියෙහි නිරතව ඇත. එතුමා දශකයකට වැඩි කාල පරිච්ඡේදයක් පුරා සබරගමුව පළාතේ ආණ්ඩුකාරවරයා වශයෙන්ද, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ විධායක අධ්‍යක්ෂවරයා වශයෙන්ද, සේවක භාරකාර අරමුදල් මණ්ඩලයේ සභාපතිවරයා වශයෙන්ද, වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේද සම සභාපතිවරයා වශයෙන්ද සේවය කර ඇත. මැතිව් මහතා 2001 හා 2004 මහ මැතිවරණවලදී දේශපාලන ප්‍රචණ්ඩත්වයෙන් බලපෑමට ලක්වූ පුද්ගලයන් හට වන්දි ලබාදීම පිළිබඳ ජනාධිපති කොමිෂන් සභාවේ, 2005 ජනාධිපතිවරණයේදී දේශපාලන ප්‍රචණ්ඩත්වයෙන් බලපෑමට ලක්වූ පුද්ගලයන් වෙත කරුණා සහගත දීමනාවක් ගෙවීම සම්බන්ධ ජනාධිපති කොමිෂන් සභාවේද සේවය කර ඇත. සාලිය මැතිව් මහතා පළාත් පාලන ආයතනයන්හි කොට්ඨාශ සංශෝධනය කිරීම සඳහා පත්කරන ලද සීමා නිර්ණය කමිටුවේ සාමාජිකයෙකු වශයෙන්ද සේවය කරයි.

**සංජය ගමගේ මහතා** ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ නියෝජ්‍ය සභාපතිවරයා වේ. වෘත්තියෙන් නීතිඥවරයෙකු වන එතුමා, වසර 25කට වැඩි කාලයක් අපරාධ නඩු සම්බන්ධ නීතිඥවරයෙකු වශයෙන් කටයුතු කර ඇති අතර කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයන්හි නිළ නොලත් මහේස්ත්‍රාත්වරයෙකුද වේ. ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ හිටපු ලේකම්වරයාද වන එතුමා එම සංගමයේ නිළ බලයෙන් පත්වන කමිටුවේ සාමාජිකයෙකුද වේ. ගමගේ මහතා මහේස්ත්‍රාත් අධිකරණ නීතිඥවරුන්ගේ සංගමයේ ලේකම් හා සභාපතිවරයා වශයෙන්ද සේවය කොට ඇත. ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකුද වන එතුමා. නීති ක්ෂේත්‍රයේ ප්‍රවීණයෙකු වශයෙන් කොමිෂන් සභාවට සිය සේවය සම්පාදනය කරනු ලබන අතර එතුමා නීතිඥ-පොලිස් සම්බන්ධතා කමිටුවේ සභාපතිවරයාද වේ.

**මහාචාර්ය රාහුල අතලගේ මහතා** මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ සාමාජිකයෙකි. මොරටුව විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂවරයෙකු මෙන්ම එම විශ්වවිද්‍යාලයේ නියෝජ්‍ය උප කුලපතිවරයාද වේ. කාර්මික ඉංජිනේරු විෂයය සම්බන්ධ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු වශයෙන් ද තායිලන්තයේ ආසියානු තාක්ෂණ ආයතනයේ බලශක්ති වැඩසටහනේ ආරාධිත පීඨ සාමාජිකයෙකු වශයෙන්ද ජපානයේ ටොයොහෂි තාක්ෂණ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනය සඳහා වූ ජාත්‍යන්තර සහයෝගිතා මධ්‍යස්ථාන දෙපාර්තමේන්තුවේ ආරාධිත මහාචාර්යවරයෙකු වශයෙන්ද කටයුතු කර ඇති අතර. එතුමා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ අධ්‍යක්ෂවරයෙකු වශයෙන්ද සේවය කර ඇත. මොරටුව විශ්වවිද්‍යාලයේ කාර්මික ඉංජිනේරු (ගෞරව) උපාධිධරයෙකු වන මහාචාර්ය අතලගේ මහතා සිය ඉංජිනේරු පශ්චාත් උපාධිය තායිලන්තයේ ආසියානු තාක්ෂණ ආයතනයෙන්ද ආචාර්ය උපාධිය ප්‍රංශයේ ඉකොල්ස් ඩි මයිනස් ඩි පැරිස් (Ecoles des Mines de Paris) වෙතින්ද ලබාගන්නා ලදී. පසුව සඳහන් කරන ලද විශ්වවිද්‍යාලයෙන් ගැඹුරු අධ්‍යයනයන් සම්බන්ධයෙන් ලබාගත් උපාධියක්ද එතුමා සතුවේ. මහාචාර්ය අතලගේ මහතා ඉංජිනේරු ක්ෂේත්‍රය තුළ සේවය කරමින් සිය උපදෙස් ලබාදීම සිදු කරයි.

**ප්‍රසාද් ගල්හේන මහතා** මහජන උපයෝගිතා කොමිෂන්සභාවේ සාමාජිකයෙකි. ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ සහ ලංකා ධීවර සංස්ථාවේ සභාපතිවරයා වශයෙන්ද කටයුතු කර ඇත. කොළඹ විශ්වවිද්‍යාලයේ උපාධිධරයෙකු වන එතුමා, එම විශ්වවිද්‍යාලයෙන් හා එක්සත් රාජධානියේ සී.අයි.එම්. ආයතනයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධියක්ද ලබාගෙන ඇත. එතුමා වරලත් කළමණාකරන ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ සාමාජිකයෙකි. ගල්හේන මහතා ව්‍යාපාර කළමණාකරන හා මූල්‍ය ක්ෂේත්‍රයේ ප්‍රවීණ සාමාජිකයෙකු වශයෙන් කොමිෂන් සභාව වෙත සිය සේවය සපයනු ලබයි.

## කොමිෂන් සභා රැස්වීම්

| | |
|---|---|
| 2017 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් | රැස්වීම් 12 |
| සියළු සාමාජිකයන් සහභාගී වූ | රැස්වීම් 12 |



**ප්‍රසාද් ගල්හේන**
සාමාජික

**මහාචාර්ය රාහුල අතලගේ**
සාමාජික

**සංජය ගමගේ**
නියෝජ්‍ය සභාපති

**සාලිය මැතිව් මහතා**
සභාපති

# අපගේ මෙහෙවර

වඩාත් සාධාරණ හා තිරසර අයුරින් වර්තමාන හා අනාගත පාරිභෝගිකයන් සඳහා ආරක්ෂිත, විශ්වසනීය සහ සාධාරණ මිලෙන් යුත් යටිතල පහසුකම් සේවා සපයන බවට වගබලා ගැනීම පිණිස ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා විෂය පථය තුළ පවත්නා සියළු උපයෝගිතාවයන් නියාමනය.

# අපගේ දැක්ම

රටේ තිරසර සංවර්ධන න්‍යාය පත්‍ර සීමා මායිම් තුළ, වඩාත් පිරිමැසුම්දායක අයුරින් අත්‍යවශ්‍ය යටිතල පහසුකම් හා උපයෝගිතා සේවා සඳහා සමස්ත ශ්‍රී ලංකා වාසීන්ට සහ එහි සංවර්ධනයට, දායක වන්නන්ට ප්‍රවේශයන් සකසන්නා වූ පරිසරයක් නිර්මාණය කිරීම.

# ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ කාර්යයන්

**2002 අංක 35 දරන මහජන උපයෝගිතා කොමිෂන් සභා පනත තුළ පනවා ඇති මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ කාර්යයන් පහත පරිදි වේ:**

(අ) ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනත හෝ වෙනයම් කාර්මාන්ත පනතක් යටතේ කොමිෂන් සභාව වෙත පවරා දී හෝ ලබාදී ඇති බලතල, කාර්යයන් හා කර්තව්‍යයන් අභ්‍යාස කිරීම, ක්‍රියාවෙහි යෙදවීම හා ඉටු කිරීම,

(ආ) කොමිෂන් සභාව විසින් සුදුසු යැයි සලකනතාක් දුරට, කොමිෂන් සභාවේ තීරණ තුළින් බලපෑමට ලක්විය හැකි ඕනෑම පුද්ගලයෙකුගේ හෝ පුද්ගල කණ්ඩායමකගේ අදහස් විමසීම,

(ඇ) කොමිෂන් සභාවට සුදුසු යැයි හැගෙන පරිදි ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනතේ විෂය පථය තුළට ගැනෙන ඕනෑම කර්මාන්තයක් සම්බන්ධ සියළු කටයුතු පිළිබඳව රජයට උපදෙස් ලබාදීම,

(ඈ) ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනතේ 15 (4) වගන්තිය යටතේ යම් මහජන උපයෝගිතා කර්මාන්තයක් සම්බන්ධ තොරතුරු රැස් කිරීම, වාර්තා කිරීම හා ප්‍රචාරණය කිරීම,

(ඉ) කොමිෂන් සභාව ස්ථාපනය කිරීමෙන් මාස හයක් ඇතුළත කොමිෂන් සභාවේ කාර්යයන් පාලනය කෙරෙන යහ පරිචයන් හා රීති මාලාවක් ඇතුළත් නියාමන අත්පොතක් සකසා එය අවශ්‍ය පරිදි හා අවශ්‍ය විට ප්‍රතිශෝධනය කිරීම,

(ඊ) ඕනෑම කර්මාන්ත පනතක් තුළ ප්‍රතිපාදන සලසා ඇති සියළු කරුණු සම්බන්ධ බලපත් ලබාදීමේ, නියාමනය කිරීමේ හා සුපරීක්ෂණය කිරීමේ කාර්යයන් ඉටු කිරීම

(උ) ඕනෑම කර්මාන්ත පනතක් මගින් අවශ්‍ය කෙරෙන අවස්ථාවන්හි නියාමනය වූ ආයතනයන් විසින් අය කරනු ලබන තීරු බදු හා වෙනත් ගාස්තු නියාමනය කිරීම,

(ඵ) ඕනෑම මහජන උපයෝගිතා කර්මාන්තයක් තුළ ඉස්මතුවන ගැටුම් පිළිබඳ මැදිහත්කරණය මගින් තීරණ ගැනීම,

(ඒ) මහජන උපයෝගිතා කර්මාන්තයන්හි ආරක්ෂාකාරී බව, ගුණාත්මක බව, අඛණ්ඩතාව සහ විශ්වසනීයත්වය හා සම්බන්ධ තාක්ෂණික හා වෙනත් ප්‍රමිතීන් පනවා බලාත්මක කිරීම,

(ඔ) සිය කාර්යයන් අතරින් ඕනෑම කාර්යයක් ඵලදායී ලෙස ඉටුකිරීම පිණිස කොමිෂන් සභාව විසින් සුදුසු යැයි සැලකිය හැකි වෙනත් ආනුෂාංගික හෝ අනුපූරක කාර්යයන් ආරම්භ කිරීම,

# දීර්ඝ කාලීන අභිමතාර්ථ

### විදුලිබලයේ ගුණාත්මකභාවය

**අභිමතාර්ථය 1** පාරිභෝගිකයන් වෙත කෙරෙන විදුලිබල සැපයුම වෝල්ටීයතාවය 230 V ± 6% හා සංඛ්‍යාතය හා ප්‍රසංවාදය 50 Hz ± 0.5% මට්ටමෙහි වූ ව්‍යවස්ථාපිත ගුණාත්මක මට්ටම හා අනුගත වීම.

### සැපයුමේ ගුණාත්මකභාවය

**අභිමතාර්ථය 2** වාර්ෂිකව එක් පාරිභෝගිකයෙකු සම්බන්ධ පද්ධති සාමාන්‍ය ඇණ හිටීම් කාල පරිච්ඡේද දර්ශක අගය 24ට අඩු කරවීම.

**අභිමතාර්ථය 3** වසරක් තුළ පාරිභෝගිකයෙකු විසින් අත්විඳින්නාවූ මුළු විදුලිය ඇණ හිටීම් සංඛ්‍යාව 30ට අඩු කරවීම. (සාමාන්‍ය පදනමින්)

**අභිමතාර්ථය 4** පාරිභෝගික සේවා මාර්ග දෝෂ යථා තත්ත්වයට පත් කිරීමේ සාමාන්‍ය කාලය පාරිභෝගිකයෙකු සඳහා පැය 2ට අඩු කරවීම.

### සේවයේ ගුණාත්මකභාවය

**අභිමතාර්ථය 5** පාරිභෝගිකයන් වෙත අවශ්‍ය වන අවස්ථාවන්හි පාරිභෝගික අයිතිවාසිකම් හා වගකීම් පිළිබඳ තොරතුරු කල්තබා පාරිභෝගිකයන් වෙත ලබාදීමට පියවර ගැනීම.

**අභිමතාර්ථය 6** පාරිභෝගික විමසුම්/ඉල්ලීම්/පැමිණිලි සඳහා සේවා සම්පාදනයට විදුලි සේවා සම්පාදකයෙකු විසින් ගනු ලබන සාමාන්‍ය කාලය දින 30 ක් දක්වා අඩු කරවීම.

**අභිමතාර්ථය 7** ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් පාරිභෝගිකයන් වෙත සේවා සම්පාදනය සඳහා ගනු ලබන සාමාන්‍ය උපරිම කාලය දින 30කට අඩු කරවීම.

### විදුලි ගාස්තු හා සේවා ගාස්තු

**අභිමතාර්ථය 8** 2013 වර්ෂයේ විදුලිබල සැපයුම තුළ දැරූ සමස්ත පිරිවැය 10%කින් අඩු කිරීම. (සමස්ත පිරිවැය පවත්නා තත්ත්වයන් තුළ බල උත්පාදක මිශ්‍රණයන් හා ඉන්ධන ගාස්තු සඳහා වූ ගැලපීම්වලට යටත් වේ).

**අභිමතාර්ථය 9** 2013 වර්ෂයේ සේවා සඳහා සේවා සම්පාදකයා විසින් අයකළ ගාස්තු පවත්නා තත්ත්වයන් තුළ 10%කින් අඩු කිරීම.

### විදුලි ආරක්ෂාව

**අභිමතාර්ථය 10** බරපතල විදුලි අනතුරු සංඛ්‍යාව වසරකට 20ට අඩු අගයක් බවට පත් කිරීම.

### විදුලිබල ඉල්ලුම

**අභිමතාර්ථය 11** රටතුළ පවත්නා විදුලිබල ඉල්ලුම නිරතුරු සංතෘප්ත කෙරෙන බවට වගබලාගනු පිණිස 2020 වනවිට නොකඩවා අවම සියයට 10ක සංචිත ආන්තිකයක් පවත්වා ගැනීම.

### සංරක්ෂණය හා කාර්යක්ෂම භාවිතය

**අභිමතාර්ථය 12** උපයෝගිතා පාදක බලශක්ති කාර්යක්ෂමතා හා සංරක්ෂණ වැඩසටහන් මගින් වසර 2020 වනවිට අවම වශයෙන් බලශක්ති ගිගාවොට් පැය 250ක් හා ධාරිතාවය මෙගාවොට් 30ක් ආරක්ෂා කර ගැනීම.

# විශේෂ අවස්ථා

## 2011 - 2015 ශ්‍රී ලංකා ආර්ථිකයට ඉතුරුකිරීම්

## රු. බිලියන 156

## අනවශ්‍ය හදිසි විදුලි මිලදී ගැනීම් ප්‍රතික්ෂේප කිරීමෙන් අතිරේක වැය බර ඉතිරිකිරීම

## 2016 - රු. බිලියන 10

## ලංකා විදුලි බල මණ්ඩලයේ වාර්ෂික ජනන වියදම වන රු. බිලියන 200ක් සඳහා විදුලිය මිලදී ගැනීම් පිළිබද විගණනයක් හඳුන්වාදීම

## 2009 - 2016 විදුලි පාරිභෝගික පැමිණිලි 10,000 ක් විසදීමට පියවර ගැනීම

### විදුලි බල කර්මාන්තය නියාමනය

**2009 – 2017**

රෙගුලාසි 11 ක් හඳුන්වාදීම

රීති 6 ක් ක්‍රියාවට නැගීම

කේත 6 ක් බලාත්මක කිරීම

ක්‍රමවේද 6 ක් ක්‍රියාවට නැගීම

මාර්ගෝපදේශ 16 ක් හඳුන්වාදීම

ප්‍රමිති 2 ක් බලාත්මක කිරීම

### විදුලි සැර වැදීම් මරණ අඩුකිරීම

2002 දී විදුලි සැර වැදීම් මරණ

**180**

↓

**2016**

**98**

# 2016 විශේෂ අවස්ථා

**ප්‍රතිපත්ති නිර්දේශ**

විදුලි පේනු හා කෙවෙනි සඳහා වූ ජාතික ප්‍රමිතිය

**විශේෂිත රෙගුලාසි**

විදුලිය බෙදාහැරීම් ආයතනවල කාර්ය සාධනය පිළිබඳ රෙගුලාසිය

විදුලිය සම්ප්‍රේෂණය පිළිබඳ කාර්යසාධනය

විදුලි ආරක්ෂාව පිළිබඳ කාර්යසාධනය

විදුලිය සංරක්ෂණය පිළිබඳ රෙගුලාසිය

**මාර්ගෝපදේශ**

විදුලි මනු ආශ්‍රිත උපකරණ වල නිරවද්‍යතාවය පරීක්ෂාකිරීමේ පටිපාටිය පිළිබඳ මාර්ගෝපදේශය

නියාමන රෙගුලාසි පිළිබඳ මාර්ගෝපදේශ

**රීති**

විදුලි සම්බන්ධතා සඳහා පිරිවැය එකවර ගෙවීමට නොහැකි පාර්භෝගිකයින් හඳුනාගැනීම සඳහා වූ නිර්දේශ

විදුලිය මිලදී ගැනීම් පිළිබඳ පටිපාටිය

විදුලි අයකුම සමාලෝචනය පිළිබඳ රීති

**විදුලි පාරිභෝගික පැමිණිලි**

පැමිණිලි 1140ක් විසඳීමට පියවර

**විදුලි අයකුම**

2016 ඔක්තෝබර් සිට 2017 මාර්තු

රුපියල් බිලියන 156ක වැය බර ඉවත් කිරීමට පියවර

විද්‍යුත් වාහන ආරෝපන මධ්‍යස්ථාන නියාමනයට පියවර

**ආරක්ෂණ හා කළමනාකරණ සැළැස්ම**

විදුලිය ජනනය, සම්ප්‍රේෂණය, බෙදාහැරීමට අදාලව ආරක්ෂිත පද්ධතියක් පවත්වාගෙන යාම සඳහා වූ පද්ධතිය

**මහජන උපදේශන සහ පාර්ශ්වකාර සහභාගිත්වය**

විදුලි පාරිභෝගික අයිතිවාසිකම් පිළිබඳ 2016 සමුළුව

# 2017 විශේෂ අවස්ථා

**මාර්ගෝපදේශ**

විදුලි බිල්පත්ගෙවීම පිළිබඳ මාර්ගෝපදේශය

විදුලි සැපයුම විසන්ධිකිරීම සහ නැවත සන්ධිකිරීම පිළිබඳ මාර්ගෝපදේශ

ඇප තැන්පතු සඳහා පොලි ගෙවීම පිළිබඳ මාර්ගෝපදේශය

විදුලි කණු ඉවත්කිරීම හා වෙනත් ස්ථාන වල පිහිටුවීම පිළිබඳ මාර්ගෝපදේශය

විදුලි සැපයුම අත්හිටුවීම පිළිබඳ මාර්ගෝපදේශය

විදුලි පාරිභෝගික ගිණුම් නාමය වෙනස් කිරීම හා පාරිභෝගික කාණ්ඩය වෙනස් කිරීම

**විදුලි පාරිභෝගික**

විදුලි පාරිභෝගික පැමිණිලි 1425ක් විසදීමට පියවර

**මහජන උපදේශන**

විදුලි පාරිභෝගික සමුළුව-2017

විදුලිබල සුරක්ෂිතතාව පිළිබඳ සමුළුව

විද්‍යුත් වාහන ආරෝපණ මධ්‍යස්ථාන නියාමනය පිළිබඳ මහජන උපදේශනය

සූර්යබල පද්ධති ප්‍රවර්ධනය පිළිබඳ මහජන උපදේශනය

**විදුලි පේනු හා කෙවෙනි සඳහා ජාතික ප්‍රතිපත්තියක් ක්‍රියාවට නැගීම**

විදුලි පේනු සහ කෙවෙනි සඳහා ජාතික ප්‍රමිතියක් ක්‍රියාවට නැගීම මගින් විදුලි භාවිතයේ ආරක්ෂාව පිළිබඳ වැඩිදුර පියවර ගන්නා ලදී

**විදුලි කාර්මිකයින් සඳහා වෘත්තීය බලපත්‍ර ක්‍රමයක් හඳුන්වාදීමට පියවර ගැනීම**

විදුලි කාර්මිකයින්ගේ වෘත්තීය හැකියාව අගයමින් ඔවුන් හඳුනාගැනීම සඳහා වෘත්තීය බලපත්‍ර ක්‍රමයක් හඳුන්වාදීමට පියවර ගන්නා ලදී.



# සභාපතිතුමාගේ පණිවිඩය

ලෝක බලශක්ති වෙළඳපල නිරන්තර වෙනස්වීම්වලට භාජනය වන අතර බලශක්ති නියාමකවරුන්ගේ කාර්ය සිදුවනුයේ වැදගත් තාක්ෂණික, චර්යාත්මක හා පද්ධතිමය විපර්යාසයන් සිදුවන සන්දර්භයකය.

ශ්‍රී ලංකාවේ විදුලිබල කර්මාන්තයේ නියාමන ආයතනය වශයෙන් විදුලිබල පරිභරණය කළමනාකරණය කරගනිමින් සිය විදුලි බිල්පත් අගයන් අවම කරගැනීමේ මෙවලම් පිළිබඳ තියුණු විපරමක පාරිභෝගිකයා නිරතවන තත්ත්වයක ඉහළ ගුණාත්මක භාවයෙන් යුත් විදුලි සැපයුමක් සඳහා වන ඉල්ලුම දිනෙන් දින ඉහළ යන බව අප විසින් අත්දැක ඇත. 2017 වර්ෂය තුළ, ස්වයං විදුලි උත්පාදක සූර්ය ශක්ති පද්ධතීන් නිවෙස්හි වහළ මත සවි කරගනිමින් පාරිභෝගිකයෝද මෙම වෙළඳපල ක්‍රමය තුළට සිය සහභාගිත්වය ලබාදුන්හ. තාක්ෂණය වඩාත් පිරිමැසුම්කාරී වුවහොත් මෙම ප්‍රවණතාවය තවදුරටත් ඉහළ යනු ඇත.

විදුලිබල කර්මාන්තය විෂයයෙහි ආරක්ෂාකාරී, පිරිමැසුම්දායක හා තාක්ෂණික නියාමනයන් සම්පාදනය සඳහා අප විසින් අපගේ මූලිකාංග ගොඩනගමින් පවත්නා අතර මෙම සංක්‍රමණයන් මධ්‍යයේ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව වන අප අපගේ කාර්යය ඉටු කරමින් සිටින්නෙමු.

වර්තමානයේ හා අනාගතයේදී ද පාරිභෝගිකයන් හා උපයෝගිතාවයන් මත ඇති කෙරෙන බලපෑම් සලකා බලමින්, දිගු කාලීන දෘෂ්ටි කෝණයකින් නියාමන කටයුතු සිදු කරමින්, ප්‍රතිපත්ති විවාද සම්බන්ධයෙන් අපි අපගේ විශේෂඥතාවය හා ඥානය මගින් අවශ්‍ය දායකත්වය නොකඩවා ලබා දෙන්නෙමු.

බලශක්තිය ලබාගැනීමේ හැකියාව පාරිභෝගිකයන් විෂයයෙහි සැලකිය යුතු ප්‍රධාන ගැටළුවක් වන අතර මූල්‍ය ස්ථාවරත්වය උපයෝගිතාවයට අදාළ වඩාත් වැදගත් කරුණ වන තත්ත්වයක ශ්‍රී ලංකාවේ විදුලිබල කර්මාන්තය වැදගත් අභියෝගයනට මුහුණ දෙමින් සිටී. මෙම පීඩනය වඩාත් තීව්‍ර කරමින්, වෙනස්වන පරපුරේ තාක්ෂණයන් හා වෙළඳපල ගතිකයන් අපගේ බලශක්ති සැපයුමේ අනාගත ආරක්ෂාව සම්බන්ධ ගැටළු වඩාත් උග්‍ර කොට ඇත.

2017 වර්ෂය තුළ, අප විසින් සේවයේ ගුණාත්මකභාවය නංවාලීම සඳහා මාර්ගෝපදේශ මාලාවක් හඳුන්වා දෙන ලද අතර, පාරිභෝගිකයන් ඔවුනගේ විදුලි හිමිකම් හා වගකීම් පිළිබඳ ශක්තිමත් කොට විදුලිබලයෙන් ආරක්ෂිත පරිසරයක ජීවත් වීම සඳහා අවශ්‍ය දැනුවත් කිරීමේ ව්‍යාපාරයක්ද අප විසින් ක්‍රියාත්මක කරන ලදී. ශ්‍රී ලංකාව එක් ප්‍රමිතියක් කරා රැගෙන යමින් "පේනු හා කෙවෙනි පිටවානයන් සඳහා වූ ජාතික ප්‍රමිතිය" නිරීක්ෂණය කරමින් ක්‍රියාත්මක කිරීම නොකඩවා සිදු කළෙමු.

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකාව තිරසර හා බලශක්තියෙන් බලගැන්වුණු ජාතියක් බවට පත් කිරීම උදෙසා සියළු පරදුකරුවන් සමග ප්‍රතිපත්තිමය සංවාදයක් ඇති කිරීමේ අරමුණින් "2017 බලශක්ති සංසදය - ජාතිය බලගැන්වීම: බලශක්ති ආරක්ෂක රාමුව" පවත්වන ලදී.

සාලිය මැතිව්
සභාපති



# අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

තාක්ෂණික දියුණුව හා දේශගුණික විපර්යාසයන් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ අවශ්‍යතාවය මගින් පොළඹවනු ලබන කාර්මාන්තයේ වෙනස්වීම 2017 වර්ෂයේ ප්‍රධාන අභියෝගයක් විය. එම විපර්යාසයේ පුරෝකථනය කළ නොහැකි ස්වභාවය නොකඩවා වර්ධනය වෙමින් පවතී. එබැවින්, බුහුටි මනුකරණය හෙවත් ස්මාට් මීටරින්, අංකිත තාක්ෂණය, අඩු පිරිවැය වියලි කෝෂ ගබඩාකරණය, සහ විදුලි වාහන මගින් පාරිභෝගිකයන් වෙත වඩාත් ආකර්ශනීය හා විවිධ වූ සේවාවන් සහ බලශක්ති බිල්පත් අඩු කිරීමේ තවත් මාර්ගයන්ද සපයා දිය හැක.

අපගේ කාර්යයන් මගින් මෙම විපර්යාසයනට අදාළ පදනම සකසා ඇත.
2017 වර්ෂය තුළ, විපර්යාසයනට අනුගත වීමෙහි ලා රජය වෙත ප්‍රතිපත්තිමය උපදේශනයන් සකස් කිරීම සඳහා වූ සූර්ය තාප හා විදුලිබල වාහන ආරෝපණ ස්ථාන පිළිබඳ මහජන උපදේශන සේවා සැසි පවත්වන ලදී.

අවම පිරිවැය දීර්ඝ කාලීන බල උත්පාදන පුළුල්කරණ සැලැස්ම අප විසින් 2017 වර්ෂය තුළදී සිදුකරන ලද එක් වැදගත් කාර්යයකි.

ජනතාව දැනුමින් සන්නද්ධ කිරීමේ අරමුණින් විදුලි ආරක්ෂාව, විදුලියේ ගුණාත්මක භාවය සහ සේවය හා විදුලිබල සංරක්ෂණය පිළිබඳ අපගේ දැනුවත් කිරීමේ ව්‍යාපාරයද පුළුල් කරන්නෙමු.

අවසන, ප්‍රතිපත්ති විග්‍රහය සහ දිගන්ත පරිලෝකනයන් විෂයයෙහි අපගේ හැකියාවන් වර්ධනය කරගනිමින් වෙළඳපල සිදුවන ගතික විපර්යාසයන් සමග ඉදිරියට ගමන් කිරීම සඳහා කැප වන්නෙමු.

මෙම ප්‍රවීණත්වය සහ ඥානය තුළින් ප්‍රතිපත්ති විවාදයනට දායකත්වය ලබාදෙන අතර කාලීන, ඵලදායී ප්‍රතිසංස්කරණ ප්‍රවර්ධනය කරමින් ක්‍රියාත්මක කිරීම සඳහා සියළු පරදුකරුවන් සමග සහයෝගීව කටයුතු කරන්නෙමු.

දමිත කුමාරසිංහ
අධ්‍යක්ෂ ජනරාල්

# කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය
# අධ්‍යක්ෂවරු



# නියෝජ්‍ය අධ්‍යක්ෂවරු



රොෂාන් වීරසූරිය
නියෝජ්‍ය අධ්‍යක්ෂ - පාරිභෝගික කටයුතු

කේ.ජී. කීර්තිසේන
නියෝජ්‍ය අධ්‍යක්ෂ - අභ්‍යන්තර විගණක

ආර් පී තිලකරත්න
නියෝජ්‍ය අධ්‍යක්ෂ - විදුලි බල පරීක්ෂණ

එල්.ඩබ්. චන්ද්‍රසේකර
නියෝජ්‍ය අධ්‍යක්ෂ - විදුලි බල පරීක්ෂණ

ශාන්ත ජයසිංහ
නියෝජ්‍ය අධ්‍යක්ෂ - පාරිභෝගික කටයුතු

තුෂානි දර්ෂිකා හපුතන්ත්‍රී
නියෝජ්‍ය අධ්‍යක්ෂ - මුදල්

ආර්. යසන්ත රතුවිතාන
නියෝජ්‍ය අධ්‍යක්ෂ - පාරිභෝගික කටයුතු

# සහකාර අධ්‍යක්ෂවරු

විනෝෂා කීර්තිරත්න
සහකාර අධ්‍යක්ෂ - මානව සම්පත්

හසන්ක කඹුරුගමුව
සහකාර අධ්‍යක්ෂ - නියාමන කටයුතු

ඩබ්. ඒ. තනුජ් ධනුෂ්ක
සහකාර අධ්‍යක්ෂ - ආයතනික සන්නිවේදන

පුන්සරා නාගසිංහ
සහකාර අධ්‍යක්ෂ - බලපත්‍ර අංශය

සමීර අධිකාරම්
සහකාර අධ්‍යක්ෂ - විදුලි බල පරීක්ෂණ

සෂිනි අබේවර්ධන
සහකාර අධ්‍යක්ෂ - තොරතුරු කළමනාකරණ

අමිල කොස්තා
සහකාර අධ්‍යක්ෂ
තොරතුරු තාක්ෂණ

නාරද වික්‍රමගේ
සහකාර අධ්‍යක්ෂ - කළමනාකරණ
තොරතුරු තාක්ෂණ

චලිත් පසිඳු
සහකාර අධ්‍යක්ෂ
නියාමන කටයුතු



එරන්දි උඩගේආරච්චි
සහකාර අධ්‍යක්ෂ
අයකුම හා ආර්ථික කටයුතු

ලිලන්ත නීලවල
සහකාර අධ්‍යක්ෂ - විදුලි බල පරීක්ෂණ

අමිල සී. රාජපක්ෂ
සහකාර අධ්‍යක්ෂ - බලපත්‍ර අංශය

අනුෂිකා කඹුරුගමුව
සහකාර අධ්‍යක්ෂ - ආයතනික සන්නිවේදන

දිලීප කරුණාරත්න
සහකාර අධ්‍යක්ෂ - අයකුම හා ආර්ථික කටයුතු

ආරුමුගම් ජයසූරියන්
සහකාර අධ්‍යක්ෂ - ආයතනික සන්නිවේදන

ක්‍රිෂානන්ත් ශිවනසරාජා
සහකාර අධ්‍යක්ෂ - විදුලි බල පරීක්ෂණ

# කළමනාකරණ සහකාරවරු



# 2017 සංක්ෂිප්තය

විදුලි කර්මාන්තයේ ආර්ථික, තාක්ෂණික හා ආරක්ෂක නියාමකවරයා හා ලිහිසි ද්‍රව්‍ය වෙළඳපලෙහි ඡායා නියාමන ආයතනය වශයෙන් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් 2017 වර්ෂය තුළ පහත කටයුතු සම්පූර්ණ කර ඇත.

විදුලිබලය, ජල සේවා සහ ඛනිජ තෙල් කර්මාන්ත ආශ්‍රිතව කොමිෂන් සභාව විසින් 2017 වර්ෂය තුළ නව කාර්යයන් 87ක් ක්‍රියාත්මක කරන ලදී.

**සටහන 01 - කාර්ය සංඛ්‍යාව**

| අංශය | කාර්යයන් සංඛ්‍යාව |
|---|---|
| පාරිභෝගික කටයුතු | 10 |
| පරීක්ෂා කොට වාර්තා කිරීමේ | 11 |
| බලපත්‍ර ලබාදීමේ | 12 |
| නියාමන කටයුතු | 08 |
| විදුලි ගාස්තු හා ආර්ථික කටයුතු | 09 |
| පරිසර, පුනර්ජනනීය හා කාර්යක්ෂමතා | 05 |
| ආයතනික සන්නිවේදන | 08 |
| මූල්‍ය | 06 |
| මානව සම්පත් හා පාලන | 08 |
| තොරතුරු තාක්ෂණ හා කළමනාකරණ තොරතුරු පද්ධති | 08 |

ඉහත යොමුගත කාර්යයන්ගෙන් අපේක්ෂිත ප්‍රතිඵල පහත පරිදි වේ

- විදුලිබලයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම මගින් වඩා උසස් මට්ටමේ ඵලදායකත්වයක් හා පහසුවක් ලබාගැනීම
- විදුලිබලය හිගයකින් තොරව සපයාගත හැකි හා තරගකාරී තත්ත්වයකට ගෙන එනු පිණිස (උද්ධමනය හා ගලපමින්) විදුලි ගාස්තු අවම කිරීම
- පොදු ජනතාවගේ, බලපත්ලාභීන්ගේ හා මෙහෙයුම්කරුවන්ගේ ජීවිත හා දේපළවලට වඩා ඉහළ ආරක්ෂාවක් ලබාදීම
- මිනිසුන්, සතුන් හා ශාක සඳහා වන පාරිසරික/ සමාජ තත්ත්වයන් ඉහළ නැංවීම

**භෞතික හා මූල්‍ය ප්‍රගතිය**

2017 වර්ෂාවසානය වනවිට සමස්ත කාර්ය ප්‍රමාණයෙන් 95%කට ආසන්න ප්‍රමාණයක් සම්පූර්ණ කොට ඇති අතර වෙන්වූ අයවැයෙන් සියයට 85ක් වැයකොට ඇත.

**සටහන 2 - මූල්‍ය ප්‍රගතිය**

| | (ශ්‍රී ලං.රු.) |
|---|---|
| 2017 වර්ෂය සඳහා මුළු සමස්ත අයවැය | 249,784,240 |
| සමස්ත මුදල් වැය කිරීම | 212,427,993 |
| මුදල් වැය කිරීමේ ප්‍රගතිය (%) | 85% |

# ශ්‍රී ලංකාවේ විදුලිබල කර්මාන්තය

ශ්‍රී ලංකාවේ විදුලිබල අංශය එහි නියාමන ආයතනය වන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව හෙවත් රජයේ උපයෝගිතා සම්පාදක ආයතනයෙන්ද, විදුලිබලය උත්පාදනය, සම්ප්‍රේෂණය හා බෙදා හැරීම යන ක්ෂේත්‍රයන්හි ඒකාධිකාරී වෙළඳපල හිමිකාරිත්වයක් ඇති ලංකා විදුලිබල මණ්ඩලය යන ආයතනයන්ගෙන් සමන්විත වේ. ලංකා විදුලිබල මණ්ඩලය රටේ සම්ප්‍රේෂණ පද්ධතිගත සමාගම් දෙකෙන් එකක් වන අතර, අනෙක් සමාගම වනුයේ ලංකා විදුලි පුද්ගලික සමාගම හෙවත් ලෙකෝ ආයතනයයි.

විදුලිබලයෙන් සියයට 20ක් පමණ ස්වාධීන බලශක්ති නිෂ්පාදකයන් විසින් උත්පාදනය කරනු ලබයි.

ශ්‍රී ලංකා විදුලිබල පනත යටතේ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙත 2009 වර්ෂයේදී විදුලි අංශය නියාමනය කිරීමේ බලය පවරන ලදී. ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව ආර්ථික, තාක්ෂණික හා ආරක්ෂක නියාමන ආයතනය වශයෙන් කටයුතු කරන අතර කර්මාන්තය ආශ්‍රිත සියළු කරුණු සම්බන්ධයෙන් රජය වෙත උපදෙස් ලබාදෙමින් කර්මාන්තයට අදාළ බලපත් ලබාදීම, නිරීක්ෂණය හා ප්‍රමිතිකරණය, ගාස්තු නියාමනය, කාර්යක්ෂමතා ප්‍රවර්ධනය සහ තොරතුරු ප්‍රචාරණය සිදුකරනු ලබයි.

තාප බලය, සුළං බලය හා සූර්ය බලය යන බල ශක්තීන් භාවිතයෙන් කෙරෙන විදුලිබල උත්පාදන මූලාශ්‍ර විවිධාංගීකරණයක් ශ්‍රී ලංකාව සතුවේ.

2016 වර්ෂයේදී වාර්තාගත පැයට ගිගාවොට් 14,076 හා සාපේක්ෂව 2017 වර්ෂයේ සමස්ත විදුලිබල උත්පාදනය පැයට ගිගාවොට් 14,764 දක්වා 4.9%කින් වර්ධනය විය. 2017 වර්ෂයේ දෙසැම්බර් මාසය වනවිට පැවති සමස්ත සම්ප්‍රේෂණ පද්ධති අගයෙන් 25%කට ආසන්න ප්‍රමාණයක විදුලිබල උත්පාදනයක් ලබාදුන් හා 2017 වර්ෂය තුළ උත්පාදිත විදුලි බලය ප්‍රමාණයෙන් 37%ක විදුලිබල උත්පාදනයක් ලබාදුන් ජල විදුලිය වූකලි පැරණිතම විදුලි උත්පාදන මූලාශ්‍රයයි.

ලංකා විදුලිබල මණ්ඩලය විසින් සකස් කරන ලද අවම පිරිවැය දිගු කාලීන විදුලිබල උත්පාදන පුළුල්කරන සැලැස්ම (LCLTGEP) මගින් එළැඹෙන 20 වසර සඳහා ශ්‍රී ලංකාවට එක් කෙරෙන විදුලි බලාගාර සංඛ්‍යාව පිළිබඳව තීරණය කරනු ලබයි. එම විදුලිබල උත්පාදන සැලැස්ම ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් සංශෝධනය කොට අනුමත කරන ලදුව ලංකා විදුලිබල මණ්ඩලය විසින් ක්‍රියාත්මක කෙරේ. මෙම සැලැස්ම සෑම දෙමසකටම වරක් ප්‍රතිශෝධනය කෙරේ.

වඩා පුළුල් මහජන අදහස් විමසීමේ කාර්යාවලියක් මගින් සියළු පරදුකරුවන්ගේ අදහස් විමසීමෙන් පසුව හා අවම පිරිවැය මූලධර්ම සලකා බලමින්, 2017 වර්ෂයේදී ලංකා විදුලිබල මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද 2018-2037 අවම පිරිවැය දිගු කාලීන විදුලිබල උත්පාදන පුළුල්කරන සැලැස්ම ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

2016 වසරේ පටන් පැවති නියං තත්ත්වය නොකඩවා පැවතීම හේතුකොට 2017 වර්ෂය විදුලි අංශයට අභියෝගාත්මක වර්ෂයක් විය.

ඒ අනුව, 2016 වර්ෂය හා සන්සන්දනාත්මකව 2017 වර්ෂයේදී ජලවිදුලි උත්පාදනය පැයට ගිගාවොට් 3,057 දක්වා 12%ක පහත වැටීමක් වාර්තා කළ අතර ඉන්ධන තෙල් පදනම්ගත විදුලිබල උත්පාදනය පැයට ගිගාවොට් 5,082 දක්වා 18%ක වර්ධනයක් පෙන්නුම් කරන ලදී.

නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරයේ බිඳ වැටීම් පැවතියදීත් 2017 වර්ෂයේදී සමස්ත ගල් අඟුරු විදුලි උත්පාදනය පැයට ගිගාවොට් 5,121 දක්වා 1%කින් වර්ධනය විය.


කුඩා ජලවිදුලි බලාගාරද ඇතුළත්ව සම්ප්‍රදායික නොවූ පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍රයන්ගෙන් විදුලිබලය උත්පාදනය 2017 වර්ෂයේදී පැයට ගිගාවොට් 1,485 දක්වා 23%කින් ඉහළ නැගිණි.

2016 වර්ෂයේදී පෙන්නුම් කළ 78% අගය හා සාපේක්ෂව ලංකා විදුලිබල මණ්ඩලය සතු බලාගාරයන්ගේ සමස්ත දායකත්වය 2017 වර්ෂයේදී 73%කින් පහත වැටිණි. ප්‍රමිතිගත විදුලිබල මිලදී ගැනුම් ගිවිසුම යටතේ කුඩා විදුලිබල නිෂ්පාදකයන්ද ඇතුළත් ස්වාධීන විදුලිබල නිෂ්පාදකයන් වෙතින් ඉතිරි විදුලිබලය ප්‍රමාණය මිලදී ගන්නා ලදී.

අවම පිරිවැය දිගු කාලීන විදුලිබල උත්පාදන සැලැස්ම ක්‍රියාත්මක කිරීම රටතුළ වර්ධනය වෙමින් පවත්නා විදුලිබල ඉල්ලුම ආමන්ත්‍රණය කිරීමේ හා ශ්‍රී ලංකාවේ බලශක්ති ආරක්ෂාව සඳහා වූ ප්‍රධාන අවශ්‍යතාවය වේ.

2018-2037 කාල පරිච්ඡේදය සඳහා ශ්‍රී ලංකාව විසින් 5.0%ක බලශක්ති ඉල්ලුම් වර්ධනයක් හා 4.5%ක උච්ච ඉල්ලුම් වර්ධනයක් අපේක්ෂා කරනු ලබයි.

ප්‍රස්ථාරය 01 - විදුලි උත්පාදන සංයුතිය පැයට ගිගාවොට් අගයෙන් - 2017




**සමස්ත උත්පාදනය - ගි.වො.පැ. 14,764**

ෆොසිල ඉන්ධන මත රඳා පැවැත්ම අවම කරමින් බලශක්ති ආරක්ෂාව සහතික කරනු පිණිස පදනම් බලශක්ති ධාරිතාවය නංවාලීම වැදගත් වන බව 2017දී ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් අවධාරණය කරන ලදී. සුළු ජල විදුලි හා සූර්ය බල ඇතුළත් සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍ර ශ්‍රී ලංකාව සතු වුවද එම මූලාශ්‍ර කාලගුණික හේතු සාධක මගින් ජල විදුලි උත්පාදනය වෙත කෙරෙන බලපෑම මත රඳා පවතී.

2017 වර්ෂය තුළ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් අනුමත විදුලිබල උත්පාදක සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා විවිධාකාරවූ නියාමන ක්‍රියාමාර්ග ගන්නා ලද අතර, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා තිරසර බලශක්ති අධිකාරිය (SLSEA), ලංකා විදුලිබල මණ්ඩලය හා ලංකා විදුලි (පෞද්ගලික) සමාගම (LECO) සමග එක්ව ආරම්භ කරන ලද සූර්ය බල සංග්‍රාමය වෙත සහාය දක්වන ලදී.

මහජන අදහස් විමසීමේ ක්‍රියාවලිය තුළින් තීරණ ගැනීමේ කාර්යයෙහි ලා මහජන සහභාගිත්වය තවදුරටත් ශක්තිමත් කරන ලද අතර එහිලා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් 2017 වර්ෂය තුළ මහජන අදහස් විමසීම් සැසි තුනක් පවත්වන ලදී.


www.pucsl.gov.lk

# නියාමන කාර්යභාරය

**දළ විශ්ලේෂණය**

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ නියාමන කාර්යභාරය 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනත, 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත සහ 2013 අංක 31 දරන ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත තුළ විස්තර කර ඇත. ඒ අනුව, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් විදුලි බලයේ ගුණාත්මකභාවය, සැපයුමේ ගුණාත්මකභාවය, සේවයේ ගුණාත්මකභාවය සහ පාරිභෝගික හා බලපත්‍රලාභීන් යන දෙපාර්ශ්වයේම ආරක්ෂාව සහතික කිරීමේ රෙගුලාසි, නියමයන්, මාර්ගෝපදේශ ක්‍රමවේදයන් ගොඩනංවනු ලබයි.

## මාර්ගෝපදේශ - 07

### පාරිභෝගික ප්‍රතිලාභ සඳහා මාර්ගෝපදේශ

විදුලිය ආශ්‍රිතව ඔවුන් වෙත ඉදිරිපත් කෙරෙන දුක් ගැනවිලි නිරාකරණය විශේෂ කොටගෙන තීරණ ගැනීමේදී බෙදාහැරීමේ බලපත්‍රලාභීන් අතර සැලකිය යුතු විෂමතාවයන් පවත්නා බව කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කරන ලදී.

මෙම විෂමතාවයන් විසින් පාරිභෝගිකයන් අතෘප්තියට පත්කරන අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් මැදිහත්වී ගැටළු නිරාකරණය කරනු පිණිස අතෘප්තියට පත් පාරිභෝගිකයෝ සිය පැමිණිලි කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරති.

එවන් තත්ත්වයන් මැඩ පවත්වා පාරිභෝගිකයන් වෙත සේවා සම්පාදන විෂයයෙහි බෙදාහැරීමේ බලපත්‍රලාභීන්ගේ කාර්යක්ෂමතාවය නංවාලනු පිණිස කොමිෂන් සභාව විසින් 2017 වර්ෂය තුළ උපමාන හෙවත් මාර්ගෝපදේශ නවයක් (9) සකස් කරන ලදී. උපමාන අතරින් හතක් (7) වසර තුළ ක්‍රියාත්මක කරන ලද අතර ඉතිරි දෙක (2) මහජන අදහස් විමසීමෙන් අනතුරුව ක්‍රියාත්මක කෙරෙනු ඇත.

■ **මාර්ගෝපදේශය: විදුලි බිල්පත් ගෙවීම්**

විදුලි බිල්පත් ගෙවීම සම්බන්ධ පරදුකරුවන්ගේ ගැටළු මෙම උපමානය තුළින් ආමන්ත්‍රණය කෙරේ.

විදුලි බිල්පත් ගාස්තු පියවිය යුතු ආකාරය විදුලි බලය විසන්ධි කිරීමේ නිවේදන නිකුත් කිරීමේ හා විදුලි බලය විසන්ධි කිරීමේ නියෝග දිනයන් එමගින් නිශ්චය කරනු ලබයි.

එයට අමතරව, ගෙවීමේ ක්‍රමය, විදුලි බිල්පත් ගෙවීමට බලයලත් ආයතන, කරන ලද ගෙවීම තහවුරු කිරමේ ආකාරය, බිල්පත් ගෙවීමට අදාළ අගරු චෙක්පත් සම්බන්ධයෙන් ගතයුතු පියවර හා ගැටුම් නිරාකරණ ක්‍රමයද උපමානය තුළ ආමන්ත්‍රණය කෙරී ඇත.

■ **මාර්ගෝපදේශය: විදුලි සැපයුම විසන්ධි කිරීම හා ප්‍රති-සන්ධිකරණය**

උපමානය තුළ යම් පරිශ්‍රයක විදුලි බලය විසන්ධි කිරීමේ හා ප්‍රති-සන්ධි කිරීමේ පියවර විස්තර කෙරේ. එමගින් යම් බලපත්‍රලාභියෙකු හට විදුලිබල සැපයුම විසන්ධි කළ හැකි අවස්ථා පනවන අතර එතුළ පාරිභෝගිකයෙකුගේ ඉල්ලීම මත, ඇප හෙවත් සුරැකුම් තැන්පතු සම්පාදනයට අපොහොසත් වීම, බලපත්‍රලාභීන් වෙත ලැබිය යුතු විදුලි බිල්පත් හෝ වෙනයම් ගාස්තුවක් ගෙවීමට අපොහොසත් වීම, මාසික වාරිකය ගෙවීමට අපොහොසත් වීම, වෙනත් විදුලි සැපයුම් වෙත බාධාකාරී වන උපකරණ භාවිතය, භයානක හෝ අනාරක්ෂිත අයුරින් විදුලි බලය පරිහරණය, යම් හදිසි අවස්ථාවක්, යම් අපරාධයකට වැරදිකරු වූ විට හා යම් විවාදාත්මක චෝදනා පවත්නා විට යන අවස්ථා ඇතුළත් වේ.

තවද, එතුළ විදුලිය විසන්ධි කිරීමට අවසර දෙනු නොලබන වේලාවන් හා විදුලි සැපයුම් හා ප්‍රති-සන්ධිකරණ කොන්දේසිද අර්ථ නිරූපිතය.

■ **මාර්ගෝපදේශය: සුරැකුම් තැන්පතුව මත පොළිය ගෙවීම**

2009 අංක 20 දරන විදුලිබල පනතේ 28වන වගන්තිය ප්‍රකාර, බෙදාහැරීමේ බලපත්‍රලාභියෙකු විසින්, විදුලි සැපයුම් සම්බන්ධතාවයක් අවශ්‍ය වන්නාවූ යම් පුද්ගලයෙකු හට බලපත්‍රලාභියා වෙත ගෙවිය යුතුවිය හැකි සියළු මුදල් ගෙවීමට අදාළ සාධාරණ සුරැකුමක් ලබාදෙන ලෙස දැනුම් දීමට අවශ්‍ය විය හැක. සුරැකුම් තැන්පතුවක ස්වරූපයෙන් යම් බෙදාහැරීමේ බලපත්‍රලාභියෙකු වෙත යම් මුදලක් ලබාදුන් තැනෙකදී, අදාළ විධිවිධානය යටතේ කළ තැන්පතුව මත පොළියක් ලබාගැනීම සඳහා පාරිභෝගිකයන් වෙත පවරා දී ඇති නෛතික අයිතිවාසිකම් පිළිගනිමින් හා ලංකා විදුලිබල මණ්ඩලය හා ලංකා විදුලි පෞද්ගලික සමාගම විසින් 2014 මැයි මස 14වන දිනැතිව සිදුකරන ලද ඒකාබද්ධ යෝජනාව ප්‍රකාර, බලපත්‍රලාභියා අත සුරැකුම පවත්නා කාල පරිච්ඡේදය වෙනුවෙන් කොමිෂන් සභාව විසින්අනුමත අනුපාතයකට එම මුදල සඳහා බලපත්‍රලාභියා විසින් පොළියක් ගෙවිය යුතුය.

මාර්ගෝපදේශය තුළ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් අනුමත පොළී අනුපාතය, සිල්ලර විදුලි පාරිභෝගිකයා හා තොග විදුලි පාරිභෝගිකයා වෙත පොළිය ගෙවිය යුතු ක්‍රමය, බිල්පත්කරණ ක්‍රමය සහ ගැටුම් සම්බන්ධයෙන් කටයුතු කළයුතු ක්‍රමය පනවනු ලබයි.

■ **මාර්ගෝපදේශය: විදුලි කණු/රැහැන් ඉවත් කිරීම/විතැන් කිරීම**

2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 3 අයිතමයේ 1 උපලේඛනය ප්‍රකාර සහ 2013 අංක 31 දරන ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනතේ 17 වගන්තිය ප්‍රකාර, බලපත්‍රලාභීන් වන ලංකා විදුලිබල මණ්ඩලය හා ලංකා විදුලි පෞද්ගලික සමාගම විසින් යම් විදුලි රැහැනක් හෝ කණුවක් ස්ථාපනය හෝ ස්ථාපනය කොට තැබීම සඳහා ඕනෑම ඉඩම් හිමියෙකු වෙතින් පැවරුම් අනුමැතිය ලබාගත යුතුය.

ඉහත කරුණ විෂයයෙහි පාරිභෝගිකයන් හා බලපත්‍රලාභීන් අතර පවත්නා ගැටුම් සැලකිල්ලට ගනිමින්, යම් විදුලි කණුවක් හෝ රැහැනක් ඉවත් කිරීමේ හෝ විතැන් කිරීමේ අවස්ථාවකදී අනුගමනය කළයුතු පියවර, බලය ලබාදීම සහ අයකළ හැකි උපරිම ගාස්තු සඳහන් උපමාන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් හඳුන්වාදෙන ලදී.

■ **මාර්ගෝපදේශය: විදුලි සැපයුමට බාධා සිදුවීම**

පාරිභෝගිකයන්ගේ විදුලි සැපයුමට සිදුවන බාධාවන් වර්ග දෙකකට කාණ්ඩගත කළ හැක. එනම් සැලසුම්ගත බාධාවන් හා සැලසුම්ගත නොවූ බාධාවන් වශයෙනි. පහත සඳහන් අවශ්‍යතාවයන් සඳහා බෙදාහැරීමේ බලපත්‍රලාභියෙකු හට සැලසුම්ගත බාධා කිරීම් සිදුකිරීමට අවශ්‍ය වේ.

අ) බෙදාහැරීමට අදාළව සැලසුම්ගත නඩත්තු හා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට

ආ) අන්තර්-බලපත්‍රලාභී බෙදාහැරුම් පද්ධති ආශ්‍රිත සැලසුම්ගත වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට

ඇ) උඩු-ධාරාගත (සම්ප්‍රේෂණ) දෝෂ නඩත්තු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට

ප්‍රගතිය

සැලසුම්ගත නොවන බාධාවන් බෙදාහැරීමේ පද්ධතිය තුළ සිදුවන බිඳ වැටීම්, පාරිභෝගිකයන් විසින් ගාස්තු පැහැර හැරීම් හෝ විදුලි රැහැන් මත ගස්/අතු කපා දැමීම, අනවසරයෙන් විදුලිය ලබාගැනීම ඈ ලෙස පනත යටතේ වැරදි ලෙස සඳහන් කටයුතු සිදු කිරීම සහ සුනාමි, චණ්ඩ මාරුත, ගං වතුර හා වෙනත් ඒ හා සමාන තත්ත්වයන් තුළ මනුෂ්‍ය ජීවිතයට හා දේපළවලට සිදුවිය හැකි අනතුරු වළක්වාලනු පිණිස විදුලි සැපයුම නවතා දැමීම ආදී අවස්ථාවන්හි සිදු කෙරේ.

**බිඳ වැටීම්**

අ) බෙදාහැරීමේ පද්ධතියේ දෝෂ
ආ) අන්තර්-බලපත්ලාභී බෙදාහැරීමේ දෝෂ හේතුකොට සිදුවේ.

බලපෑමට ලක්වන පාරිභෝගිකයන් සංඛ්‍යාව හා බාධා සිදුවීමේ වාර ගණන අවම කළ හැකි පරිදි සිය සැලසුම් හා මෙහෙයුම් කටයුතු සකස් කිරීම මගින් බෙදාහැරීමේ බලපත්ලාභීන් හට විදුලිය බිඳවැටීම් හා සැලසුම්ගත බාධාකරණයන් පාලනය හා අවම කළ හැකි වේ. එවන් ක්‍රියාමාර්ග මගින් පාරිභෝගිකයන් වෙත සිදුවන අපහසුතාවයන් හා ආර්ථිකයට සිදුවන අලාභය අවම කරනු පමණක් නොව එමගින් බෙදාහැරීමේ බලපත්ලාභීන්ගේ ආදායමද වර්ධනය කෙරෙනු ඇත.

මාර්ගෝපදේශය තුළ ඉහත අවශ්‍යතාවයන් ආමන්ත්‍රණය කරමින් විදුලිය බිඳවැටීමකදී හා සැලසුම්ගත බාධාකරණයකදී අනුගමනය කළයුතු පියවරයන් විස්තර කෙරේ.

■ **මාර්ගෝපදේශයඃ විදුලි පාරිභෝගිකයා වෙනස් වීම**

විදුලි පාරිභෝගිකයෙකු හට සේවා සම්පාදකයෙකු විසින් පනවා ඇති අවශ්‍යතා සපුරාලීමෙන් අනතුරුව තමාගේ පරිශ්‍රය වෙත ලබාදී ඇති විදුලි සැපයුමට අදාළ විදුලි ගිවිසුම අවසන් කොට එම පරිශ්‍රය වෙතම වෙනත් පාරිභෝගිකයෙකු හට විදුලි සැපයුම ලබාගැනීමේ අවසරය ලබාදිය හැක.

අ) හිමිකාරිත්වය වෙනස් වීම
ආ) පදිංචිය වෙනස් වීම
ඇ) විදුලි පාරිභෝගිකයෙකු මියයාම
ඈ) විදුලි පාරිභෝගිකයෙකුගේ අවසරය මත විදුලි ගිවිසුම අවසන් කිරීම සිදුවිය හැක.

ඉහත සඳහන් සිදුවීම් ආශ්‍රිතව පාරිභෝගිකයා හා බලපත්ලාභියා යන දෙපාර්ශ්වය විසින්ම අනුගමනය කළ යුතුව පවත්නා පියවර සහ ගැටුමක් හටගන්නා ක්‍රියාවලිය මෙම මාර්ගෝපදේශය තුළ පනවනු ලබයි.

■ **මාර්ගෝපදේශයඃ ගාස්තු කාණ්ඩය තීරණය කිරීම**

2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත ප්‍රකාර, බෙදාහැරීමේ බලපත්ලාභියෙකු විසින් ප්‍රමිතිගත ගාස්තු 925(4) වගන්තිය) පදනම මත ඕනෑම පරිශ්‍රයකට විදුලි සැපයුම ලබාදිය යුතු අතර, එසේ විදුලි සැපයුමක් අවශ්‍ය වන්නාවූ ඕනෑම අයෙකු විසින් වෙනත් කරුණු අතර විදුලිය පරිහරණය කෙරෙන අවශ්‍යතාවය (25(5ආ) වගන්තිය) හා යම් අවස්ථාවකදී අවශ්‍ය විය හැකි උපරිම විදුලි ප්‍රමාණය (25(5ඈ) වගන්තිය) සඳහන් කරමින් බෙදාහැරීමේ බලපත්ලාභියා වෙතින් ඉල්ලීමක් කළ යුතුය.

පාරිභෝගික කාණ්ඩයන් කොමිෂන් සභාව විසින් අර්ථ නිරූපණය කොට ඇති වෝල්ටීයතා මට්ටම් මගින් වෙන්කොට දැක්විය යුතුය.

කෙසේ වුවද, අදාළ අවශ්‍යතාවය හා යම් දෙනලද අවස්ථාවකදී විදුලි පරිහරණය සඳහා අවශ්‍ය උපරිම විදුලිබල ප්‍රමාණයට අනුව ගාස්තු කාණ්ඩ වෙනස්වන බැවින්, ශ්‍රී ලංකාවේ දැනට පවත්නා විදුලි ගාස්තු සැලකිල්ලට ගනිමින්, ගාස්තු කාණ්ඩය තීරණය කිරීම ආශ්‍රිත මතභේද ඇතිවීමේ ප්‍රවණතාවයක් පවතී.

වත්මන් තීරු ගාස්තු සඳහා පාරිභෝගික කාණ්ඩය තීරණය කරනුයේ භාවිත වන අරමුණ සැලකිල්ලට ගනිමින්, (ගෘහස්ත, ආගමික, හෝටල් කර්මාන්ත, පොදු අවශ්‍යතා සහ රජය) සහ යම් දෙන ලද කාලයකදී අවශ්‍ය උපරිම විදුලි ප්‍රමාණය සැලකිල්ලට ගනිමිනි

- නාමික වෝල්ටීයතාවය 11,000 හෝ එයට ඉහළ අගයක් වන
- නාමික වෝල්ටීයතාවය 400/230 වන අතර කොන්ත්‍රාත් ඉල්ලුම කි.වෝ.ඇ. 42ට අඩු නොවන හෝ සමාන
- නාමික වෝල්ටීයතාවය 400/230 වන අතර කොන්ත්‍රාත් ඉල්ලුම කි.වෝ.ඇ. 42 ඉක්මවන,

ඉහත ගැටළු නිරාකරණය කරනු පිණිස විදුලි ගාස්තු වර්ගයන් අර්ථ නිරූපණය, ගාස්තු කාණ්ඩය තීරණය කරන ආකාරය හා ගැටුම් නිරාකරණ කාර්ය පරිපාටිය මාර්ගෝපදේශය විසින් පනවනු ලබයි.

**ලංකා විදුලිබල මණ්ඩලය හා ලංකා විදුලි පෞද්ගලික සමාගම විසින් නියාමන ගිණුම් සකස් කිරීම සඳහා අවශ්‍ය සහාය ලබාදීම**

නියාමන ගිණුම් සැකසීම පිළිබඳ මාර්ගෝපදේශ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් 2016 මැයි මාසයේදී සකසා නිකුත් කරන ලද අතර, 2016 ජූලි මාසයේදී ලංකා විදුලිබල මණ්ඩලයේ අදාළ කාර්ය මණ්ඩලය වෙත එකී උපමාන ක්‍රියාත්මක කිරීම පිළිබඳ පුහුණුව ලබාදෙන ලදී. 2017 වර්ෂය වෙනුවෙන් පළමු නියාමන ගිණුම් කට්ටලය සකස් කළ යුතුව පවත්නා අතර, ලංකා විදුලිබල මණ්ඩලය විසින් කරන ලද ඉල්ලීමකට අනුව, 2015 දත්ත උපයෝගී කරගනිමින් අත්හදා බැලීමේ පදනමින් මාර්ගෝපදේශ ක්‍රියාත්මක කරන ලදී. මෙම ක්‍රියාවලිය පුරාවටම ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් අවශ්‍ය සහාය ලබාදෙන ලදී. ලංකා විදුලිබල මණ්ඩලය විසින් ලබාදුන් අදහස් පදනම් කරගනිමින් මාර්ගෝපදේශ සංශෝධනයද සිදුකරන ලදී.

**විදුලි සන්ධිගත කිරීම හා විදුලි සැපයුම මෙන්ම විදුලි සැපයුම් සන්ධිගත ගිවිසුම් සඳහාද වූ අයැදුම්පත්හි නියමයන් හා කොන්දේසි තාර්කිකකරණය**

ඒ ඒ බෙදාහැරීමේ බලපත්ලාභියාගේ සැපයුම් සේවා ක්ෂේත්‍රය තුළට ඇතුළත් කෙරෙන පහත ලේඛන සැකසීම සඳහා කොමිෂන් සභාව විසින් උපදේශන සේවා ලබාදෙන ලදීඃ

- විදුලි සන්ධිගත කිරීමේ හා සැපයුම් ගිවිසුම් (විදුලි ගිවිසුම්);
- විදුලි බලය සන්ධිගත කිරීම හා සැපයුම සම්බන්ධ අයැදුම්පත්;
- විදුලිබලය සන්ධිගත කිරීම හා සැපයුම සඳහා වූ උපමාන.

**සැපයුම් ගාස්තු ක්‍රමවේදය හා ගාස්තුවලින් නිදහස් අය සම්බන්ධ උපලේඛනය සැකසීම**

සංශෝධිත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 10 වගන්තිය ප්‍රකාර, විදුලි බලය බෙදාහැරීම හා සැපයුම සඳහා බලපත්‍රයක් ලබාගැනීමේ අවශ්‍යතාවයෙන් නිදහස් පුද්ගලයන් වෙත කොමිෂන් සභාව විසින් නිදහස් කිරීමේ සහතිකයක් නිකුත් කෙරේ. 2016 අවසානය වනවිට, කොමිෂන් සභාව විසින් පාරිභෝගිකයන් 5,000ක පමණ එකතුවක් වෙත සේවා සැපයෙන පරිදි නිදහස් කිරීමේ සහික 28ක් නිකුත් කොට තිබූ අතර, අයැදුම්කරුවන් 10 දෙනෙක් නිදහස් කිරීමේ සහතික ලබාගැනීමේ ක්‍රියා පරිපාටියට අවතීර්ණව සිටියහ. කෙසේ වුවද, නිදහස් කිරීමේ සහතිකයක් හෝ විදුලිය ප්‍රති-අලෙවි කිරීමේ අනුමැතියකින් තොරව විදුලිය නිවැසියන් වෙත ප්‍රති-සැපයුම් කරන වෙනත් බොහෝ පිරිස්ද වේ.

නිදහස් කිරීමේ සහතිකයේ 19වන කොන්දේසිය ප්‍රකාර, නිදහස් කළ අයෙකු විසින් කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති ක්‍රමවේදයකට අනුව විදුලි ගාස්තු ක්‍රමය සකසා විදුලි පාරිභෝගිකයන්ගෙන් ගාස්තු අයකිරීමට පෙර කොමිෂන් සභාවේ අනුමතිය සඳහා එම උපලේඛනය ඉදිරිපත් කළ යුතුය. සැපයුම් ගාස්තු ක්‍රමවේදය හා ගාස්තුවලින් නිදහස් පුද්ගලයන් වෙත අදාළ ගාස්තු ක්‍රමය 2017 වර්ෂයේදී සකස් කරන ලද අතර, 2018 වර්ෂයේ එය නිකුත් කිරීමට පෙර, සීමිත අදහස් විමසුමක් සිදුකරනු ඇත.




# පාරිභෝගික සේවා

www.pucsl.gov.lk

# පාරිභෝගික සබඳතා

## දළ විශ්ලේෂණය

විදුලි පාරිභෝගිකයන්ගේ හිමිකම් හා වගකීම් තහවුරු කරමින් ඔවුන්ගේ ආරක්ෂාව සහතික කිරීම විදුලි කර්මාන්තයේ නියාමක ආයතනය වශයෙන් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙත පවරා දී ඇති ප්‍රධාන කාර්යයන් අතරින් එකකි. එහි කාර්ය භාරය තුළට විදුලිබල පාරිභෝගිකයන් විදුලිය සම්බන්ධ සිය හිමිකම් හා වගකීම් විෂයයෙහි බලගන්වමින් ඔවුන්ගේ ආරක්ෂාව සහතික කරන අතරම දුක්ගැනවිලි නිරාකරණයෙහි ලා අවශ්‍ය උපදේශනය හා සහාය ලබාදීම ඇතුළත්වේ. රජයේ නියමයන් හා රෙගුලාසිවලට අනුගතව කටයුතු කරන අතර බලපත්ලාභීන්ගේ හා පරදුකරුවන්ගේ අරමුණුද සංතෘප්ත කෙරෙන බවට ඒමගින් සහතික කෙරේ.


නඩු විභාගයකට හෝ අධිකරණ ශාලාවකට පරිබාහිරව ගැටුම් නිරාකරණයෙහිලා විකල්ප විධික්‍රමයක් සම්පාදනය ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව යන්නෙන් අරුත් ගැන්වෙයි. ඒ වූකලි ඇහුම්කන් දීම, ගනුදෙනු කිරීම, මැදිහත්කරණය හා පහසුකම් සම්පාදනය, සමථකරණය හා ප්‍රතිසන්ධානයද ඇතුළත් අන්තර්ගත පදයකි. සන්නිවේදනය, ගැටුමක් පසුපස පවත්නා ගැටළු අවබෝධය හා අන්‍යෝන්‍ය වශයෙන් පිළිගත හැකි විසඳුමක් කරා පිවිසීම පිණිස ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් සියළු පාර්ශ්වයන් ඒකාරාශි කරනු ලබයි.

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනතේ 28 වගන්තිය ප්‍රකාර, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් විදුලි පාරිභෝගිකයන්ගේ හිමිකම් සුරැකිය යුතුය. ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනත තුළ සහතික කොට ඇති හිමිකම් අතර පාරිභෝගිකයන් වෙත ඇහුම්කන් දෙමින් ඔවුන්ගේ අභිලාෂයන් නිසි සැලකිල්ලට ලක් කෙරෙන බවට සහතික වන අතර පාරිභෝගික අධ්‍යාපනයද ඇතුළත් වේ. ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් 2009 ශ්‍රී ලංකා විදුලිබල පනතේ 3 (1) (ඉ) වගන්තිය යටතේ විදුලි පාරිභෝගිකයන්ගේ හිමිකම් හා වගකීම් පෙළ ගස්වමින් 2015 වර්ෂයේදී ප්‍රකාශනයක් පළ කරන ලදී.

## පාරිභෝගික පැමිණිලි

විදුලි සේවා සම්පාදක (ලං.වි.ම./ලං.වි.පෞ.ස.) වෙතින් සාධාරණ හා යුක්ති සහගත ප්‍රතිචාරයක් ලබමින්, විදුලි බිල්පත්, විදුලි පරිභෝජනය ගණනය කරන ආකාරය, විදුලි ගාස්තු කාණ්ඩය, විදුලි මනුව, විදුලි රැහැන් පාරිභෝගිකයාගේ ඉඩම මතින් ගමන් කිරීම, විදුලිය අඩු වැඩි වීම හේතුවෙන් පාරිභෝගිකයාගේ විදුලි උපකරණවලට හානි සිදුවීම ආදී ගැටළු ඉදිරිපත් කිරීමේ හිමිකම විදුලි පාරිභෝගිකයන් සතු වේ. කෙසේ වුවද, ආරම්භක පියවර අසාර්ථක වූයේනම් හෝ පාරිභෝගිකයා හට සතුටුදායක ප්‍රතිචාරයක් ලැබීමට නොහැකි වී නම්, පාරිභෝගිකයා හට ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කළ හැක.

ප්‍රස්ථාරය 2 - 2017 වර්ෂය තුළ පහසුකම් සලසන ලද පාරිභෝගික පැමිණිලි




2017 වර්ෂය තුළ අවස්ථාව සලසන ලද පාරිභෝගික පැමිණිලි විස්තර පහත දක්වා ඇත. 2017 වර්ෂය තුළ පහසුකම් සලසන ලද සමස්ත පැමිණිලි සංඛ්‍යාව 1425ක් විය.

## ආරවුල් නිරාකරණය

ආරවුල් නිරාකරණ රීති පරිපාටිය වූකලි විදුලි සැපයුම සම්බන්ධයෙන් විදුලි පාරිභෝගිකයන්ගේ ගැටුම් නිරාකරණයෙහි ලා කොමිෂන් සභාව විසින් සම්මත කරගන්නා ලද කාර්ය පරිපාටිය විස්තර කරන්නාවූ ලිඛිත හා ගැසට් මගින් නිවේදනය කරන ලද නීති සමූහයකි.

බලපත් ලාභියෙකු සහ පාරිභෝගිකයෙකු හෝ වෙනත් බලපත් ලාභියෙකු අතර ආරවුල් ඉස්මතු වීමකදී ඔවුනට හෝ වෙනත් බලපෑමකට ලක්වූ පාර්ශ්වයකට හෝ එම කරුණ කොමිෂන් සභාව වෙත යොමු කොට, කොමිෂන් සභාව විසින් නිර්දේශ කොට ඇති විදුලිබල (ගැටුම් නිරාකරණ) නීති යටතේ එම ගැටුම නිරාකරණය කරගත හැක.

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් නොකඩවා විදුලි පාරිභෝගිකයන් හා බලපත්ලාභීන් විසින් මුහුණ පෑ ගැටුම් නිරාකරණය කරන ලද අතර, ඒ අනුව 2017 වර්ෂය සඳහා එවන් සිදුවීම් 11ක් හඳුනා ගන්නා ලදී. කෙසේ වුවද, නිරාකරණය කොට නිරාකරණ සහතික නිකුත් කරන ලද්දේ ගැටළු තුනක් සඳහා පමණක් වන අතර, ගැටුම් දෙකක් සඳහා නිරාකරණය නොවීමේ සහතික නිකුත් කරන ලදී. ගැටුමට අදාළ පාර්ශ්වයන් වෙතින් මැදිහත් වන ලෙස ඉල්ලීම් නොලැබීම හේතුවෙන් ගැටළු තුනක් වසා දමන ලදී.

## අනුගත නොවන හා ප්‍රතිචාර නොදක්වන ආරවුල් වලට බලපත්ලාභියා සමගින් මැදිහත් වීම

කොමිෂන් සභාව වෙත වාර්ෂිකව සාමාන්‍යයෙන් පැමිණිලි 1400ක් පමණ ලැබේ. පිළිගත හැකි විසඳුමක් ලබාදෙනු පිණිස, එම පැමිණිලි පිළිබඳව සේවා සම්පාදකයන් වෙතින් නිරීක්ෂණ ලබාගැනීම අවශ්‍ය වේ. පාරිභෝගික පැමිණිලි සම්බන්ධයෙන් සිය නිරීක්ෂණ ලබාදෙන ලෙස අප විසින් කරන ඉල්ලීම්වලට නිසි කලට පිළිතුරු ලබාදීමට සේවා සම්පාදකයන් අපොහොසත් වන්නේය යන්න කොමිෂන් සභාවේ අවබෝධයයි. මෙම ගැටළුව පසුපස විවිධ හේතු පැවතිය හැක. මෙම ගැටළුව නිරාකරණය කරනු පිණිස, කොමිෂන් සභාව සේවා සම්පාදක ආයතනයන්හි ප්‍රධාන නිලධාරීන්ද සමගින් සේවා සම්පාදකයන් විසින් මුහුණ දෙනු ලබන දුෂ්කරතා නිරාකරණය කරමින් එවන් පැමිණිලි නිරාකරණය කිරීමේ කාර්යයෙහි නිරත විය.

ඒ අනුව, 2016 වර්ෂයට අයත් ව නිරාකරණය නොවී පැවති පැමිණිලි 146න් 127ක් නිරාකරණය කිරීමට කොමිෂන් සභාවට හැකිවිය. තවද, 2017 වර්ෂයට අයත් පැමිණිලි 473න් 437ක් සඳහා කොමිෂන් සභාව විසින් පහසුකම් සලසන ලද අතර, ඉතිරි පැමිණිලි 36 මේවන විට නිරාකරණය කෙරෙමින් පවතී

## පාරිභෝගික උපදේශන කමිටුව:

2017 මාර්තු මාසයේදී උතුරු, ඌව, සබරගමුව, දකුණු, මධ්‍යම හා බස්නාහිර පළාත් නියෝජනය වන පරිදි නව සාමාජිකයන් හය දෙනෙකු පත්කරන ලදී. දකුණු පළාත් පාරිභෝගික ජාලය ස්ථාපනය කිරීමේ නියමු ව්‍යාපෘතිය අතරතුර සැලකිය යුතු දායකත්වයක් ලබාදුන් ප්‍රජා නායකයන්ද සිය පළාත නියෝජනය කරන සාමාජිකයන් වශයෙන් පාරිභෝගික උපදේශන කමිටුව හා එක්වීම සැලකිය යුතු සාර්ථකත්වයක් විය. වහල මත සවිකරන සූර්ය බලශක්ති පද්ධතිය පිළිබඳව 2017 දෙසැම්බර් මස 6වන දින පවත්වන ලද මහජන අදහස් විමසීමේ අවස්ථාවේදී ඉදිරිපත් කිරීමක්ද සමගින් බස්නාහිර පළාත නියෝජනය කළ සාමාජිකයා විසින් එයට සක්‍රීය දායකත්වයක් ලබාදෙන ලදී. පාරිභෝගික උපදේශන කමිටුව ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා කාර්යාලයේදී සෑම මසකම රැස්වී කොමිෂන් සභාවේ විෂය පථය යටතේ වන ඒ ඒ කර්මාන්තය යටතේ නිර්දේශ කළ හැකි හෝ තීරණය කළ හැකි නිසි ප්‍රමිතීන් පිළිබඳව කොමිෂන් සභාව වෙත උපදෙස් ලබාදීමේ අරමුණින් පාරිභෝගික ගැටළු සාකච්ඡා කරයි.

# විදුලි අයක්‍රම හා ආර්ථික කටයුතු

පෙර වර්ෂයේ වූ පැයට ගිගාවොට් 14,149 අගයට සාපේක්ෂව 2017 වර්ෂයේදී පැයට ගිගාවොට් 14,671 දක්වා සියයට 3.7කින් වාර්ෂික විදුලි උත්පාදනය ඉහළ ගොස් ඇත. 2016 අවසන් භාගයේ පැවති නියං තත්ත්වය 2017 මුල් මාස නවය තුළද නොකඩවා පැවති අතර එමගින් විදුලි උත්පාදනය තාප විදුලි බලාගාර මත රඳා පවත්නා තත්ත්වයක් ඇති කරන ලදී.

**2017**

**විදුලි උත්පාදනය**

**ගිගා වොට් පැය 14,671**

**↑ 3.7%**

විදුලි අලෙවිය 2017 වර්ෂය තුළ සියයට 5කින් වර්ධනය වූ අතර 2017 වර්ෂය වනවිට රටතුළ විදුලියකරණ මට්ටම සියයට 99.3ක මට්ටමේ පැවතිනි.

ජල විදුලිබල උත්පාදනයේ පහත වැටීම හේතුකොට ඉන්ධන පදනම්ගත විදුලි උත්පාදනය මත වඩ වඩාත් රඳා පැවැත්මට සිදුවීම හේතුවෙන් 2017 වර්ෂය තුළ ලං.වි.ම. විසින් මූල්‍ය අලාභයක් වාර්තා කරන ලදී.

ලං.වි.ම. විසින් ඉදිරිපත් කරන ලද දත්තවලට අනුව, ජල විදුලිබලයේ, ගල් අඟුරු හා තාප විදුලි බලයේ සාමාන්‍ය ඒකක පිරිවැය පිළිවෙලින් ශ්‍රී. ලං. රු./පැයට කි.වො. 6.04, 12.09 හා 27.61 අගයන්හි විය.

ස්වාධීන විදුලි නිෂ්පාදකයන් විසින් මිලදී ගත් විදුලියෙහි සාමාන්‍ය පිරිවැය ශ්‍රී. ලං. රු./පැයට කි.වො. 27.97ක අගයෙහි විය.

හදිසි විදුලි මිලදී ගැනීම්හි සාමාන්‍ය පිරිවැය ශ්‍රී. ලං. රු./පැයට කි.වො. 33.03ක් විය.

කෙසේ වුවද, විකුණුම් අවස්ථාවේදී ලං.වි.ම. හි සාමාන්‍ය විදුලිබල පිරිවැය කි.වො.පැයට රු. 23.06ක් වූ නමුදු සාමාන්‍ය විදුලි ගාස්තුව කි.වො.පැයට රු. 16.92 මට්ටමෙහි පවත්වා ගන්නා ලදී.

අනුමත විදුලි ගාස්තු ක්‍රමවේදයේ 2.4.2 උප-වගන්තිය ප්‍රකාර, සම්ප්‍රේෂණ බලපත්‍රලාභියා විසින් උත්පාදක හා බෙදාහැරීමේ බලපත්‍රලාභීන් හා වෙනත් සම්ප්‍රේෂණ පාරිභෝගිකයන් සමග සිදුකරන ගනුදෙනු පියවීම සඳහා තොග සැපයුම් ගනුදෙනු ගිණුමක් (BSTA) යොදාගත යුතුය. එනමුදු, මේවන විට, සම්ප්‍රේෂණය බලපත්‍රලාභී ලංකා විදුලිබල මණ්ඩලයේ ගිණුම් බලපත්‍රලාභීනට අනුව මෙතෙක් වෙන්කොට නොමැති බැවින් ලං.වි.ම. සිය ගනුදෙනු සැබෑ තොග සැපයුම් ගනුදෙනු ගිණුමක් මගින් පියවනු නොලබයි.

තොග සැපයුම් ගනුදෙනු ගිණුමක අතිරික්තය හෝ හිඟය මගින් විදුලිබල කර්මාන්තයේ ලාභය හෝ පාඩුව නිරූපණය කරන අතර එහි ප්‍රතිඵලයක් ලෙස රජය විසින් සහනාධාර ලබාදීමක් හෝ ආදායම්-පිරිවැය අසමතුලිතතාවයන් පාරිභෝගිකයන් වෙත යොමු කෙරෙන ගාස්තු ගැලපුමක් ඇති විය හැක.

2013 වර්ෂයේදී, විදුලි ගාස්තු ඉහළ නැංවීමක් සඳහා අවසර දෙනුපිණිස පාරදෘශ්‍යභාවය, කාර්යක්ෂමතාවය හා ඵලදායකත්වය නංවාලනු රිසියෙන් සැබෑ ගිණුමක් වශයෙන් තොග සැපයුම් ගනුදෙනු ගිණුම ක්‍රියාත්මක කරන ලෙස ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් ලං.වි.ම. වෙත යෝජනා කරන ලදී.

ලං.වි.ම. විසින් මේ දක්වාද ගිණුම පිහිටුවා නොමැති අතර ඒ හේතුවෙන් දැනට පවත්නා අවම පාරදෘශ්‍යභාවය හේතුකොට ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවට විදුලි ගාස්තු ඉහළ නැංවීමේ දුෂ්කරතා ඉස්මතු කොට ඇත.

**2017**

**නව විදුලි සම්බන්ධතා සැපයීම**

**99.3%**

**ගෘහස්ථ කාණ්ඩය සඳහා වූ කාල පාදක (TOU) විදුලි ගාස්තු ක්‍රමය**

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් 2015 වර්ෂයේ සිට ක්‍රියාත්මකවන පරිදි ගෘහ පාරිභෝගිකයන් සඳහා පරිහරණ කාල විදුලි ගාස්තු ක්‍රමය අනුමත කරන ලදී. මෙම ක්‍රමය තෙකලා, ඇම්පියර් 30 හෝ එයට ඉහළ විදුලි සැපයුමක් පරිහරණය කරන්නාවූ ගෘහ පාරිභෝගිකයන් සඳහා වූ විකල්ප ගාස්තු ක්‍රමයක් වශයෙන් සකස් කරන ලදී. 2017 මැයි මාසයේදී, මෙම ක්‍රමය එකලා ගෘහ විදුලි පාරිභෝගිකයන් සඳහාද විහිදුවන ලදී.

පරිහරණ කාල විදුලි ගාස්තු ක්‍රමයට අනුව, වෙන් වෙන් වශයෙන් මනුගත කොට බිල්පත් සකසන්නාවූ, කාර්ය බහුල නොවන (2230 - 0530), දිවා (0530-1830) හා කාර්ය බහුල (1830-2230) වශයෙන් වෙන් වෙන් වශයෙන් එන කාල කට්ටි තුනක් වේ. කාර්ය බහුල නොවන වේලාවන්හිදී ඒකකයකට (කි.වො.පැ.) රු. 13ක් පමණක් අය කෙරෙන අතර එය විදුලි වාහන ආරෝපණ අවශ්‍යතා සඳහා ආකර්ශනීය එකක් වේ. කාර්ය බහුල වේලාවන්හිදී, ඒකක ගාස්තුව රු. 54ක් වන අතර දිවා කාලයන්හිදී ඒකකයකට රු. 25ක් අය කෙරේ.

සටහන 3: විදුලි ගාස්තු පරිහරණ කාලය

| පරිහරණ කාලය | බලශක්ති ගාස්තුව (ශ්‍රී ලං.රු./ කි.වො.පැ.) | ස්ථාවර ගාස්තුව (ශ්‍රී ලං.රු./මාසය) |
|---|---|---|
| කාර්ය බහුල නොවන (පැය 2230-0530) | 13.00 | 540.00 |
| දිවා (පැය 0530-1830) | 25.00 | |
| කාර්ය බහුල (පැය 1830-2230) | 54.00 | |

**විදුලි බලාගාර තාප අනුපාත පරීක්ෂණ**

අතිවිශාල පිරිවැය ඇති කරමින් විදුලි මිල ගණන්වලට බලපෑම් ඇති කරන්නාවූ තාප විදුලි බලාගාරයන්හි කාර්යක්ෂමතාවය නිරීක්ෂණය කිරීම සඳහා විදුලිබල පද්ධතියක් තුළ ඇති තාප විදුලි බලාගාරයන්හි කලින් කලට තාප අනුපාත පරීක්ෂණ සිදුකිරීම අත්‍යවශ්‍යය. විදුලි ගාස්තු සමාලෝචන අවශ්‍යතාවයන් සඳහා තාප විදුලි බලාගාරයන්හි තාප අනුපාත සංඛ්‍යාවන් යාවත්කාලීන කරනු පිණිස, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් ලං.වි.ම. හිමිකාරීත්වය දරන විදුලි බලාගාර 5ක තාප අනුපාත පරීක්ෂණයන්හි මුල් අදියර සාර්ථකව අවසන් කරන ලදී. සෙසු තාප විදුලි බලාගාර මෙම ක්‍රියාවලියේ දෙවන අදියර යටතේ 2018 වර්ෂයේදී පරීක්ෂණයට ලක් කෙරෙනු ඇත.

**ඉන්ධන මිල දර්ශකකරණය**

සාමාන්‍යයෙන් විදුලි පිරිවැයෙන් සැලකිය යුතු පංගුවක් ඉන්ධන පිරිවැයෙන් සමන්විත වන බැවින්, එය විදුලි බලයේ අවසන් මිල ගණන් තීරණය කිරීමේ ආවශ්‍යක තීරකයෙකු වේ. මේවන විට ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව බල උත්පාදක පිරිවැය පුරෝකථනයන් තුළ අන්තර්ගත ඉන්ධන මිල ගණන් සත්‍යාපනය කරනු පිණිස බලපත්ලාභීන් විසින් ගොනුගත කරනු ලබන ඉන්වොයිසි හා සෙසු කරුණු දැක්වීම් මත රඳා පවතී. එබැවින්, බලපත්ලාභීන්ගේ ප්‍රසම්පාදන අකාර්යක්ෂමතාවයන් පාරිභෝගිකයන් වෙත විතැන් කිරීමේ ඉඩකඩ අහුරාලනු පිණිස අනාගත විදුලි ගාස්තු සමාලෝචනයන්හිදී භාවිත කරනු පිණිස ඉන්ධන මිල ගණන් සඳහා වූ දර්ශකකරණ ක්‍රමයක් ගොඩ නංවනු සඳහා දැනට පවත්නා ඉන්ධන මිල තීරණය කිරීමේ ක්‍රම පිළිබඳව ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් විමසීම් කරන ලදී.

මේ සම්බන්ධයෙන් අධ්‍යයනයන් ගණනාවක් සිදු කිරීමෙන් අනතුරුව, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් ඉන්ධන මිල දර්ශකකරණයේ පළමු කෙටුම්පත අවසන් කරන ලදී. මෙම කාර්යය 2018 වර්ෂයට ඉදිරියට ගෙන එන ලදී.

**මෙහෙයුම් විගණනය**

එලදායී ආර්ථික මෙහෙයුමක් බල උත්පාදන පිරිවැය අවම කිරීමට හේතුවනු ඇත. පිරිවැය එලදායී මෙහෙයුමක් අත්පත් කරගනිමින් මෙහෙයුම් සැලසුම් කිරීමේ හා ගනුදෙනු ක්‍රියාවලියේ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කරනු පිණිස වූ යාන්ත්‍රණයක් වශයෙන් විගණනය ප්‍රයෝජනයට ගත හැක. මෙහෙයුම් කාර්ය පරිපාටියේ කොටසක් ලං.වි.ම. විසින් සකසා ඉදිරිපත් කොට ඇති අතර එය මෙහෙයුම් විගණනය සඳහා භාවිත කරනු ඇත.



232.3
234.6
230.4
0.502
0.489
0.491
L1
L2
L3
CURSOR
ENTER
ESC
POWER
HARMONICS
EVENTS
SCOPE
METER
OFF

# විදුලි ආරක්ෂාව හා පරීක්ෂාව

ශ්‍රී ලංකාවේ විදුලිබල කර්මාන්තයේ ස්වාධීන නියාමන ආයතනය වශයෙන් හා 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත මගින් පවරා ඇති බලතල යටතේ ජනතාවගේ ආරක්ෂාව සහතික කිරීම ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ ප්‍රධාන අරමුණක් වේ. එබැවින් රටේ විදුලි සැර වැදීම් අවම කොට සමනය කරනු පිණිස කොමිෂන් සභාව විසින් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.


ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් සකස් කරන ලද ශ්‍රී ලංකාවේ විදුලි සැර වැදීම් විග්‍රහය (වාර්තාව) හෙළි කරන අයුරු, විදුලි සැර වැදීම් ආශ්‍රිත ජාත්‍යන්තර ප්‍රමිතීන් හා සසඳන කල ශ්‍රී ලංකාවේ වාර්තාවන වාර්ෂික විදුලි සැර වැදීම් ප්‍රමාණය ඉතා ඉහල අගයක් ගනී. වසර 2020 වනවිට සිදුවන දරුණු විදුලි අනතුරු සංඛ්‍යාව වාර්ෂිකව 20 දක්වා හෝ අවම කිරීමේ අරමුණින් රටේ ඉහත කී හානිකර තත්ත්වය නිරාකරණය කරනු පිණිස ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් විවිධ ක්‍රියාමාර්ග ගෙන ඇත.

දත්ත මගින් පෙන්වා දෙන අයුරින්, 2012 වර්ෂයේදී විදුලි සැර වැදීමෙන් මරණ 180ක් පමණ සිදුවී ඇති අතර එම අගය 2014 වසර වනවිට 73 දක්වා අඩු වී ඇත. 2015 දී 95ක සංඛ්‍යාවක් නියෝජනය කළ මරණ සංඛ්‍යාව 2016 වර්ෂය තුළ 98 දක්වා ඉහළ ගොස් ඇත. 2017 වර්ෂය තුළ මරණ 106ක් වාර්තා වී ඇත.


දත්ත මගින් පෙන්වන අයුරු, 2017 වර්ෂය තුළ ඉහළම විදුලි සැර වැදී මියයාම් සංඛ්‍යාවක් වාර්තා වනුයේ දකුණු හා උතුරු මැද පළාත්වලිනි.

අවදානම් සහගත පරිසරයන් තුළ කටයුතු කිරීම හේතුවෙන් විදුලි සැර වැදී මියයාම් ප්‍රමාණය සියයට 44ක් වන අතර, විදුලි සැර වැදී මියයාම් සංඛ්‍යාවෙන් සියයට 28ක් අත් වැරදීම් හා නොසැලකිල්ල හේතුකොට සිදුව ඇත.

**ප්‍රස්ථාරය 3 - ශ්‍රී ලංකාවේ විදුලි සැර වැදී මියයාම්**




**ප්‍රස්ථාරය 4 - 2017 වර්ෂයේ විදුලි සැර වැදී මියයාමට හේතු**



## හදිසි අනතුරු සමන වැඩසටහන නිරීක්ෂණය

පසුගිය වසර තුන තුළ (සාමාන්‍ය අගයෙන්) 67% ප්‍රමාණයකින් විදුලි සැර වැදී මියයාම් සංඛ්‍යාව අඩු කිරීමට මේවන විටත් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව සමත් වී ඇත්තේ වුවද, රටේ විදුලි සැර වැදී මියයාම් අනුපාතය ජනගහනයට සාපේක්ෂව පැවතිය යුතු 1:1,000,000 ජාත්‍යන්තර ප්‍රමිති මට්ටමින් බොහෝ දුරස් අගයක් ගනී. එබැවින්, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විවිධ පාර්ශ්වයන්ගෙන් සියළු දත්ත රැස් කොට ශ්‍රී ලංකාවේ විදුලි සැර වැදී මියයාම්වලට ප්‍රධාන හේතු හතරක් හඳුනා ගන්නා ලදී. එම හේතු නම්,

- ට්‍රිප් ස්විචයක් නොමැති වීම හෝ ට්‍රිප් ස්විචයට හානි සිදුවී තිබීම
- නීති විරෝධී ලෙස විදුලිය ලබාගැනීම
- විදුලි මාර්ග පිරිසිදු කිරීමේ ගැටළු හා
- සතුන් මැරීමට හෝ වගා ආරක්ෂා කිරීමට විදුලිය යොදා ගැනීම වේ.

විදුලි කාර්මිකයන් වෙත බලපත් ලබාදීම, පේනු හා කෙවෙනි පිටවුම් සඳහා ප්‍රමිතියක් හඳුන්වා දීම, විදුලි මාර්ග පිරිසිදු කිරීමේ නඩත්තු කටයුතු, සෑම වසර පහකටම වරක් ගෘහස්ත විදුලි ස්ථාපනයන් පරීක්ෂා කිරීම, නව නිවසක් ඉදි කිරීමේදී ලං.වි.ම. හෝ ලංකා විදුලි පෞද්ගලික සමාගම වෙතින් විදුලි මාර්ග නිෂ්කාශනයක් ලබාගැනීම ආදිය හඳුනාගත් අතර ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් මෙම ක්‍රමෝපායන්ගෙන් සමහරක් 2017 වර්ෂය තුළම ආරම්භ කළ අතර, එළැඹෙන වසරේ තවදුරටත් එම කටයුතු පවත්වාගෙන යනු ඇත.

## සම්ප්‍රේෂණ පද්ධතියේ විශ්වසනීයත්වය ප්‍රවර්ධනය පිණිස ගතයුතු සමන ක්‍රියාමාර්ග

විදුලි පාරිභෝගිකයන් විෂයෙහි විදුලිබල සැපයුමට බාධා සිදුවීම් හා විදුලි බලය ඇණ හිටවුම් කාල සීමාවන් අවම කරනු පිණිස ඒ ඒ සම්ප්‍රේෂණ පද්ධතිමය උප-බලාගාර හා සම්ප්‍රේෂණ මාර්ග කෙරෙහි නිසි සැලකිල්ල යොමු කරමින් සම්ප්‍රේෂණ පද්ධති සාමාන්‍ය අත්හිටුවීම් කාල සීමා දර්ශකය (TSAIDI) සහ සම්ප්‍රේෂණ පද්ධති සාමාන්‍ය අත්හිටුවීම් සංඛ්‍යාත දර්ශකය (TSAIFI) කෙරෙහි බලපාන්නාවූ මූලික හේතු හඳුනාගනු පිණිස 2017 වර්ෂයේදී ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විශ්ලේෂණාත්මක විමර්ශනයක නිරත විය. බල ශක්ති ඉල්ලුම නොකඩවා ඉහළ යන තත්ත්වයක් තුළ, මූලික හේතුව හඳුනාගැනීම ඉතා වැදගත් වනුයේ බෙදා හරින ලද උත්පාදනයන්ද ඇතුළත්ව යම් පද්ධතියක් එහි ස්ථාවරත්ව සීමාවනට ආසන්න මට්ටමක මෙහෙයවීම අපේක්ෂා කෙරෙන විට දෝෂ අවදානම් ඉහළ නැගෙන බැවිනි.

2016 වර්ෂය තුළ ශ්‍රී ලංකාවේ සම්ප්‍රේෂණ පද්ධතිය තුළ සිදුවූ විදුලි සම්ප්‍රේෂණ ඇණ හිටීම් කාල සීමාවේ විශ්ලේෂණාත්මක හරස්කඩ මගින් පෙන්නුම් කරනුයේ ධාරා ට්‍රාන්ස්ෆෝමර පිපිරී යාම හා බිම් සවිකුරු ට්‍රාන්ස්ෆෝමරයන්හි දෝෂ තත්ත්වය හේතුවෙන් ප්‍රධාන වශයෙන් දීර්ඝ කාලීන විදුලි ට්‍රාන්ස්ෆෝමර ඇණ හිටීම් සිදුව ඇති බවයි. තවද, බොහෝ ට්‍රාන්ස්ෆෝමර අධි ධාරිතා උපයෝජනයට ලක්ව ඇති අතර, විවිධාංගික ආරක්ෂණ ක්‍රියාත්මක කිරීම හා අධි ධාරාව හා බිම් දෝෂගත ආරක්ෂණයන් සම්බන්ධ වීම හේතුකොට එයින් සමහරක් ට්‍රිප්ගතව ඇත.

පද්ධති සාමාන්‍ය විදුලිය ඇණ හිටීම් කාල පරිච්ඡේද දර්ශකය (SAIDI) සහ පද්ධති සාමාන්‍ය විදුලිය ඇණ හිටීම් සංඛ්‍යාත දර්ශකය (SAIFI) පාරිභෝගිකයන් වෙත සපයා දෙනු ලබන විදුලිබල සැපයුමෙහි විශ්වසනීයත්වය නිරූපණය කරන්නාවූ එකී ප්‍රමුඛතාවයන් පිළිබඳ දර්ශක දෙක වේ. එහිලා විදුලි ඇණ හිටීම් සම්බන්ධ කාල පරිච්ඡේදය හා සංඛ්‍යාතය මනිනු ලබන අතර පිළිවෙලින් එම අගයන් වාර්ෂිකව පැය 24ක් හා අවස්ථා 30ක් වශයෙන් වූ ඒවායේ නියම කරන ලද හා පිළිගත් සීමාවන් නොඉක්මවන බවට සහතික කෙරේ.

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ පරීක්ෂණ අංශය විසින් විදුලිය ඇණ හිටීම් සිදුවන්නාවූ දැනට පවත්නා සැපයුම් ගුණාත්මක භාවය සොයා ගැනීම සඳහා සමීක්ෂණයක් සිදු කිරීමේ අදහසින් ලං.වි.ම. පාර්ශ්වයෙන් ගාල්ල, රත්නපුර හා නුවර එළිය මෙන්ම ලංකා විදුලි පෞද්ගලික සමාගම පාර්ශ්වයෙන් ගාල්ල ආදී වශයෙන් 2015 වර්ෂයට අදාළ බෙදාහැරීමේ ප්‍රදේශ කොටස් කිරීම් සම්බන්ධ විග්‍රහයක් ලබාගන්නා ලදී.

එකී කොටස් කිරීම් දත්ත සම්පාදන කාර්යාවලිය තුළ පහත දක්වා ඇති හේතු මත පාරිභෝගික සේවා මධ්‍යස්ථානයන්හි පවත්නා බෙදුම් වාර්තාවන්ගෙන් විශ්වසනීය තොරතුරු ලබාගැනීමේ විෂයයෙහි යම් සීමාවනට මුහුණ පෑමට සිදුවිය.

1. විදුලිය ඇණ හිටීම් කාලයනට බලපෑ හේතු සාධක ඇතුළත් කිරීමේ අවුල් සහගත භාවය
2. විදුලි දෝෂයන් සම්බන්ධයෙන් (ගෘහස්ථ/අධිබල/අවබල) කාණ්ඩයන් සහ අදාළ සිදුවීම් තුළ බලපෑමට ලක්වූ නිවැරදි පාරිභෝගිකයන් සංඛ්‍යාව සොයා ගැනීමේ අවිනිශ්චිත බව
3. සැබෑ ලෙසම පාරිභෝගික සේවා මධ්‍යස්ථාන වෙත එම සිදුවීම් වාර්තා කරන ලද හා එම මධ්‍යස්ථාන විසින් ඒවා යථා තත්ත්වයට පත් කරන ලද කාලය
4. සියළු බෙදාහැරීමේ ශාඛා අතර පොදු බිඳ වැටීම් වාර්තාකරණ රටාවක් හා සම්බන්ධීකරණයක් නොමැති වීම.

එබැවින්, පද්ධති සාමාන්‍ය විදුලිය ඇණ හිටීම් කාල පරිච්ඡේද දර්ශකය (SAIDI) සහ පද්ධති සාමාන්‍ය විදුලිය ඇණ හිටීම් සංඛ්‍යාත දර්ශකය (SAIFI) කෙරෙහි බලපෑම් ඇති කරන්නාවූ මූල හේතූන් හඳුනාගැනීමේ කාර්යය ක්‍රියාත්මක කිරීමේදී නිසි වැඩි දියුණු කිරීම්, විදුලි පද්ධතීන්හි විදුලි සැපයුමෙහි ගුණාත්මකභාවය, සේවා ගුණාත්මකභාවය හා විශ්වසනීයත්වය කෙරෙහි අනුගත වීම මගින් පෙරකී කරුණු මැඩ පැවැත්විය හැක.

## සම්ප්‍රේෂණ වත්කම් කළමනාකරණය තක්සේරු කිරීම

පාරිභෝගිකයන් වෙත විශ්වසනීය විදුලි සැපයුමක් පවත්වාගෙන යාම පිණිස සම්ප්‍රේෂණ පද්ධති නඩත්තුව වැදගත් වේ. සම්ප්‍රේෂණ පද්ධති වත්කම් ප්‍රාග්ධන මූලික වන බැවින් වඩාත් යහපත් වත්කම් කළමනාකරණ පරිචයන් හා අනුගත වීම පද්ධතිය මනා තත්ත්වයකින් පවත්වාගෙන යාමේ පිරිවැය අවම කිරීමට උපකාරී වේ.

මෙම කාර්යයේදී, පාර්භෝගික යහපත ආරක්ෂා කරනු පිණිස හා මහජන මුදල් කාර්යක්ෂමව භාවිත කිරීමේ කාර්යය ප්‍රවර්ධනය කරනු පිණිස සම්ප්‍රේෂණ වත්කම් කළමනාකරණය පිළිබඳ නියාමන තක්සේරු කාර්යය සවිබල ගැන්වීමේ අවශ්‍යතාවය හඳුනා ගැනීම කෙරෙහි ප්‍රයත්න දරන ලදී. ඒ අනුව, සම්ප්‍රේෂණ බලපත්ලාභියාගේ වත්කම් කළමනාකරණ පරිචයන් සමාලෝචනය කිරීමේ කාර්යය සිදුකරන ආකාරය හා පහත කරුණු සාක්ෂාත් කරගනු පිණිස අනුගමනය කළයුතු නියාමන මෙවලම් කවරේද යන්න පිළිබඳ නිර්දේශ ගණනාවක් සකස් කරන ලදී.

- ප්‍රාග්ධන මූලික සම්ප්‍රේෂණ වත්කම් මාරු කිරීම හා පුළුල් කිරීම සඳහා වූ අනවශ්‍ය හා කාලීන නොවන වියදම්වලින් වැළකී සිටීම.

- සම්ප්‍රේෂණ බලපත්ලාභියාගේ ආදායම් අවශ්‍යතා අධ්‍යයනය කොට සාධාරණ නොවන අවශ්‍යතා වළක්වාලීම.

- සම්ප්‍රේෂණ වත්කම් නඩත්තුව සම්බන්ධ යහ පරිචයන් අනුගමනය කිරීමට සම්ප්‍රේෂණ බලපත්ලාභියා පෙළඹවීම සහ එයට ප්‍රතිචාරීව ජනතාව වෙත ඉමහත් වැය බරක් පටවනු ඇත්තාවූ ආරම්භක දෝෂ හඳුනාගනිමින් බලය යොදා කරනු ලබන විදුලි ඇණ හිටීම් වළක්වාලීම.

- ලබා නොදෙන බලශක්ති ප්‍රමාණය අවම කිරීම.

සම්ප්‍රේෂණ පද්ධති උපාගාර වත්කම් නඩත්තු කළමනාකරණයට අදාළ කර්මාන්තමය යහ පරිචයන් පිළිබඳ කාලීන සමීක්ෂණයෙන් ලබාගත් තොරතුරු සහ මින් පෙර සිදුකරන ලද දෝෂ විමර්ශනයෙන් උගත් පාඩම් හා අනුගතව, සම්ප්‍රේෂණ බලපත්ලාභියාගේ වත්කම් කළමනාකරණ පරිචයන් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කළයුතු අවස්ථාවන් හා ආකාරය පිළිබඳව කොමිෂන් සභාව දැනුවත් කිරීම සඳහා මෙම වාර්තාව සකස් කරන ලදී.

**ආරක්ෂක හා තාක්ෂණික කළමනාකරණ සැලැස්ම සැකසීම හා ක්‍රියාත්මක කිරීම**

පනවන ලද ආරක්ෂක රීති ප්‍රකාර ආරක්ෂක හා තාක්ෂණික කළමනාකරණ සැලැස්මට ඉහළම ප්‍රමුඛත්වය ලැබේ.

දිනෙන් දින වර්ධනය වෙමින් පවත්නා විදුලි සැර වැදී මියයාම් ප්‍රමාණය හා එය සිදුවන අනුපාතයන් සැලකිල්ලට ගනිමින් සමනය කරනු පිණිස, දැනුවත් කිරීමේ වැඩසටහන්, වැඩමුළු, තරඟ ආදී වශයෙන් රටපුරා විවිධාකාරයෙන් ආරක්ෂාව ප්‍රවර්ධනය කිරීමේ කටයුතු කොමිෂන් සභාව විසින් ආරම්භ කරන ලදී. සිවු වසරක කාල පරාසයක් තුළ 180 සිට 76 දක්වා වූ දැඩි පහත වැටීමක් විදුලි සැර වැදී මියයාම් සංඛ්‍යාව තුළ පෙන්නුම් කරන නමුදු, පසුගිය වසර තුළ මෙහි වර්ධනය වීමේ ප්‍රවණතාවයක් දිස් විය.

විදුලි බලය උත්පාදනය කෙරෙන අවස්ථාවේ සිට පාරිභෝගිකයා වෙත ලබාදෙන අවස්ථාව දක්වා එහි ආරක්ෂාව තහවුරු කරනු පිණිස, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව ආරක්ෂිත විදුලි සේවා හා සැපයුම් සම්පාදනයෙහි ලා සෑම බලපත්ලාභියෙකු විෂයයෙහිම ගුණාත්මකභාවය හා අඛණ්ඩ සේවා සම්පාදනය සහිත විදුලි ආරක්ෂාවක් ලබා දීමේ හැකියාව ඇතිකළ ආරක්ෂක හා තාක්ෂණික කළමනාකරණ සැලැස්ම සැකසීමේ කාර්යයෙහි නියැළිණි.

උපදේශන සේවා සඳහා ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කොට කෙටුම්පත් වාර්තාව ආරම්භ කිරීමෙහිලා උපදේශන කාලය තුළ අඛණ්ඩව රැස්වීම් පවත්වන ලදී.

**ස්වාධීන ආරක්ෂක විගණනයන් ක්‍රියාත්මක කිරීම හා පොදු මාදිලියක් අර්ථ ගැන්වීම**

ස්වාධීන ආරක්ෂක විගණනයන් ක්‍රියාත්මක කිරීම හා පොදු මාදිලියක් අර්ථ නිරූපණය යන කරුණ ආරක්ෂක හා තාක්ෂණික කළමනාකරණ සැලැස්ම හා සමාන්තරව ගමන් කරන්නකි. මෙය ආරක්ෂක හා තාක්ෂණික කළමනාකරණ සැලැස්ම පිහිටුවීමෙන් පසු කරුණු මැන බලා නිරීක්ෂණය කිරීම සඳහා භාවිත කෙරෙන අතර, සියළු බලපත්ලාභීන් පරීක්ෂාවට ලක්ව පවත්වාගෙන යාම සඳහා ස්වාධීන විගණකයන් වෙත මාර්ගෝපදේශයක්ද වනු ඇත. තවද, එය විදුලි ආරක්ෂාව විගණනය කරන්නාවූ සියල්ලන් විසින් අනුගමනය කරන ප්‍රමිතියක් බවට පත්වනු පිණිස මාදිලියක්ද අනුමත කරන ලදී.

# පරිසර, පුනර්ජනනීය විදුලිය හා කාර්යක්ෂමතාවය

## විදුලි ඉල්ලුම

ශ්‍රී ලංකාවේ විදුලි ඉල්ලුම පසුගිය වසර 20ක කාලය තුළ සියයට 6කට ආසන්න සාමාන්‍ය වාර්ෂික අනුපාතයකින් වර්ධනය වී ඇති අතර, දෘශ්‍යමාන ඉදිරි කාලය තුළද මෙම ප්‍රවණතාවය අඛණ්ඩව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2017 වර්ෂාවසානය වනවිට, සමස්ත ජනගහනයෙන් සියයට 99කට ආසන්න සංඛ්‍යාවක් වෙත ජාතික විදුලි සම්ප්‍රේෂණ පද්ධතියෙන් විදුලිය සඳහා ප්‍රවේශය ලැබී තිබිණි. 2017 වර්ෂය තුළ වාර්තාගත උපරිම උච්ච ඉල්ලුම 2017 මැයි මස 17වන දින මෙගාවොට් 2,523ක් ලෙස වාර්තා විය. සාමාන්‍ය දෛනික ඉල්ලුම පැයට ගිගාවොට් 40කට ආසන්න වන අතර 2017 අප්‍රේල් මස 26වන දින වාර්තා වූ උපරිමය පැයට ගිගාවොට් 44.97ක් විය.

විදුලි ගාස්තු කාණ්ඩගත කිරීම අනුව ගෘහස්ත විදුලි පාරිභෝගිකයන් (87%) ප්‍රධාන කොටගෙන රටතුළ සිටින විදුලි පාරිභෝගිකයන් සංඛ්‍යාව 6,647,074ක් වේ. විදුලි ඉල්ලුමෙන් 34%ක් ගෘහස්ත පාරිභෝගිකයන්ගෙන්ද, 29%ක් කර්මාන්තයන්ගෙන්ද 21%ක් පොදු අවශ්‍යතාගත පාරිභෝගිකයන්ගෙන්ද ඉතිරි 16% ආගමික සංවිධාන, රජයේ ආයතන, හෝටල් හා මාර්ග විදුලිකරණයන්ගෙන්ද සමන්විත වේ.

## කාර්මික බලශක්ති ඉල්ලුම වැදගත් වේ.

ගෝලීය කාබන්ඩයොක්සයිඩ් විමෝචනයෙන් 24%කට කර්මාන්ත වගකිව යුතුය. 2010 වර්ෂයේ සිට වාර්ෂිකව 1.3%කින් පමණ ගෝලීය කාර්මික බලශක්ති පරිභෝජනය වර්ධනය වී ඇත (කර්මාන්ත අංශයේ අගය එක් කිරීම 2.9%කින් වර්ධනය වී ඇත). 2010 සිට 2016 කාල පරිච්ඡේදය අතරතුරු ඉහළම බලශක්ති ඉල්ලුම් වර්ධනය සිදුවූයේ ඉන්දියාවේ (94.7%), දකුණු කොරියාවේ (2.7%), චීනයේ (2.6%) හා මැද පෙරදිග (2.5%)යි.

ලෝක කර්මාන්ත ඵලදායකත්වය (පරිභරණය කළ බලශක්ති ඒකකයකට කර්මාන්ත අගය එක් කිරීම) 2010 සිට 2016 දක්වා වාර්ෂිකව 1.6%කින් වර්ධනය වී ඇත.

## වර්ධනය වන බලශක්ති ඉල්ලුම සපුරාලීමේ පළමු අවශ්‍යතාවය වනුයේ බලශක්ති කාර්යක්ෂමතාවයයි.

2017 බලශක්ති කාර්යක්ෂමතාවය පිළිබඳ ජාත්‍යන්තර බලශක්ති නියෝජිතායතනයේ (IEA) වාර්තාවට අනුව, ලෝකය 2016 වර්ෂය තුළ නොකඩවා සිය බලශක්තියෙන් වඩා ඉහළ වටිනාකමක් උත්පාදනය කරන ලදී. ලෝක බලශක්ති තීව්‍රතාවය - දළ දේශීය නිෂ්පාදිතයෙන් (GDP) එක් ඒකකයක් නිපදවීම සඳහා අවශ්‍ය මූලික බලශක්ති ඉල්ලුමේ අගය වශයෙන් මැනෙන- 2016 වර්ෂයේදී 1.8%කින් පහත වැටිණි. 2010 සිට, තීව්‍රතාවය වර්ෂයකට 2.1%ක සාමාන්‍ය අනුපාතයකින් පහත වැටී ඇති අතර එය 1970 සහ 2010 අතර 1.3%ක් ලෙස වූ සාමාන්‍ය අනුපාතයේ සිට සැලකිය යුතු ඉහළ යාමකි. චීනය නැවතද වරක් ගෝලීය ප්‍රවණතාවයන් මත වඩාත් සැලකිය යුතු බලපෑම ඇති කරන්නාවූ රට බවට පත්ව ඇති තත්ත්වයක, රටවල් හා කළාප හරහා තීව්‍රතාවයේ වර්ධනය පුළුල් විවිධත්වයක් පෙන්නුම් කරයි. මෙ මගින් විශාල ප්‍රමාණයෙන් බලශක්ති පරිභරණය වළකමින්, පාරිභෝගිකයන් හට මූල්‍ය ඉතුරුම් උත්පාදනය කරමින් හරිතාගාර වායු (GHG) විමෝචනයන්හි වර්ධනය වළක්වාලීම සිදු කරයි. පාරිසරික ලාභ ප්‍රයෝජනයනට අමතරව, කාර්යක්ෂමතාවය විසින් බලශක්ති ආරක්ෂාවද වැඩි වර්ධනය කරනු ලබයි.

පරිසරය, පුනර්ජනනීය බලශක්ති හා විදුලිබල අංශයේ කාර්යක්ෂමතාවය නංවාලනු වස් 2017 වර්ෂය තුළ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් පහත සඳහන් ව්‍යාපෘති සිදු කරන ලදී.

## සෙසු තාප විදුලි බලාගාර (කැලනිතිස්ස හා සපුගස්කන්ද) ආශ්‍රිත පාරිසරික බලපෑම සමාලෝචනය හා අඛණ්ඩ පාරිසරික කාර්ය සාධන නිරීක්ෂණයන් ක්‍රියාත්මක කිරීම

නොරොච්චෝලේ බලාගාරයේ පාරිසරික බලපෑම් තක්සේරුව (EIA) සිදු කිරීම සඳහා පත්කරන ලද විශේෂඥ කමිටුව විසින් අනෙකුත් තාප විදුලි බලාගාරයන්හි සමාලෝචනයන්ද සිදු කිරීම අපේක්ෂිතය. මෙම කාර්යය 2019 වර්ෂය දක්වා ඉදිරියට ගෙන එන ලදී.

## පාරිසරික කාර්ය සාධන තොරතුරු ප්‍රචාරණය

රටේ සියළු තාප විදුලි බලාගාරයන්ගෙන් රැස් කරගන්නා සැබෑ පාරිසරික කාර්ය සාධන දත්ත මගින් වාර්ෂික පාරිසරික කාර්ය සාධන වාර්තාවක් සම්පාදනය කොට ඉන්පසු වාර්තාවක් පළ කොට පසුගාමී ප්‍රදේශ සඳහා අවශ්‍ය විශෝධනයන් හා සමනයන් සිදු කිරීමට ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් සැලසුම් කර ඇත. 2017 වර්ෂය තුළ දත්ත ඉදිරිපත් කිරීමේ ආකෘති කෙටුම්පත් කොට බලපත්ලාභීන් අතර බෙදා හරින ලදී. ඒ ඒ ලං.වි.ම. බල උත්පාදනාගාරය සඳහා වගකිවයුතු නියෝජිතයන් හමුවී පාරිසරික දත්ත ඉදිරිපත් කෙරෙන ආකෘති පිළිබඳව සාකච්ඡා කරන ලදී. 2017 වර්ෂය තුළ පාරිසරික කාර්ය සාධන වාර්තා ආකෘති සාකච්ඡා කොට අවසන් කරන ලදී.

# බලපත්‍ර නිකුත් කිරීම

බලපත් ලබාදීමේ සිය කාර්ය භාරය තුළ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙත පුද්ගලික විදුලි නිෂ්පාදකයන් තක්සේරු කිරීමේ, (විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ අදහස් විමසමින්) තෝරා ගැනීමේ හා ඔවුන් වෙත විදුලි උත්පාදන බලපත් ලබාදීමේ වගකීම් පවරා දී ඇත.

එය විසින් බලපත්ලාභීන් දෙදෙනාගේ (ලං.වි.ම. හා ලංකා විදුලි පෞද්ගලික සමාගම) බෙදාහැරීමේ කටයුතු නිතිපතා නිරීක්ෂණය කරමින් අවශ්‍ය විට හා අවශ්‍ය තැන්හි නියාමන මැදිහත්කරණය සිදු කරනු පිණිස බල උත්පාදන, සම්ප්‍රේෂණ, අලෙවි පිරිවැය ආදිය පිළිබඳ මාසික තොරතුරු ඉල්ලා සිටී.

**බෙදාහැරීමේ බලපත්ලාභීන්ගේ කාර්ය සාධන සාරාංශය - 2017**

- සමස්ත විදුලි පරිභෝජනය - ඒකක බිලියන 13.2
- සමස්ත පාරිභෝගික පදනම - මිලියන 6.6
- සමස්ත අලෙවි ආදායම - රු. බිලියන 223,190
- (2011 සිට 2016 දක්වා වූ වර්ෂවල දත්ත පදනම්ගතව) සමස්ත පාරිභෝගික වර්ධනය වාර්ෂිකව 4%කි.
- 2017 වර්ෂයේ කාර්මික පාරිභෝගික වර්ධනය 3.3%කි.
- 2017 වර්ෂයේ පොදු අවශ්‍යතා පාරිභෝගික වර්ධනය 3.1%කි.

(ඒකකය = කිලෝ වොට් පැය)

**මධ්‍ය වෝල්ටීයතා සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය නිරීක්ෂණය හා කාර්ය සාධන වාර්තාව**

ලං.වි.ම. විසින් වසර පහක් සඳහා (2017-2022) මධ්‍ය වෝල්ටීයතා සංවර්ධන සැලැස්මක් ඉදිරිපත් කර ඇති අතර, මෙම කාර්යය සිදු කරන ලද්දේ සැලැස්මේ ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සඳහා වේ. ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් 2017 වර්ෂය සඳහා සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ කාර්යය නිරීක්ෂණය කරන ලද අතර, තක්සේරුකරණය සම්පූර්ණ කරන ලදී. මෙම කාර්යය 2018 වර්ෂය දක්වාද ඉදිරියට ගෙන එන ලදී.

**බෙදාහැරීමේ කේත බලගැන්වීමේ හා සමාලෝචන මණ්ඩල රැස්වීම්වලදී ගත් තීරණ ක්‍රියාත්මක කිරීම**

බලපත්ලාභීන්ගේ බෙදාහැරීමේ කේත නිරීක්ෂණය කරනු පිණිස, බෙදාහැරීමේ කේත බලගැන්වීමේ හා සමාලෝචන මණ්ඩලය පිහිටුවන ලදී. 2017 වර්ෂයේදී, මණ්ඩලය විසින් වර්ෂ ගණනාවක් පුරා යාවත්කාලීන කොට නොමැති ලං.වි.ම. හා ලංකා විදුලි පෞද්ගලික සමාගමේ ආරක්ෂණ අත්පොත යාවත්කාලීන කිරීමේ තීරණයක් ගන්නා ලදී. බලපත්ලාභීන් විසින් එවනු ඇත්තාවූ යාවත්කාලීන කළ ආරක්ෂණ අත්පොත් සමාලෝචනය සඳහා සමාලෝචන මණ්ඩලයක්ද පත්කොට ඇත. ලංකා විදුලි පෞද්ගලික සමාගම විසින් ආරක්ෂණ අත්පොත යාවත්කාලීන කොට ඇති අතර සමාලෝචන මණ්ඩලය විසින් අවශ්‍ය නිශ්කාශනය ලබාදෙන ලදී. ලං.වි.ම. මේ දක්වාද ආරක්ෂණ අත්පොත ඉදිරිපත් කර නොමැති බැවින්, එම කාර්යය 2018 වර්ෂය දක්වා ඉදිරියට ගෙන එන ලදී.

**බෙදාහැරීමේ බලපත්ලාභීන් අතර මැදි වෝල්ටීයතා මට්ටමින් පද්ධති සාමාන්‍ය ඇණ හිටීම් කාල සීමා දර්ශකය (SAIDI)/ පද්ධති සාමාන්‍ය ඇණ හිටීම් සංඛ්‍යාත දර්ශකය (SAIFI) ප්‍රමිතිකරණය**

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් මෙම කාර්යය තුළින් විදුලිය බෙදාහැරීමේ සැපයුම් විශ්වසනීයත්වය නිරීක්ෂණය කිරීමට සැලසුම් කරන ලදී. ලං.වි.ම. හා ලංකා විදුලි පෞද්ගලික සමාගම යටතේ වූ කළාප සීමිත සංඛ්‍යාවක් විසින් පමණක් තොරතුරු ඉදිරිපත් කළ බැවින්, එම කාර්යය 2018 වර්ෂය දක්වා ඉදිරියට ගෙන එන ලදී.

**විමසුම් පදනම්ගත ස්වයංක්‍රීය වාර්තා උත්පාදන පහසුකම සහිතව බලපත් තොරතුරු ඉදිරිපත් කිරීමේ පද්ධතිය (LISS) යාවත්කාලීන කිරීම**

බලපත් තොරතුරු ඉදිරිපත් කිරීමේ පද්ධතිය (LISS) නියාමන කාර්යයන් සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙත වූ තොරතුරු අවශ්‍යතාවයට පිළියම් ලෙස පිහිටුවන ලදී. එබැවින්, බෙදාහැරීමේ කාර්ය සාධනය ආශ්‍රිත වාර්තා ස්වයංක්‍රීයව උත්පාදනය පිණිස ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් බලපත් තොරතුරු ඉදිරිපත් කිරීමේ පද්ධතිය (LISS) යාවත්කාලීන කරන ලදී.

**බලපත් අයැදුම්පත් හා ව්‍යතිරේක (නව අයැදුම්පත්, නවීකරණයන්, දීර්ඝ කිරීම්) තක්සේරුව බලපත් ලබාදීම සහ ඉන්වොයිසිකරණය**

2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත මගින් විදුලිබල උත්පාදන බලාගාරයක් ස්ථාපනයට හෝ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන්නාවූ ඕනෑම පාර්ශ්වයක් විසින් කොමිෂන් සභාවේ අනුමැතිය ඒ සඳහා ලබාගැනීම අනිවාර්ය කරයි. රටතුළ නිෂ්පාදිත විදුලි බලයේ ආරක්ෂාව, ගුණාත්මකභාවය සහ කාර්යක්ෂමතාවය සහතික කිරීමේ අවශ්‍යතාවය සහ විදුලි බලය උත්පාදනය සඳහා අවශ්‍ය ප්‍රමිතීන් නියාමනය යන කරුණු විසින්ද මෙම අවශ්‍යතාවය ඇතිකර ඇත. ඒ අනුව, රටතුළ විදුලි බලය නිෂ්පාදනය කරන්නාවූ සියළු පාර්ශ්වයන් වෙත ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් විදුලි උත්පාදන බලපත් නිකුත් කෙරේ. ලං.වි.ම. විශාලතම විදුලි උත්පාදක බලපත්ලාභියා වේ.

2017 වර්ෂය තුළ, විදුලිබල උත්පාදනය සඳහා වූ බල උත්පාදන බලපත් ලබාගැනීම සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙත අයැදුම්පත් 17ක් ලැබිණි. 2017 වර්ෂය තුළ බලපත් 15ක් ලබා දෙන ලදී.

සටහන 4 - බලපත්‍ර හා නිදහස් කිරීම් නිකුතුව

| 2017 වර්ෂය | |
|---|---|
| නිකුත් කළ බලපත් සංඛ්‍යාව | 15 |
| නිකුත් කළ ව්‍යතිරේක සංඛ්‍යාව | 24 |
| සමාලෝචනය කොට අමාත්‍යවරයාගේ අදහස් එකඟතාවය සඳහා නිර්දේශිත අයැදුම්පත් සංඛ්‍යාව | 11 |

සටහන 5 - අයැදුම්පත් වර්ගය

| අයැදුම්පත් වර්ගය | සංඛ්‍යාව |
|---|---|
| ඩෙන්ඩ්‍රෝ | 01 |
| කුඩා ජලවිදුලි | 09 |
| නාගරික ඝණ අපද්‍රව්‍ය | 02 |
| තාප | 05 |

**සම්ප්‍රේෂණ කාර්යසාධන ප්‍රමිති රෙගුලාසි ක්‍රියාත්මක කිරීම**

මෙම කාර්යයේ අරමුණ වූයේ සම්ප්‍රේෂණ කාර්ය සාධන ප්‍රමිති රෙගුලාසි ක්‍රියාත්මක කිරීමයි. මෙම රෙගුලාසි මගින් සම්ප්‍රේෂණ, උත්පාදක බලපත්ලාභීන් හා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් (රෙගුලාසි තුළ පනවා ඇති කාර්ය සාධන දර්ශක කට්ටලයක් මගින්) වර්තමාන කාර්ය සාධන මට්ටම හඳුනාගෙන කාර්ය සාධන ඉලක්ක ලබා දෙමින් කාර්ය සාධනය ක්‍රමිකව වැඩිදියුණු කිරීම අවශ්‍ය කෙරේ.

රෙගුලාසි තුළ පළමු ඉලක්ක කට්ටලය හඳුනා ගන්නා තෙක් සාර්ථක කරගත යුතු අරමුණු ඇතුළත්ව සම්ප්‍රේෂණ/ උත්පාදක බලපත්ලාභීන් මෙන්ම ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් ද සපුරාලිය යුතු ක්‍රියාකාරකම් පනවන අතර පළමු කාර්ය සාධන වටය ඉලක්ක හා සාපේක්ෂව මනිනු ලබයි. රෙගුලාසි ක්‍රියාත්මක කිරීම ප්‍රාරම්භක අදියර, භාර ගැනීමේ අදියර සහ සක්‍රිය අදියර වශයෙන් අදියර තුනක් මගින් සිදු කෙරේ.

2017 වර්ෂය තුළ ප්‍රාරම්භක අදියර ක්‍රියාත්මක කරන ලද අතර, රෙගුලාසි ක්‍රියාත්මක කිරීම සඳහා සම්ප්‍රේෂණ/ උත්පාදක බලපත්ලාභීන් වෙත අවශ්‍ය කෙරෙන සම්පත් සම්ප්‍රේෂණ බලපත්ලාභියා විසින් හඳුනාගනු ලැබ කොමිෂන් සභාවේ අනුමැතිය පිණිස වාර්තාව කොමිෂන් සභාව වෙත එහිදී ඉදිරිපත් කරන ලදී. වාර්තාව සමාලෝචනය කිරීමෙන් අනතුරුව කොමිෂන් සභාව විසින් ඒ සඳහා අනුමැතිය ලබාදෙන ලදී. රෙගුලාසි ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සම්පත් පිළිබඳ විස්තර සම්ප්‍රේෂණ බලපත්ලාභියා වෙතින් ලබාගන්නා ලද අතර, වාර්තාව සඳහා කොමිෂන් සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

# අවම පිරිවැය දිගු කාලීන විදුලි ජනන සැලැස්ම (LCLTGEP)

අවම පිරිවැය දිගු කාලීන විදුලි ජනන සැලස්ම ඇති විදුලි බලාගාර සංඛ්‍යාව සහ විදුලි බලාගාරයන්හි තාක්ෂණයන් පිලිබදව තීරණය කරනු ලබයි. සැලැස්ම සම්ප්‍රේෂණ බලපත්ලාභී ලං.වි.ම. විසින් සකස් කරන ලදී.

ඒ අනුව, 2017 පෙබරවාරි මාසයේදී LCLTGEP 2018-37 සඳහා වූ යෙදුම් දත්ත පරාමිතීන් ලං.වි.ම. විසින් ඉදිරිපත් කරන ලදී. ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් යෙදුම් දත්ත පරාමිතීන් පිළිබඳ මහජන අදහස් විමසීමක් සිදු කරන ලද අතර, එහිදී ලිඛිත අදහස් දැක්වීම් ඉදිරිපත් කරන ලෙස පාර්ශ්වකරුවන් වෙත ආරාධනය කරන ලදී.

ලං.වි.ම. විසින් 2017 මැයි මාසයේදී LCLTGEP 2018-37 ඉදිරිපත් කරන ලදී. ඉදිරිපත් කරන ලද සැලැස්ම පිළිබඳ මහජන අදහස් ලබාගනු පිණිස ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනතේ 17 (ආ) වගන්තිය සහ 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 3 (ඖ) වගන්තිය ප්‍රකාර (ලිඛිත හා වාචික ආකාරයන්ගෙන්) මහජන අදහස් විමසීමක් සිදු කරන ලදී.

අවම පිරිවැය දිගු කාලීන විදුලි ජනන සැලැස්ම 2018-2037 සැලසුම්ගත කාල පරිච්ඡේදය සඳහා ලං.වි.ම. විසින් සිදු කරන ලද අවසන් විදුලිබල ව්‍යාප්ති සැලසුම් අධ්‍යයනයන්ගේ ප්‍රතිඵල මත පදනම්ව සකස් කර ඇති අතර, එමගින් රට තුළ විදුලිබල ඌණතාවයන් ඇතිවීම වළක්වාලනු පිණිස වඩාත් තිරසර තාක්ෂණය මත පදනම් වූ අවම පිරිවැය බලාගාර එක් කිරීමේ අනුපිළිවෙලක් හඳුනා ගනිමින් පුරෝකථනය කළ ඉල්ලුම් වර්ධනය සපුරාලීම ඉලක්ක කරයි.

පාර්ශ්වකරුවන් ගේ අදහස් උකහා ගනිමින්, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කර ඇති සැලැස්ම පිලිබඳ ගැඹුරු අධ්‍යයනයන් සිදු කරන ලද අතර විවිධ විදුලිබලාගාර සම්බන්ධතාවයන් සම්පාදනය කරන්නාවූ නව ආකෘතීන් 12ක් ගොඩනගමින් එය 2017 ජූලි මස 07වන දිනට හෝ එදිනට පෙර ඉදිරිපත් කරන ලෙස ලං.වි.ම. වෙත දැනුම් දෙන ලදී. මෙම ආකෘතීන් ගල් අඟුරු, ස්වභාවික වායු සහ තෙල් සම්බන්ධ යාවත්කාලීන මිල ගණන් සහ බාහිරතා (සමාජ හා පාරිසරික පිරිවැය) සම්බන්ධ පිරිවැයද සමගින් ගොඩ නගන ලෙසද, යෙදුම් දත්තද සමගින් ඉදිරිපත් කරන ලෙසද දැනුම් දෙන ලදී.

ඉදිරිපත් කරන ලද ලේඛනද සමගින්, බලශක්ති උත්පාදනයේ මූල්‍යමය හා ආර්ථික පිරිවැය සලකා බලමින් බලශක්ති ආරක්ෂාව සහතික කිරීමේ අරමුණින් 2017 ජූලි 20 දින සංශෝධනද සහිතව අවම පිරිවැය දිගු කාලීන විදුලි ජනන සැලැස්ම 2018-37 ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

ඒ අනුව, 2018-2037 කාල පරිච්ඡේදය සඳහා අපේක්ෂිත 5.0% බලශක්ති ඉල්ලුම් වර්ධනය සහ 4.5% උච්ච ඉල්ලුම් වර්ධනය සපුරාලනු පිණිස එළැඹෙන වසර 20ක කාලය තුළ රටේ දැනට ස්ථාපිත විදුලිබල ධාරිතාවය තුළට ප්‍රධාන ජල විදුලිය මෙගාවොට් 242ක්ද, කුඩා විදුලි බලාගාර උත්පාදන මෙගාවොට් 215ක්ද, සූර්ය බලශක්ති මෙගාවොට් 1,389ක්ද, සුළං බලශක්ති මෙගාවොට් 1,205ක්ද, ජෛව ස්කන්ධ මෙගාවොට් 85ක්ද, ද්‍රාව්‍ය ස්වභාවික වායු (LNG) බල ශක්තිය මෙගාවොට් 4,800ක්ද, උදුන් තෙල් පදනම්ගත බලශක්තිය මෙගාවොට් 320ක්ද, වායු ටර්බයින පදනම්ගත විදුලිබලය මෙගාවොට් 105ක්ද එක් කෙරෙනු ඇත. අනාගතයේදී විදුලි හිඟයක් ඇතිවීම වළකාලීමට හෝ අඩි මිලැති හදිසි විදුලි බලය ප්‍රසම්පාදනයට අනුමත කරන ලද සැලැස්ම ක්‍රියාත්මක කිරීම තීරණාත්මක වැදගත්කමකින් යුත්තේය යන්න 2017 වර්ෂයේදී කිහිප වතාවක් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් අවධාරණය කරන ලදී.

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද විදුලි බලාගාර ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වීමේ මූල්‍යමය බලපෑම් නමින් නිකුත් කළ වාර්තාව තුළ අවම පිරිවැය දිගු කාලීන විදුලි ජනන සැලැස්ම 2018-20 තුළ සපයා දී ඇති විදුලි බලාගාර සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන් මගින් දළ වශයෙන් රු. බිලියන 50.62ක පිරිවැයක් දැරීමට සිදුවනු ඇති බව නිශ්චිතව දක්වා ඇත. එබැවින්, රටේ බලශක්ති ආරක්ෂාව සහ ලං.වි.ම. හි මූල්‍ය ශක්‍යතාවය සහතික කරනු සඳහා විදුලිබල ජනන සැලැස්ම නිසි කලට ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය වේ.

# ඛනිජ තෙල්

ඛනිජ තෙල් නිෂ්පාදනයන් තුළට පැට්‍රල්, ඩීසල්, භූමිතෙල්, ගුවන්යානා ඉන්ධන, නාවික ඉන්ධන, උදුන් තෙල්, ද්‍රාව්‍ය ඛනිජ තෙල් වායු අන්තර්ගත වන අතර ඛනිජ තෙල් සම්පත් අතරට බොර තෙල්, ස්වභාවික වායු සහ ස්වභාවික, ද්‍රාව්‍ය, වායුමය, ඝන හෝ අර්ධ ඝන තත්ත්වයන්ගෙන් එන හයිඩ්‍රොකාබන් අයත් වේ.

ඛනිජ තෙල් කර්මාන්තයේ පසු අදියර නියාමන ආයතනය වශයෙන් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ යෝජිත නියාමන කාර්ය භාරය සැකසීමේදී, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් ප්‍රතිපත්තිමය හා නියාමන කරුණු පිළිබඳව ඛනිජ තෙල් හා ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය හා ඒ ආශ්‍රිත රජයේ නියෝජිතායතන වෙත උපදෙස් ලබා දෙමින් සහාය දක්වන අතරම පසු අදියර ඛනිජ තෙල් කර්මාන්ත කටයුතු නියාමනය කිරීමේ අපේක්ෂාවෙන් අවශ්‍ය නියාමන යාන්ත්‍රණයන් සකසා ඇත.

පසු අදියර ඛනිජ තෙල් කර්මාන්තය පහත සඳහන් කාර්යයන්ගෙන් සමන්විත වේ

- ඛනිජ තෙල් නිෂ්පාදන හෝ ඛනිජ තෙල් සම්පත් ආනයනය හා අපනයනය
- ඛනිජ තෙල් සම්පත් පිරිපහදුව හෝ මිශ්‍ර කිරීම හෝ ඛනිජ තෙල් නිෂ්පාදන නිපදවීම
- ඛනිජ තෙල් නිෂ්පාදන හෝ ඛනිජ තෙල් සම්පත් ගබඩා කිරීම, බෙදා හැරීම හා ප්‍රවාහනය
- ඛනිජ තෙල් නිෂ්පාදන තොග සහ සිල්ලර වෙළඳාම

**අයදුම්පත් සඳහා නීති සහ බලපත්, නිදහස්කරණයන් හා බලය ලබාදීම් සඳහා ආකෘති සකස් කිරීම**

අතුරු බලපත්, නිදහස්කරණයන් හා බලය ලබාදීම් සඳහා අවශ්‍ය ආකෘති හා නීති 2017 වර්ෂය තුළ කෙටුම්පත් කරන ලද අතර ඒ සඳහා වූ අයදුම්පත් නීති 2018 වර්ෂය තුළ කෙටුම්පත් කෙරෙනු ඇත.

**ස්වකීය පරිභෝජනය සඳහා ඛනිජ තෙල් නිෂ්පාදන ප්‍රවාහනය සහ ගබඩා කිරීම පිළිබඳ නීති සකස් කිරීම**

ආරක්ෂාව හා සෞඛ්‍ය සාධක සලකා බලමින් අවශ්‍ය සීමාවන් නියම කරමින් ස්වකීය පරිහරණය සඳහා වූ ඛනිජ තෙල් නිෂ්පාදන ප්‍රවාහනය හා ගබඩා කිරීම සඳහා අනුමැතිය ලබාදෙන නීති කෙටුම්පත් කරන ලදී.


සරුංගලයේ නූල අඩබල විදුලි රැහැනක
පැටලී දාහතර වියැති දරුවා මියයයි
Electrocuted by high tension line
A 54 - year - old man died after he was electrocuted when a branch of a tree he was chopping, fell on the electric line in Walasmulla on Sunday. W Chandrasena of Wijayasiripura, Walasmulla died in the incident.
විදුලි රැහැනට බිලි
විදුලි සර වැදී ලග්ගල හෝටලයක සේවකයකු මරුට
විදුලි උපකරණ පරීක්ෂා කරද්දී විදුලිය සැර වැදී නිවෙස් හිමියා මරුට
අනවසර විදුලි රැහැ
ස්පර්ශ කළ දරුව
විදුලිසැර වැදී මියය
සර විදුලි රැහැනක
ටලී තරුණයා මරුට
විදුලි සැර වැදී කතරගම තරුණයෙක් මරුට
Read 750 Times
Mawbima, 2016-02-19 14:28:00
විදුලි කාර්මිකයෙකු විදුලිසැර
Like Share 0
2016-06-05 11:05:00 Views : 263
කාත්තාන්කුඩි
පෙදිරේරුවෙක් ජීවිතක්ෂයට විදුලි සැර
වැදී
මාළු අල්ලන්න මෝටරයකින්
ඇළක වතුර ඉහිද්දී විදුලිසැර
වැදී දෙදරු පියා මියගිහින්

# මහජන දැනුවත් කිරීම්

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් 2017 වර්ෂය තුළ බලශක්තිය කාර්යක්ෂමව භාවිත කිරීම, සංරක්ෂණය, විදුලි කාර්මිකයන් සඳහා බලපත් ලබාදීම, විදුලි ආරක්ෂාව, පාරිභෝගික හිමිකම් හා වගකීම් සහ ලිහිසි ද්‍රව්‍ය නිෂ්පාදනයන්හි ආරක්ෂිත පරිහරණය පිළිබඳව මහජනතාව හා ප්‍රධාන පාර්ශවකරුවන් දැනුවත් කිරීම සඳහා වූ දැනුවත් කිරීමේ ව්‍යාපාර ගණනාවක් මෙහෙයවන ලදී.

**බලශක්ති කාර්යක්ෂමතාවය හා සංරක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන**

දිගු කාලීනව විදුලි ගාස්තු අවම කිරීම සඳහා අවශ්‍ය ප්‍රධාන කටයුත්තක් වශයෙන් බල ශක්ති සංරක්ෂණය හඳුනාගෙන ඇත. එනමුදු, ගෘහස්ථ හා කර්මාන්ත මට්ටමේදී බලශක්තිය සංරක්ෂණය කරන ආකාරය පිළිබඳ දැනුමක් නොපැවතීම බලශක්තිය සංරක්ෂණය කිරීමේදී ඉස්මතුවන ප්‍රධාන දුර්වලතාවයයි. දේශීය කර්මාන්තයන්හි බලශක්ති තීව්‍රතාවය අවම කිරීම ඉලක්ක කරමින්, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් 2017 වර්ෂය තුළ තෝරාගත් ඉහළ මට්ටමින් බලශක්තිය පරිභෝජනය කරන කර්මාන්ත සඳහා බලශක්ති කළමනාකරණ පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.

විදුලි හා තාප බලශක්ති පරිහරණය පිළිබඳව වූ මෙම වැඩසටහන මගින් ඉංජිනේරුවන් 200ක් පමණ පුහුණු කරන ලදී. පුහුණුව ලද ඉංජිනේරුවන් විසින් සිය සංවිධාන තුළ බලශක්ති කාර්යක්ෂමතා ප්‍රවර්ධන මූලාරම්භයන් ක්‍රියාත්මක කරනු ඇතැයි අපේක්ෂා කෙරිනි. එමගින් ඒ ඒ නිශ්චිත බලශක්ති පරිභෝජනයන් අවම කිරීම තුළ කර්මාන්තමය ඵලදායකත්වය හා තරගකාරීත්වය වැඩි දියුණු කිරීමටද අපේක්ෂා කෙරිනි.

මෙම වැඩසටහන යටතේ, සංවිධානමය බලශක්ති කළමනාකරණය, බලශක්ති කළමනාකරණයේ වටිනාකම, සංවිධානමය බලශක්ති කළමනාකරණය ස්ථිරව පවත්වාගෙන යාමේ ක්‍රමෝපායන්, විදුලි බලශක්ති කළමනාකරණ ප්‍රයත්නයන්, විදුලි බලශක්ති කළමනාකරණය - ධාවක, මෝටර, වායු සම්පීඩක, උණුසුම්කරණ, වාතාශ්‍රකරණ හා වායු සමීකරණ (HVAC) හා ආලෝකකරණ යන ක්ෂේත්‍ර ආවරණය කරන ලදී.

**විචල්‍ය පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍ර පිළිබඳ ගෘහස්ථ ධාරිතා වර්ධනය හා ඒවායේ ඒකාබද්ධකරණ අභියෝග හා විකල්ප**

විදුලි කර්මාන්තයේ නියාමන යාන්ත්‍රණය තවදුරටත් වැඩිදියුණු කරනු පිණිස පුනර්ජනනීය බලශක්තියෙහි පවත්නා ගැටළු, පිළියම් හා අනාගත ප්‍රවණතාවයන් පිළිබඳ දැනුම හුවමාරු කරගැනීමේ වැඩසටහනක් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් පවත්වන ලදී.

**විදුලි කාර්මිකයන් සහතිකකරණය සම්බන්ධ දැනුවත් කිරීමේ වැඩසටහන**

බලපත්ලාභීන්ද ඇතුළත්ව සමාජයේ සියළු මට්ටම් තුළ ජීවිත, දේපළ, උපකරණ හා උපාංග ආශ්‍රිත විදුලිමය ආරක්ෂාව වර්ධනය කරනු පිණිස ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් විදුලි කාර්මිකයන් සහතිකකරණය පිළිබඳ දැනුවත් කිරීමේ දීප ව්‍යාප්ත වැඩසටහනක් 2017 වර්ෂයේදී දියත් කරන ලදී.

2015 හා 2016 වර්ෂයන්හිදී ලබාගත් සංඛ්‍යා මගින් පෙන්නුම් කරන ලද්දේ රටතුළ විදුලි සැර වැදී මියයාම් 95ක් සහ 97ක් පමණ (පිළිවෙලින්) එම වර්ෂවලදී සිදුව ඇති බවයි. මෙය සංවර්ධිත රටවල් හා සන්සන්දනාත්මකව සලකා බලන කල ඉතා ඉහළ අගයකි.

තවද, පාරිභෝගිකයන්ගේ ආදායම් මට්ටම නිරූපණය කරන්නාවූ බලශක්ති පරිභෝජන මට්ටම නොසලකා, නිවාසයන්ගෙන් 90%ක් පමණක් අවශේෂ ධාරා පරිපථ කඩනයන්ගෙන් (RCDs) සමන්විතවන බව ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් 2015 වර්ෂයේදී පවත්වන ලද පුළුල් සමීක්ෂණයේදී හෙළිවිය. විදුලි සැර වැදී මියයාම්වලින් අති බහුතරයක් විදුලි කාර්මිකයන්ගේ ශිල්පීය නිපුණතාවයේ අඩුපාඩු හේතුකොට සිදු වී ඇති බවද නිරීක්ෂණය කරන ලදී.

රටතුළ විදුලි කාර්මිකයන් 20,000ක් පමණ සිටින අතර ඔවුන් අතුරින් අති බහුතරයක් ගෘහස්ථ විදුලි රැහැන් ඇදීම හෙවත් වයරින්කරණ කාර්යය සඳහා ප්‍රමාණවත් සුදුසුකම් සහිත වූවන් නොවේ. සහතිකකරණ ක්‍රියාවලිය වඩා හොඳින් හා ඵලදායී ලෙස ක්‍රියාත්මක කරනු පිණිස, රටේ බොහෝ ප්‍රදේශ ආවරණය කරමින් හා විදුලි කාර්මිකයන් 2,500 දෙනෙකු පමණ ආමන්ත්‍රණය කරමින්, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් 2017 වර්ෂය තුළ දැනුවත් කිරීමේ වැඩසටහන් 25ක් පවත්වන ලදී.

**විදුලි සැර වැදී මියයාමේ තත්ත්වය සමනය කිරීමේ වැඩසටහන**

දැනුවත් බවින් තොරවීම ශ්‍රී ලංකාවේ විදුලි සැර වැදී මිය යාමේ ගැටළු අතරින් ප්‍රධාන එකක් ලෙස හඳුනාගෙන ඇත. එබැවින්, 2020 වනවිට විදුලි සැර වැදී මියයාම් සංඛ්‍යාව 20ට අඩු අගයක් දක්වා පහත හෙළීමේ අරමුණින්, ශ්‍රී ලංකාවේ විදුලි ආරක්ෂාව සහතික කරනු පිණිස විදුලි බලය ප්‍රවේශම්කාරී ලෙස පරිහරණය පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම සඳහා වූ විදුලි සැර වැදී මියයාමේ තත්ත්වය සමනය කිරීමේ වැඩසටහනක් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් දියත් කරන ලදී.

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් පාලවි ගුවන් හමුදා මූලිකාංගයේ සහ කිරුලපන පොලිස් පුහුණු මධ්‍යස්ථානයේ සහ බලංගොඩ, හල්දුම්මුල්ල හා හපුතලේ පාසැල් 09ක දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.

තවද, ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 17ක් ආවරණය කරමින් නගර 90ක දින 90ක් පුරා 2017 ජනවාරි මාසයේ සිට අප්‍රේල් මාසය දක්වා ප්‍රබල මාධ්‍ය ව්‍යාපාරයක් හා දොරින් දොර දැනුවත් කිරීමේ ව්‍යාපාරයක්ද පවත්වන ලදී.

විදුලි ආරක්ෂක ක්‍රියාමාර්ග පිළිබඳව ජනතාව වෙත අධ්‍යාපනයක් ලබාදීමේ අරමුණින් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් තිරසර ලංකා - 2017 ප්‍රදර්ශනය හා ටෙක්නෝ-2017 ප්‍රදර්ශනය සඳහාද සිය සහභාගිත්වය ලබාදෙන ලදී.

තවද, මෙම විදුලි සැර වැදී මියයාමේ තත්ත්ව සමන ව්‍යාපාරයේ කොටසක් වශයෙන්, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් "විජය ළමා පුවත්පත" සහ "දෙමළ විජේ පුවත්පත" සමග පාසැල් ළමුන් සඳහා වූ පෝස්ටර තරගයක් හා රචනා තරගයක්ද, "විජය" (ළමා) පුවත්පත සහ "අද" පුවත්පත සමගින් එක්ව විවෘත කෙටි චිත්‍රපට තරගයක්ද පවත්වන ලද අතර, පාසැල් ළමුන් හා දෙමව්පියන්ගේ සහභාගිත්වය සහිතව විදුලි ආරක්ෂක දිනය 2017 සඳහා අනුග්‍රහය දක්වන ලදී. විදුලි බලය ආරක්ෂිතව භාවිතා කිරීමේ වැදගත්කම පිළිබඳ දැනුම සහභාගි වූවන් සමගින් බෙදා ගන්නා ලදී.

**ලිහිසි ද්‍රව්‍ය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන**

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව ලිහිසි ද්‍රව්‍ය අංශයෙහි ඡායා නියාමකවරයා වශයෙන් කටයුතු කරයි. 2017 වර්ෂයේදී, කර්මාන්තය සහ ලිහිසි තෙල් වෙළඳපල පිළිබඳ දැනුම නංවාලනු පිණිස පරදුකරුවන් සඳහා වූ දැනුවත් කිරීමේ වැඩසටහනක් හා වැඩ මුළුවක් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් පවත්වන ලදී.

# මහජන උපදේශන

කොමිෂන් සභාවේ තීරණයක් මගින් බලපෑමට ලක්වන හෝ ලක්විය හැකි යම් පුද්ගලයෙකු හෝ පුද්ගල කණ්ඩායමක් වෙතින්, කොමිෂන් සභාව විසින් සුදුසු යයි හඟින පරිදි, අදහස් විමසීමේ බලය 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනතේ 17(ආ) වගන්තිය මගින් කොමිෂන් සභාව වෙත පැවරේ.

එබැවින්, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ තීරණ ගැනීමේ කාර්යය සඳහා පහසුකම් සලසනු පිණිස සහ වඩාත් යහපත් සේවයක් එමගින් සලසාලීම පිණිස, බිම් මට්ටමේ ගැටළු හඳුනාගෙන ගැටළු ආමන්ත්‍රණය කිරීම සඳහා මෙවලම් සම්පාදනය හෝ දැනටමත් පවත්නා මෙවලම් සංශෝධනය කිරීම පිණිස 2017 වර්ෂය තුළ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් විවිධ විෂයයන් ඔස්සේ මහජන අදහස් විමසීම් ගණනාවක් පවත්වන ලදී.

### අවම පිරිවැය දිගු කාලීන බල උත්පාදන ව්‍යාප්ති සැලැස්ම පිළිබඳ මහජන අදහස් විමසීම

ලංකා විදුලිබල මණ්ඩලය විසින් අවම පිරිවැය දිගු කාලීන බල උත්පාදක ව්‍යාප්ති නිෂ්පාදනය සඳහා අවශ්‍ය මූලික දත්ත මූලය ලෙස භාවිත කරන "යෙදුම් දත්ත පරාමිතීන්" පිළිබඳව ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් සිය පළමු මහජන අදහස් විමසීම සිදුකරන ලදී. මහජන අදහස් විමසීම මගින් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙත ලිඛිත අදහස් දැක්වීම් 14ක් ලබාගන්නා ලදී.

"යෝජිත අවම පිරිවැය දිගු කාලීන බල උත්පාදක ව්‍යාප්ති සැලැස්ම 2018-36" සම්බන්ධ දෙවන මහජන අදහස් විමසීම 2017 ජූනි මාසයේදී පවත්වන ලදී. යෝජිත සැලැස්ම සඳහා ලිඛිත අදහස් දැක්වීම් 36ක් හා වාචික ඉදිරිපත් කිරීම් 15ක් ලැබිණි. ලද සියළු කරුණු ඉදිරිපත් කිරීම් අධ්‍යයනය කරන ලදුව, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් අවම පිරිවැය දිගු කාලීන බල උත්පාදක ව්‍යාප්ති සැලැස්ම සංශෝධනය කොට අනුමත කරන ලදී.

### ශ්‍රී ලංකාව තුළ වහළ මත සවි කරන සූර්ය බලශක්ති බලාගාර සංවර්ධනය කිරීම පිළිබඳ මහජන අදහස් විමසීම

2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනතේ 17(ආ) වගන්තිය සහ 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ අංක 3(ඕ) වගන්තිය ප්‍රකාර, "සූර්ය බල සංග්‍රාමය" මගින් සූර්ය බලශක්තිය ප්‍රවර්ධනය කිරීමේ රජයේ මූලාරම්භයට සහාය දක්වනු පිණිස ශ්‍රී ලංකාව තුළ වහළ මත සවි කරන සූර්ය බලශක්ති බලාගාර සංවර්ධනය පිළිබඳ මහජන අදහස් විමසීමක් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් පවත්වන ලදී. ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙත ලිඛිත අදහස් දැක්වීම් 32ක් ලද අතර වාචික අදහස් විමසීමේදී ඉදිරිපත් කිරීම් 30ක් සිදුකරන ලදී. අදහස් දැක්වීම් අතර ශ්‍රී ලංකාවේ සූර්ය බලශක්ති බලාගාර සංවර්ධනය කිරීමේ වර්තමාන ක්‍රියාවලීන් වැඩිදියුණු කිරීමේ නිර්දේශද ඇතුළත් විය. නියාමන මෙවලම් හඳුනාගනිමින් අවශ්‍ය මෙවලම් වැඩිදියුණු කරණු පිණිස කාර්මික කණ්ඩායමක්ද පත් කරන ලදී.

### ශ්‍රී ලංකාවේ විදුලි වාහන ආරෝපණ මධ්‍යස්ථාන (EVCS) පිළිබඳ මහජන අදහස් විමසීම

2017 දී, ශ්‍රී ලංකාවේ වාහන ආරෝපණ මධ්‍යස්ථාන නියාමනය සඳහා රජය විසින් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙත බලය පවරන ලදී. තවද, පරිහරණය කරන්නන් සම්බන්ධ ගාස්තු, බලපත් ලබාදීම් සඳහා සහ ආරක්ෂණ හා කාර්මික ප්‍රමිතීන් පැනවීමේද බලය ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙත ලබාදෙමින් විදුලි වාහන ආරෝපන ස්ථාන පිළිබඳ නියාමන මැදිහත්වීම් සඳහා අවකාශ සලසමින් ශ්‍රී ලංකා විදුලිබල පනතට සංශෝධන හඳුන්වා දීමටද අනුමැතිය ලබාදෙන ලදී.

ඒ අනුව, අලෙවි මනු නිරවද්‍යතාවය සහතික කිරීම, පරීක්ෂා කිරීම, නිරීක්ෂණය සඳහා තොරතුරු රැස් කිරීම සහ පාරිභෝගික පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීමේ ක්‍රියා පරිපාටිය විෂයයෙහි පවත්නා අඩුපාඩු නිරාකරණය කොට අවශ්‍ය ක්‍රියාමාර්ග හඳුන්වාදෙනු පිණිස අවශ්‍ය හඳුනා ගැනීම් කොට නව රෙගුලාසි නිකුත් කිරීම සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් මහජන අදහස් විමසීමක් සිදු කරන ලදී.

අ) ලං.වි.ම. හා ලංකා විදුලි පෞද්ගලික සමාගම වශයෙන් වූ ඒ ඒ බෙදාහැරීමේ බලපත්ලාභියාගේ මට්ටමින් විදුලි වාහන ආරෝපන ස්ථාන පිළිබඳ ලේඛනයක් සකස් කිරීම

ආ) විදුලි වාහන ආරෝපන ස්ථාන සඳහා චර්යා ධර්ම පද්ධතියක් නිකුත් කිරීම

ඇ) අවසන් පාරිභෝගික ගාස්තු තීරණය කිරීම

ඈ) විදුලි වාහන ආරෝපන ස්ථාන සඳහා ආරක්ෂණ හා වෙනත් තාක්ෂණික ප්‍රමිතීන් නිකුත් කිරීම සහ

ඉ) නිරීක්ෂණ අවශ්‍යතා සඳහා නිතිපතා තොරතුරු රැස් කිරීම

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙත ලිඛිත අදහස් දැක්වීම් 52ක් ලැබුණු අතර, වාචික අදහස් විමසීමේදී ඉදිරිපත් කිරීම් 22ක් සිදු කරන ලදී. නියාමන මෙවලම් හඳුනා ගනිමින් අවශ්‍ය කෙටුම්පත්කරණයන් සිදු කරනු පිණිස තාක්ෂණික කණ්ඩායමක් පත් කරන ලදී.

# වාර්තා හා අධ්‍යයනයන්

## බලශක්ති ආරක්ෂාව සම්බන්ධ මාසිකව යාවත්කාලීන කෙරෙන මධ්‍ය කාලීන වාර්තාව

ඉදිරි මාස තුනක කාල පරිච්ඡේදය තුළ විදුලි සැපයුමට අදාළව පැවතිය හැකි අවදානම් තත්ත්වයන් හඳුනාගනු පිණිස 2017 වර්ෂය තුළ ඒ ඒ මාසයේදී මෙම විග්‍රහය සිදු කරන ලදී. මෙම විග්‍රහය යටතේ, විභව්‍ය අවදානම් සහ සහන කාර්යයන් හඳුනාගනු පිණිස කොපමණ විදුලි බලාගාර පවත්නේද, පවත්නා ජලාශ සංඛ්‍යාව, තාප බලාගාර සඳහා පවත්නා ඉන්ධන ප්‍රමාණය සහ ඉල්ලුමේ විචල්‍යයන් යන සාධක සැලකිල්ලට ගන්නා ලදී.

2017 වර්ෂය තුළ මාසික වාර්තා 12ක් හා සතිපතා යාවත්කාලීන කිරීම් ගණනාවක්ද සකස් කරන ලද අතර, එම වාර්තාවලින් හඳුනාගත් කරුණු මත පදනම්ව, විදුලි සැපයුමට අදාළව හඳුනාගත් අවදානම් සමනය කරනු පිණිස කලින් කලට අදාළ අමාත්‍යාංශ හා ලං. වි. ම. වෙත නිර්දේශ යවන ලදී.

## බල උත්පාදක පිරිවැය ප්‍රමිතිකරනය පිළිබඳ අධ්‍යයනය

විදුලි බලාගාරයන්හි මෙහෙයුම් හා නඩත්තු (O & M) පිරිවැය විදුලිබල උත්පාදන පිරිවැයෙහි සැලකිය යුතු ප්‍රතිශතයක් ගනී. මෙහෙයුම් හා නඩත්තු පිරිවැය අවම කරනු පිණිස වූ යාන්ත්‍රණයක් වශයෙන් ප්‍රමිතිකරණය යොදාගත හැක. මෙහෙයුම් හා නඩත්තු පිරිවැය අවම වීමත් සමගින් එහි ප්‍රතිඵලයක් ලෙස අවසන් පාරිභෝගික ගාස්තු පහත වැටෙනු ඇත. මේ වන විට, කොමිෂන් සභාව ලං.වි.ම. හිමිකාරිත්වය දරන බල උත්පාදක යන්ත්‍ර පිරිවැය සත්‍යාපනය පිණිස පුද්ගලික අංශයෙන් විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් තුළ යොදාගෙන ඇති ගනුදෙනුමය වටිනාකම් මත රඳා පවත්නා අතර මෙම සංඛ්‍යාවන්හි කාර්යක්ෂමතාවය තහවුරු කිරීම ඉතා අපහසු කටයුත්තකි. එබැවින්, ඩිලොයිට් ටොවුච් ටොමැට්සු, ඉන්දියා (උපදේශක) ආයතනයේ සහාය සහිතව ඉහත කරුණ පිළිබඳව ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් අධ්‍යයනයක් සිදු කරන ලදී. උපදේශක ආයතනය විසින් ජාත්‍යන්තර ප්‍රමිතීන් හා සමගින් දැනට පවත්නා පිරිවැය පිළිබඳ විග්‍රහයක් ඇතුළත් අතුරු වාර්තාවක් ඉදිරිපත් කර ඇත. බල උත්පාදන, මෙහෙයුම් හා නඩත්තු පිරිවැය අවමකරන ක්‍රියාමාර්ග නිර්දේශ කරන්නාවූ අධ්‍යයන වාර්තාවක් 2018 මුල් භාගය වන විට සම්පූර්ණයෙන් සකස් කෙරෙනු ඇත.

## ලංවිම කෙටි කාලීන ණය පිළිබඳ අධ්‍යයනය

රු. බිලියන 200 ඉක්මවූ වාර්ෂික පිරිවැටුමක් සහිතව, 2016 රු. බිලියන 9.5ක් වූ ලං.වි.ම.හි කෙටි කාලීන ණය හා සම්බන්ධ මූල්‍ය පිරිවැය සැලකිය යුතු එකක් වේ. ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් ලං.වි.ම. හි වර්තමාන කෙටි කාලීන ණය තත්ත්වය පරීක්ෂා කරනු පිණිස මෙම අධ්‍යයනය සිදු කරන ලද අතර, ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ විකල්ප පිළිබඳ විමසිලිමත් වෙයි. ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් අවශ්‍ය තොරතුරු රැස් කරන ලදුව, වාර්තාව කෙටුම්පත් කොට අවසන් කරන ලදී. අවසන් වාර්තාව 2018 වර්ෂයේදී සම්පූර්ණ කෙරෙනු ඇත.

## අවසර දී ඇති අය කිරීම් තුළ භාවිත කෙරෙන සුචිකරණය පිළිබඳ අධ්‍යයනය

බලපත්ලාභීන්ගේ අනුමත ගාස්තු තුළ ඇතුළත් අමුද්‍රව්‍යවල මිල ගණන්හි අසාමාන්‍ය විචලනය පසුගිය වසර තුනේ සිට හතර දක්වා වූ කාලය තුළ පොදුවේ දක්නට ලැබුණු තත්ත්වයකි. ද්‍රව්‍ය මිල ගණන් බලපත්ලාභියාගේ ප්‍රසම්පාදන ක්‍රියාමාර්ග මගින් තීරණය කෙරෙන බැවින්, ස්වාධීන සත්‍යාපනයක් සිදුකිරීම දුෂ්කර වේ. එබැවින්, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් ජාත්‍යන්තර වෙළඳපලයන්හි අමුද්‍රව්‍ය මිල ගණන් මත පදනම්වූ සුචිකරණ ක්‍රමයක් ගොඩ නැගීම පිළිබඳව අධ්‍යයනයක් සිදු කරන ලදුව, සැබෑ මිල විචලනය පිළිබඳ දර්ශකයක් ලබාදිය හැකි අතර එමගින් බලපත්ලාභියාගේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළ පවත්නා අකාර්යක්ෂමතාවයන් හඳුනාගෙන බැහැර කිරීමට එය උපකාරී වනු ඇත. කෙටුම්පත් වාර්තාව අවසන් කොට එම කාර්යය 2018 වර්ෂය දක්වා ඉදිරියට ගෙන එන ලදී.

## පාරිභෝගික හිමිකම් හා වගකීම් පිළිබද ප්‍රකාශනයේ පැවැත්ම හා ලබාගත හැකි බව පිළිබඳ වාර්තාව

යටිතල පහසුකම් නියාමන ආයතනයක් වශයෙන්, කොමිෂන් සභාවේ ප්‍රධාන අරමුණුවලින් එකක් වනුයේ අනාගත පාරිභෝගිකයන්ද ඇතුළත්ව පාරිභෝගික අභිලාශයන් ආරක්ෂා කිරීමයි. ඒ අනුව, පාරිභෝගිකයන් වෙත ඔවුන්ගේ හිමිකම් හා වගකීම් පිළිබඳ අධ්‍යාපනයක් ලබාදීම මගින් පාරිභෝගික අභිලාශයන් ආරක්ෂා කිරීමේ පියවර ගණනාවක් කොමිෂන් සභාව විසින් ගෙන ඇත. විදුලි පාරිභෝගිකයන්ගේ හිමිකම් හා වගකීම් ප්‍රකාශනය (ප්‍රකාශනය) පළ කිරීම එකී පියවරයන් අතරින් එකකි. ප්‍රකාශනය පළ කිරීමත් සමග, සිය හිමිකම් හා වගකීම් පිළිබඳව පාරිභෝගිකයන් වෙත අධ්‍යාපනයක් ලබාදීම සඳහා දිවයිනේ සෑම ග්‍රාම නිලධාරී කාර්යාලයක්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් හා දිසා ලේකම් කාර්යාලයක් වෙතම ප්‍රකාශනයේ පිටපත් බෙදාහැරීම ඇතුළත් වන්නාවූ දැනුවත් කිරීමේ ව්‍යාපාර කටයුතු ගණනාවක් කොමිෂන් සභාව විසින් සිදු කරන ලදී. 2017 වර්ෂයේදී, මෙම ප්‍රකාශනයේ පැවැත්ම හා එය ලබාගත හැකි බව පිළිබඳ තත්ත්වය නිරීක්ෂණය කිරීම සඳහා කොමිෂන් සභාව විසින් සමීක්ෂණයක් පවත්වන ලදී.

ඒ අනුව, පාරිභෝගිකයන් වෙතින් දත්ත රැස් කරනු පිණිස ප්‍රශ්නාවලි 511ක එකතුවක් බෙදා හරින ලද අතර එසේ බෙදා හරින ලද ප්‍රශ්නාවලි සඳහා පාරිභෝගිකයන් විසින් ප්‍රතිචාර 185ක් දක්වන ලදී. සිය හිමිකම් හා වගකීම් පිළිබඳ විදුලි පාරිභෝගිකයන්ගේ දැනුම, ප්‍රකාශනයේ ලබාගත හැකියා මට්ටම සහ විදුලිය ආශ්‍රිත ගැටළු නිරාකරණයෙහි ලා ප්‍රකාශනයේ ප්‍රයෝජනවත් බව පිළිබඳ දැනුම තක්සේරු කිරීම ප්‍රශ්නාවලියේ ප්‍රධාන අරමුණ විය. සමීක්ෂණයට අනුව, තමා සතු හිමිකම් මෙන්ම වගකීම් ප්‍රමාණයක්ද පවත්නේය යන්න පිළිබඳ විදුලි පාරිභෝගිකයන් අතරින් බහුතරයක් දැනුවත්ය යන්න අනාවරණය විය. කෙසේ වුවද, පාරිභෝගික අයිතීන් හා වගකීම් පිළිබඳ ප්‍රකාශනයක් කොමිෂන් සභාව විසින් පළ කොට ඇති බව පාරිභෝගිකයන් අතරින් සැලකිය යුතු ප්‍රතිශතයක් මේ දක්වාද නොදනිති. තවද, හිමිකම් හා වගකීම් පිළිබඳ අවබෝධයේ මට්ටමද තරමක් අප්‍රමාණවත් එකකි. එබැවින්, පාරිභෝගික හිමිකම් හා වගකීම් පිළිබද අඛණ්ඩ දැනුවත් කිරීමේ ව්‍යාපාර ක්‍රියාත්මක කිරීම අවශ්‍ය කෙරේ. තවද, විදුලි බලය ආශ්‍රිත හිමිකම් හා වගකීම් සම්බන්ධයෙන් දැනුවත් පාරිභෝගිකයන් බහුතරය විසින් තමා හට ගැටළුව නිරාකරණය කරගැනීමට හිමිකම් හා වගකීම් ප්‍රකාශනය උපකාරී වූ බව ප්‍රකාශ කොට තිබිණි.

# ආයතනික සන්නිවේදන

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ තීරණ ගැනීමේ ක්‍රියාවලිය වෙත සහාය දක්වනු පිණිස හා විදුලි බලය ආරක්ෂාකාරීව පරිහරණය හා තත්ත්ව ප්‍රමිතීන් හා සේවා ප්‍රමිතීන් පිළිබඳව මහජනතාව හා බලපත්ලාභීන් දැනුවත් කිරීම සඳහා සිය අභ්‍යන්තර හා බාහිර පරදුකරුවන් වෙත තොරතුරු බෙදා හැරීමේ මධ්‍යස්ථානයක් වශයෙන් 2017 වර්ෂය තුළ ආයතනික සන්නිවේදන අංශය (CCD) විසින් සිය කාර්ය භාරය සවිමත් කර ඇත.

### බාහිර සන්නිවේදනය

තොරතුරු හා තාක්ෂණ අංශයේ සහාය සහිතව ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා වෙබ් අඩවිය නවීකරණය කිරීමේ කාර්යය ආයතනික සන්නිවේදන අංශය විසින් ආරම්භ කරන ලදී. ඕනෑම පාර්ශ්වයකට පහසුවෙන් තොරතුරු ලබාගත හැකි නවීන අංගවලින් යුත් වෙබ් අඩවියක් නිර්මාණය කිරීමේ ඉලක්කය වසර තුළ අංශයට මූලික අභියෝගයක් එල්ල කළ කරුණක් විය. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන් ක්‍රියාත්මක වන වෙබ් අඩවිය 2018 වර්ෂය තුළ ආරම්භ කිරීමට නියමිතය. 2017 වර්ෂයේ තොරතුරු ප්‍රචාරණයේ ප්‍රධාන ප්‍රවේශ මාර්ගය වශයෙන් පවත්නා වෙබ් අඩවිය භාවිත කෙරේ.

පුවත්පත් නිවේදන, පුවත්පත් දැන්වීම් හා විද්‍යුත්, මුද්‍රිත හා සමාජ මාධ්‍ය සමග පැවැත්වූ සම්මුඛ සාකච්ඡා 2017 වර්ෂය තුළ තොරතුරු ප්‍රචාරණය සඳහා භාවිත කරන ලදී.

මෙයට අමතරව, මෙම අංශය විසින් ශ්‍රී ලංකාවේ විදුලි වාහන ආරෝපණ මධ්‍යස්ථාන හා සූර්ය බලාගාර සංවර්ධනය පිළිබඳ මහජන අදහස් විමසීම් දෙකක් හා නියාමන කාර්යාවලියේදී මහජන සහභාගිත්වය වර්ධනය කරනු පිණිස බලශක්ති ආරක්ෂණ ගැටළු ආමන්ත්‍රණය කළ විදුලි, ජල සේවා අංශ හා ඛනිජ තෙල් අංශයේ හා බලශක්ති සංසද සහභාගිත්වයෙන් පාරිභෝගික හිමිකම් දිනයද පවත්වන ලදී. මෙම මහජන හමු තුළින් ප්‍රභවය ලද ප්‍රතිපත්ති හා රෙගුලාසි 2018 වර්ෂය තුළ හඳුන්වා දීමට නියමිතය.

### බල ශක්ති සංසදය 2017- ජාතික බලශක්තිකරණය: බලශක්ති ආරක්ෂාව සඳහා වූ රාමුව

බල ශක්ති ආරක්ෂාව වූකලි ජාතික හා ලොව පුරා පැතිරී ගිය ජාත්‍යන්තර බලශක්ති ක්‍රමෝපායන් පිළිබඳ අත්තිවාරම වේ. තවද, වර්ධනය වෙමින් පවත්නා ආර්ථික අන්තර් සම්බන්ධතා හා ඒකාබද්ධතාවයන්ගෙන් යුත් ලෝකයක, බලශක්ති ආරක්ෂාවෙන් තොරව කිසිදු ව්‍යාපාරයක් විසින් හෝ ආයෝජන අවස්ථාවක් ලබා නොගනු ඇත.

පසුගිය දශකයක කාලය තුළ ශ්‍රී ලංකාවේ බලශක්ති ඉල්ලුම 5-10% වේගයකින් වර්ධනය වූ අතර, රජයේ අපේක්ෂිත සංවර්ධන වැඩසටහන්ද සමගින් අනාගත වර්ධන අනුපාතය මෙයට සමාන හෝ වඩාත් ඉහළ එකක් වීමටද ඉඩ ඇත. එබැවින්, සාමාන්‍ය පරිදිම, (විශේෂයෙන් විදුලිබල අංශයේ) වඩාත් විචක්ෂණශීලී බලශක්ති මුහුව සහ ඒ ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධන අභියෝග හෙවත් වර්ධනය වෙමින් පවත්නා ඉල්ලුම සපුරාලීම පිණිස අවශ්‍ය යටිතල පහසුකම් ගොඩ නංවනුයේ කවදාද, කොහේදීද සහ කවුරුන් විසින්ද යන ගැටළුවට බලශක්ති අංශය මුහුණ දී ඇත.

ප්‍රතිපත්ති මගින් හුදෙක් ඒ විසින්ම කිසිදු පරිවර්තනයක් සිදු කරනු නොලබයි. විපර්යාසයක් සිදුකරන්නාවූ ප්‍රමාණාත්මක හා දැනෙන සුළුවූ ප්‍රතිඵල අත්පත් කරගත හැකිවනුයේ එසේ කෙටුම්පත් කෙරෙන්නාවූ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග බවට ඵලදායී හා කාර්යක්ෂම ලෙස පරිවර්තනය කිරීම මගිනි.

පොදු යටිතල පහසුකම් කළමනාකරණය කරන්නාවූ ප්‍රතිපත්ති සම්පාදනය, සංවර්ධනය හා නිර්මාණය බොහෝ අභියෝගාත්මක කාර්යයක් වේ.

එවන් අභියෝග ඉතා අවංක ආකාරයෙන් හඳුනා ගනිමින් ප්‍රතිපත්ති සම්පාදනය කරනු ලබන අවස්ථාවේදීම අදාළ සමන ක්‍රියාමාර්ග ගන්නේ නම් විනා, සිදු කරනු ලබන ආයෝජනයේ ප්‍රතිඵලය ඉතා යහපත් මට්ටමේ නම් ප්‍රශස්ත මට්ටමේ නොපවතිනු ඇති අතර, ඉතාමත් අයහපත් එකක් නම් සෘණාත්මක වනු ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස හානිකර පාරිසරික හා සමාජමය ප්‍රතිවිපාකද ඇතිවිය හැක.

බලශක්ති ආරක්ෂණ ප්‍රතිපත්තියක් ගොඩ නගමින් ඒ පිළිබඳ රජයට උපදෙස් දෙනු පිණිස ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් බලශක්ති සංසදය - 2017 පවත්වන ලදී. බලශක්ති ආරක්ෂාව - භූගෝලීය ගැටළුව/ භූ දේශපාලනික ගැටළුව/ පිළිගත හැකි බව/ දැරිය හැකි බව/ ප්‍රවේශ විය හැකි බව/ ලබාගත හැකි බව, බලශක්ති ආරක්ෂක යටිතල පහසුකම් - වර්තමානය හා අනාගතය, නියාමකවරයෙකුගේ අවදානම්, බලපත්ලාභියා, ක්‍රියාත්මක කිරීමේ ගුණාත්මකභාවයට බලපෑ හැකි බොරු වලවල් හා බාධක හඳුනා ගැනීම, ප්‍රතිපත්ති සම්පාදකයන් සඳහා අන්තර් ඥානයන් සම්පාදනය, බලශක්ති ආරක්ෂාව සහතික කිරීමේ වඩාත්ම යහපත් ප්‍රතිකර්ම කවරේද, ආයෝජන අවස්ථා හඳුනා ගැනීම, ශ්‍රී ලංකාව සඳහා ප්‍රමුඛ ගෝලීය හා කළාපීය ව්‍යාපාර හඳුනා ගැනීම/ අභියෝග යන මාතෘකා මෙම සංසදය තුළ ආමන්ත්‍රණය කෙරිනි. ප්‍රතිපත්ති උපදේශනයට අදාළ පළමු කෙටුම්පත 2017 වර්ෂයේදී ගොඩ නංවන ලදී.

### තොරතුරු දැනගැනීමේ හිමිකම සම්බන්ධ පහසුකම්

2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත 2017 පෙබරවාරි මස 03වන දින සිට බලාත්මක විය. ආයතනික සන්නිවේදන අංශය විසින් තොරතුරු දැනගැනීමේ හිමිකම් පිළිබඳ පනත මගින් විවිධ පරදුකරුවන් වෙත අවශ්‍ය තොරතුරු ලබාදීමේ පහසුකම නොකඩවා සම්පාදනය කරයි. 2017 වර්ෂය තුළ තොරතුරු ඉල්ලීම් 15ක් ලැබුණු අතර, එම වසර තුළම සියළු ඉල්ලීම් සපුරාලන ලදී. තොරතුරු දැනගැනීමේ හිමිකම් පිළිබඳ සාරාංශ වාර්තාව කෙටුම්පත් කරන ලදුව, එළැඹෙන වසර තුළ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කෙරෙනු ඇත.

**සටහන 06 - වසර තුළ කරන ලද තොරතුරු ඉල්ලීම් පිළිබඳ විස්තර**

| අංකය | තොරතුරු ඉල්ලීම් | එකතුව |
|---|---|---|
| 01 | 2017 වර්ෂය සඳහා ලද තොරතුරු ඉල්ලීම් සංඛ්‍යාව | 15 |
| 02 | තොරතුරු සම්පූර්ණයෙන් ලබාදී ඇති ඉල්ලීම් සංඛ්‍යාව | 13 |
| 03 | තොරතුරු පාර්ශ්වීය වශයෙන් ලබාදී ඇති ඉල්ලීම් සංඛ්‍යාව (තොරතුරු නොපැවතීම හේතුවෙන්) | 02 |
| 04 | පනතේ 5 වගන්තිය ප්‍රකාර ප්‍රතික්ෂේප කරන ලද හෝ බැහැර කරන ලද තොරතුරු ඉල්ලීම් සංඛ්‍යාව | - |
| 05 | පනතේ 5 වගන්තිය තුළ අන්තර්ගත නොවූ වෙනත් හේතු මත ප්‍රතික්ෂේප කරන ලද තොරතුරු ඉල්ලීම් සංඛ්‍යාව | 01 |
| 06 | තොරතුරු ඉල්ලීමකට ප්‍රතිචාර දැක්වීමට ගනු ලබන සාමාන්‍ය කාලය(වැඩ කරන දින ගණන) කොපමණද? | 10 |
| 07 | තැපෑලෙන් ලද තොරතුරු ඉල්ලීම් ගණන කොපමණද? | 09 |
| 08 | විද්‍යුත් තැපැල් මගින් ලද තොරතුරු ඉල්ලීම් ගණන කොපමණද? | 06 |
| 09 | තැපෑලෙන් හෝ විද්‍යුත් තැපැල් මගින් හැර අන් ආකාරයන්ගෙන් ලද තොරතුරු ඉල්ලීම් ගණන කොපමණද? | - |

# මානව සම්පත් හා පරිපාලනය

ශ්‍රී ලාංකීය ජාතිය වෙත නොඇදහිය හැකි සේවයක් සම්පාදනය කිරීමෙහි ලා ජනතාවගේ වෘත්තීය හා පෞද්ගලික කුසලතාවයන්හි ඉහළම ප්‍රමිතිය අත්පත් කරදීම ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ ඉලක්කයයි. එකී අභිමතාර්ථය උපරිම අයුරින් සාධනයෙහි ලා මානව සම්පත් හා පාලන අංශය නොකඩවා සිය ප්‍රයත්නයන් වැඩිදියුණු කරමින් සිටී. අප විසින් රටෙහි සමස්ත උපයෝගිතා අංශය නියාමනය කිරීමෙහි ලා යොදනු ලබන සෑම ප්‍රයත්නයක්ම සාර්ථක කරගැනීම සහතික කරනු සඳහා වඩාත්ම යෝග්‍ය කුසලතාවයන් ආකර්ශනය, සංවර්ධනය හා පවත්වාගෙන යාම මෙහිලා තීරණාත්මක කාර්ය භාරයක් ඉටු කරනු ලබයි. අවසන් විග්‍රහයේදී, අපි අපගේ ජනතාවගේ ප්‍රවීනත්වය හා ඔවුන්ගේ සාර්ථකත්ව ප්‍රයත්නයන් කෙරෙහි විශ්වාසය තබන්නෙමු. ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් 2017 වර්ෂයේදී සිය ඉගෙනුම් ක්‍රමෝපාය වඩාත් වැඩිදියුණු හා තියුණු බවට පත් කරන ලදී.


නිවැරදි ඉගෙනුම නිවැරදි ජනතාව වෙත ලබාදීම පූර්වාදර්ශය වූ අතර, පුහුණු ප්‍රතිඵල ඒ ඒ ප්‍රතිඵලය හා ඒකාබද්ධ කිරීම පිළිබඳ විමසා බලමින් වඩාත් අවශ්‍ය සේවකයන් වෙත ඉතා මනාකොට තෝරාගත් දේශීය හා විදේශීය පුහුණු අවස්ථා පිරිනමමින් පුළුල් පුහුණු සැලැස්මක් ක්‍රියාත්මක කළෙමු.

අපගේ අභ්‍යන්තර සේවකයන් සංවර්ධනය කිරීම කරා පමණක් සීමා නොවෙමින්, සමාජ වගකීමේ කොටසක් වශයෙන් ආයතනික පරිසරය හා හුරු වනු පිණිස අවශ්‍ය පුහුණු අවස්ථා සම්පාදනය සඳහා විශ්වවිද්‍යාල හා ආයතන සමගද එක්ව කටයුතු කරන්නෙමු.


එයට අමතරව, අපගේ ජනතාවගේ යහපත උදෙසා පහත ක්ෂේත්‍ර ආවරණය වන පරිදි 2017 වාර්ෂික කාර්ය සැලැස්ම යටතේද කාර්යයන් ගණනාවක් සිදු කළෙමු.

- සේවක කාර්ය සාධන කළමනාකරණය
- ධාරිතා වර්ධනය හා පුහුණුව
- අනුගාමිකත්ව සැලසුම්කරණය
- ත්‍යාග පිරිනැමීම හා පිළිගැනීම
- ඵලදායකත්වය නංවාලීම
- සේවක කාර්ය නියුක්තිය හා සුභ සාධනය
- සේවායෝජක සන්නාමකරණය

**කාර්ය මණ්ඩල සංයුතිය - ශ්‍රේණි අනුව**




**සේවක සංයුතිය - ස්ත්‍රී පුරුෂභාවය අනුව**




**2017/12/31 දිනට කාර්ය මණ්ඩල සංයුතිය**

| තනතුර | අනුමත සේවක සංඛ්‍යාව | දැනට සිටින සේවක සංඛ්‍යාව | |
|---|---|---|---|
| | | ස්ථිර | කොන්ත්‍රාත් |
| අධ්‍යක්ෂ ජනරාල් | 1 | 1 | - |
| කොමිෂන් සභාවේ ලේකම් | 1 | 1 | - |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් | 1 | 1 | - |
| අධ්‍යක්ෂ | 11 | 8 | 2 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ | 6 | 3 | 2 |
| අභ්‍යන්තර විගණක | 1 | - | 1 |
| සහකාර අධ්‍යක්ෂ | 16 | 14 | - |
| කළමනාකරණ සහකාර | 10 | 6 | - |
| රියැදුරු / කාර්යාල කාරය සහායක | 4 | 2 | 2 |
| | 51 | 36 | 7 |

# තොරතුරු තාක්ෂණ හා කළමනාකරණ තොරතුරු පද්ධතිය

ආයතනික අභිමතාර්ථ සමගින් අනුගත වෙමින් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ අංකිත විපර්යාස ක්‍රමෝපාය විසින් සංවිධානය උදෙසා වූ වැදගත් ප්‍රධාන නිමැවුම් කෙරෙහි අවධානය යොමු කොට ඇත. ව්‍යාපාර යෙදවුම් ආශ්‍රිතව වර්ෂය තුළ කාර්යාල ස්වයංක්‍රීයකරණය, යටිතල පහසුකම් සහ මෘදුකාංග සංවර්ධනය අංශයන්ගෙන් වැදගත් කාර්ය සම්භාරයක් අවසන් කොට ඇත. ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ අංකිතකරණය බහු පාර්ශ්වීය එකක් වන අතර එතුළ කාර්ය මණ්ඩලය විද්‍යුත්මය වශයෙන් බලගැන්වීම, වඩා ඉහළ ගුණාත්මකභාවයෙන් යුත් පාරිභෝගික සේවාවක් ලබාදීම සඳහා අවකාශ සලසමින් පරදුකරු අන්තර් ක්‍රියාකාරිත්ව ලක්ෂ්‍ය ව්‍යාප්ත කිරීම කළමනාකරණය කිරීම සඳහා පරිගණක තාක්ෂණය භාවිත කිරීම අන්තර්ගත වේ.

බලපත්‍රලාභියාගේ මෙහෙයුම් කටයුතු මෙන්ම ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව තුළ මෙහෙයුම් දත්ත සම්බන්ධයෙන්ද සවිස්තරාත්මක තොරතුරු මෙන්ම සාරාංශගත තොරතුරු කෙරෙහිද පහසු ප්‍රවේශ මාර්ග සම්පාදනය කරන අතර ව්‍යාපාරික යෙදවුම් සංවර්ධනය විවිධ පද්ධති හරහා කාර්යක්ෂම ලෙස වර්ධනය වී ඇත. දත්ත මධ්‍යගතකරණය මගින් තොරතුරු කළමනාකරණය වූකලී ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ ව්‍යාපාර යෙදවුම් සංවර්ධන ව්‍යාපෘතියේ තවත් වැදගත් පාර්ශ්වයකි.

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ කාර්යාල ස්වයංක්‍රීයකරණ ක්‍රමෝපාය විසින් කාර්ය මණ්ඩලය වෙත එකිනෙකා සම්බන්ධවන පරිගණකගත ක්‍රියාවලීන් සම්පාදනයෙහි අවකාශ සලසා ඇත. මෙහි එක් පාර්ශ්වයක් වශයෙන් නවීන වළාකුළු තාක්ෂණ පදනම්ගත කාර්යාල නිෂ්පාදන පෙළක් ඉදිරිපත් කෙරෙනු ඇත. තොරතුරු තාක්ෂණ දැනුම නංවාලීම පිණිස කාර්ය මණ්ඩල පුහුණුව මගින් කුසලතා වර්ධනයද ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව පරිගණකගත කිරීමේ වැදගත් පැතිකඩක් වන අතර, මෙකී කාර්ය පරිපාටීන් තුළ ව්‍යාපාර මෙහෙයුම් මෙන්ම පාරිභෝගික සේවා ආශ්‍රිත කටයුතුද ආවරණය කෙරේ. මෙයට අමතරව, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ සංවිධානමය සංස්කෘතිය තුළට ව්‍යාපාරික සමාජ මාධ්‍ය හඳුන්වා දීමටද සැලසුම් කර ඇත.

ව්‍යාපාරික යෙදවුම් මෙන්ම ව්‍යාපාරික ක්‍රියාවලි ස්වයංක්‍රීයකරණය ආශ්‍රිත මනා ක්‍රියාකාරිත්වය අඛණ්ඩ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම මත රඳා පවතී. මෙම සංවර්ධන කාර්යයන් තුළට සහාය පද්ධති වර්ධනය සහ කාර්යක්ෂම පද්ධති පිළිසකර කිරීම් සඳහා අවකාශ ලබාදීමද ඇතුළත් වේ.

තවද, ව්‍යාපාරික අඛණ්ඩතා සැලසුම්කරණයට අමතරව, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ අංකිතකරණ කටයුතු තුළ තොරතුරු තාක්ෂණ ආරක්ෂණය හා නම්‍යශීලිත්වය බලගැන්වීමද සිදු කෙරේ. ආපදා ප්‍රතිසාධනය, තොරතුරු තාක්ෂණ ආරක්ෂණ පරීක්ෂණය, අදාළ ආරක්ෂණ ක්‍රියාමාර්ග යෙදවීමද අවධාරණය කොට ඇත. කාර්යක්ෂම ආපදා ප්‍රතිසාධන යාන්ත්‍රණයක් ස්ථානගත කිරීම මෙන්ම හානි හැකියා තක්සේරු සහ විනිවිදුම් පරීක්ෂණ සිදුකිරීමද ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා අංකිතකරණයේ කොටසක්ව ඇත.

# ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ 2018 වසර සඳහා වූ සැලැස්ම



දිගු කාලීන අභිමතාර්ථ සාධනය පිණිස වූ දර්ශක වශයෙන් කොමිෂන් සභාව විසින් හඳුනාගෙන ඇති ප්‍රධාන පෙළඹුම් ප්‍රදේශ හතරක් ඉලක්ක කරගනිමින් පුළුල් පරාසයක විහිදෙන කාර්ය පෙළක් අන්තර්ගත "කාර්ය සැලැස්ම 2018" වෙනුවෙන් ඉදිරිපත් කෙරේ. සිය අරමුණු ප්‍රකාර නිශ්චිත ප්‍රතිඵල හා නිමැවුම් සම්පාදනය පිණිස පහළ සිට ඉහළට විහිදෙන ප්‍රවේශයක් මගින් 2018 වර්ෂය සඳහා වූ කාර්යයන් කෙටුම්පත් කර ඇත.

2018 වර්ෂය සඳහා වූ කාර්යයන් මිල, ගුණාත්මකභාවය, ආරක්ෂාව හා පරිසරය යන පෙළඹුම් ක්ෂේත්‍ර හතරක් යටතේ හඳුනා ගන්නා ලදී.

ඉලක්කගත වර්ෂය දක්වා වාර්ෂික පදනමකින් සිදුකළ යුතු කාර්යයන් 98කින් සැලැස්ම සමන්විත වේ.

වාර්ෂික කාර්ය සැලැස්ම සකසනු පිණිස සෑම වසරකදීම අභිමතාර්ථයට අදාළව දැනට පවත්නා තත්ත්වය හා අපේක්ෂිත තත්ත්වය අතර අන්තරය තක්සේරු කෙරේ. මෙම අන්තරය පටු කරනු පිණිස ක්‍රමෝපායන් හඳුනා ගැනීම කාර්ය සැලැස්ම සැකසීමෙහි ලා ප්‍රධාන අවශ්‍යතාවය වශයෙන් සැලකේ.

ඒ අනුව, ක්‍රමානුකූලව අභිමතාර්ථයෙහි වර්තමාන තත්ත්වයේ සිට අපේක්ෂිත තත්ත්වය දක්වා ගමන් කිරීමේ අදහසින මේ ක්‍රියාකාරකම් හඳුනාගෙන ඇත.

වර්තමාන තත්ත්වය සහ යොමුගත අභිමතාර්ථය සාක්ෂාත් කරගැනීමෙහි ලා පවත්නා හේතු/ ගැටළු/ බාධක විග්‍රහ කිරීම සමගින් ක්‍රමෝපායන් හා ක්‍රියාකාරකම් සකස් කර ඇත. ඇතැම් කටයුතු එක් වසරකට වැඩි කාල පරිච්ඡේදයක් පුරා විහිදෙන අතර ඇතැම් කටයුතු වසර ගණනාවක් පුරා නැවත නැවතත් සිදුකළ යුතු වේ.

ඒ ඒ කාර්යය සම්බන්ධ ක්‍රියාත්මක සැලැස්ම ව්‍යාපෘති කළමනාකරු විසින් සකසා ඇත. ඒ ඒ ප්‍රධාන/උප කාර්යයන්හි වගකීම් ව්‍යාපෘතියේ කණ්ඩායම් සාමාජිකයන් අතර පවරා දී ඇත.

ඒ ඒ අංශය සඳහා වෙන්කර ඇති කාර්යයන් පහත හඳුනාගනු ලැබේ.

| පාරිභෝගික කටයුතු අංශය | | | |
|---|---|---|---|
| | යොමුව | කාර්යයන් - 2018 | ප්‍රතිඵල |
| 01 | AP18/COA/01 | පාරිභෝගික සේවා ක්‍රියාවලි පිළිබඳ උපමාන | සේවා (වාණිජ) ගුණාත්මකභාවය සම්බන්ධ නෛතික අවශ්‍යතාවනට වැඩියෙන් අනුගත වීම |
| 02 | AP18/COA/02 | වාණිජ ගුණාත්මකභාවයට අදාළ විදුලිය බෙදාහැරීමේ කාර්ය සාධනය පදනම්ගත ප්‍රමිති රෙගුලාසි අනුගතකරණ අදියර ක්‍රියාත්මක කිරීම | සේවා (වාණිජ) ගුණාත්මකභාවය සම්බන්ධ නෛතික අවශ්‍යතාවනට වැඩියෙන් අනුගත වීම |
| 03 | AP18/COA/03 | එදිනෙදා කටයුතු ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් CRO ප්‍රකාශනය හා අනුගතව පාරිභෝගික පැමිණිලි සඳහා පහසුකම් සැලසීම | සේවා (වාණිජ) ගුණාත්මකභාවය සම්බන්ධ නෛතික අවශ්‍යතාවනට වැඩියෙන් අනුගත වීම |
| 04 | AP18/COA/04 | බලපත්‍රලාභීන් විසින් සංශෝධිත සැපයුම් සේවා කේත ලබාගැනීම | සේවා (වාණිජ) ගුණාත්මකභාවය සම්බන්ධ නෛතික අවශ්‍යතාවනට වැඩියෙන් අනුගත වීම |
| 05 | AP18/COA/05 | එදිනෙදා කටයුතු - ආරවුල් නිරාකරණ නීති ප්‍රකාර ආරවුල් නිරාකරණය | සේවා (වාණිජ) ගුණාත්මකභාවය සම්බන්ධ නෛතික අවශ්‍යතාවනට වැඩියෙන් අනුගත වීම |

| | යොමුව | කාර්යයන් -2018 | ප්‍රතිඵල |
|---|---|---|---|
| 06 | AP18/COA/06 | ජාතික පාරිභෝගික ජාලය ස්ථාපනය | හිමිකම් හා වගකීම් සම්බන්ධයෙන් විදුලි පාරිභෝගිකයන් වඩ වඩාත් බලගැන්වීම |
| 07 | AP18/COA/07 | ඛනිජතෙල් කර්මාන්තයේ ආරවුල් නිරාකරණ නීති | සේවා සම්පාදකයන්, පාරිභෝගිකයන් හා සෙසු බලපෑමට ලක්වූ පාර්ශ්වයන් අතර ඉස්මතුවන ආරවුල් නිරාකරණය |
| 08 | AP18/COA/08 | ජල සේවා කර්මාන්තය නියාමනය | ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය නියාමනය (ආර්ථික හා කාර්මික නියාමනය) |
| 09 | AP18/COA/09 | පානීය ජල හා මළාපවහනය සම්බන්ධ ජාතික ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් උපදෙස් ලබාදීම | ජාතික ප්‍රතිපත්තියක් මගින් පානීය ජල හා මලාපවහන විෂයයෙහිආරක්ෂිත හා ගුණාත්මක, සාධාරණ මිලට සැපයෙන සේවාවක් විවිධ භූගෝලීය තත්ත්වයන් තුළ ජීවත්වන සියළු පුරවැසියන් හට සමාන අයුරින් ලබාගැනීමේ අවස්ථාව සහතික කිරීම |
| 10 | AP18/COA/10 | ජල හා මළාපවහන සේවා සඳහා අවම සේවා ප්‍රමිති සම්බන්ධ උපමානයක් ගොඩනැගීම | ජල හා මලාපවහන මෙහෙයුම්කරුවන් විසින් ජල හා මලාපවහන සේවාවන් ආශ්‍රිත අවම සේවා ප්‍රමිතීන් සපුරාලන බවට සහතික වීම. |

**අධීක්ෂණ අංශය**

| | යොමුව | කාර්යයන් -2018 | ප්‍රතිඵල |
|---|---|---|---|
| 11 | AP18/INS/01 | සම්ප්‍රේෂණ මාර්ග ගෙමං ආශ්‍රිත ආරක්ෂක නිශ්කාශනය කළමනාකරණය සම්බන්ධ ප්‍රතිපත්තිමය උපදේශනය | ප්‍රතිපත්තිමය උපදේශනය |
| 12 | AP18/INS/02 | විදුලි කාර්මික ශිල්පීන් සහතිකකරණය සම්බන්ධයෙන් විදුලි කාර්මිකයන්ගේ අදහස් විමසීම | විදුලි සේවකයන් (විදුලි කාර්මිකයන්) සහතිකකරණය සම්බන්ධයෙන් විදුලි කාර්මිකයන් බලගැන්වීම |
| 13 | AP18/INS/03 | විදුලි කාර්මික සේවකයන් සඳහා බලපත් ලබාදීමේ කටයුතු ක්‍රියාත්මක කිරීම | විදුලි කාර්මිකයන් සහතිකකරණය මගින් ආරක්ෂක රෙගුලාසි හා ප්‍රමිතීන් සමග වඩ වඩාත් අනුගත වීම |
| 14 | AP18/INS/04 | මධ්‍ය වෝල්ටීයතා රැහැන්වල ආරක්ෂාව හා විශ්වසනීයත්වය සහතික කිරීමේ මාර්ගෝපදේශ සැකසීම | මධ්‍ය වෝල්ටීයතා රැහැන්වල ආරක්ෂාව හා විශ්වසනීයත්වය සහතික කිරීමේ මාර්ගෝපදේශ |
| 15 | AP18/INS/05 | විදුලි සැර වැදී මියයාමේ තත්ත්වයන් සමනය කිරීමේ වැඩසටහන | විදුලිබලය ආරක්ෂාකාරීව පරිහරණය පිළිබඳ වර්ධිත දැනුම හා දැනුවත් වීම |

| | යොමුව | කාර්යයන් -2018 | ප්‍රතිඵල |
|---|---|---|---|
| 16 | AP18/INS/06 | ගෘහස්ථ හා සිල්ලර පාරිභෝගික ස්ථාපනයන් පිළිබඳ කාලීන පරීක්ෂණ සම්බන්ධ නීතියක් සැකසීම | ගෘහස්ථ හා සිල්ලර පාරිභෝගික ස්ථාපනයන් පිළිබඳ කාලීන පරීක්ෂණ සම්බන්ධ නීතිය |
| 17 | AP18/INS/07 | ආරක්ෂක හා කාර්මික කළමනාකරණ සැලැස්ම සැකසීම හා ක්‍රියාත්මක කිරීම | 2020 වනවිට පිළිගත් 20ක ප්‍රමාණයක් දක්වා විදුලි සැර වැදී මියයාම් සංඛ්‍යාව පහත හෙළීම සඳහා ආරක්ෂක හා කාර්මික කළමනාකරණය සිදු කිරීම මගින් විදුලි බලපත්ලාභීන්ගේ දෝෂයන් හේතුකොට සිදුවන සිදුවීම්/හදිසි අනතුරු සංඛ්‍යාව අඩු වීම. |
| 18 | AP18/INS/08 | වහළ මත සවි කරන සූර්ය විදුලි බල උත්පාදක යන්ත්‍රයන්හි ආරක්ෂාව පිළිබඳ උපමාන සැකසීම | වහළ මත සවි කරන සූර්ය විදුලි බල උත්පාදක යන්ත්‍රයන්හි ආරක්ෂාව පිළිබඳ උපමාන |
| 19 | AP18/INS/09 | විදුලි දෝෂ විමර්ශනයන් සඳහා වූ මාර්ගෝපදේශයක් සකස් කිරීම | විදුලි දෝෂ විමර්ශනයන් සඳහා වූ මාර්ගෝපදේශය |
| 20 | AP18/INS/10 | අළුතින් ඉදිකොට ප්‍රතිසංස්කරණය කෙරෙමින් පවත්නා මාර්ග සඳහා සේවා ගෙමං පිහිටුවීම සඳහා වූ ප්‍රතිපත්තිමය උපදේශනය | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය වෙත ප්‍රතිපත්ති උපදෙස් ලබාදීම |
| 21 | AP18/INS/11 | ජලනල කාර්මිකයින් සඳහා බලපත් ලබාදීමේ කටයුතු ක්‍රියාත්මක කිරීම | ජලනල කාර්මිකයින් සහතිකකරණය මගින් රෙගුලාසි හා ප්‍රමිතීන් සමග වඩ වඩාත් අනුගත වීම |
| 22 | AP18/INS/12 | ශ්‍රී ලාංකීය වෙළඳපල පවත්නා ජල සවිකුරු නියාමනය | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය වෙත ප්‍රතිපත්ති උපදෙස් ලබාදීම |
| 23 | AP18/INS/13 | විදුලි ආරක්ෂාව ආශ්‍රිත කටයුතු නිරීක්ෂණය | ආරක්ෂාව වර්ධනය පිණිස පැවැත්වූ වැඩසටහන්හි වර්ධිත ඵලදායකත්වය |

## බලපත්‍ර අංශය

| | යොමුව | කාර්යයන් -2018 | ප්‍රතිඵල |
|---|---|---|---|
| 24 | AP18/ LIC/ 01 | කෙටි කාලීන බලශක්ති ආරක්ෂක ගැටළු හඳුනා ගැනීම හා උපදෙස් ලබාදීම | කෙටි කාලීන බලශක්ති ආරක්ෂක ගැටළු හඳුනා ගැනීම සහ ගැටළු සමනය කිරීම සඳහා කටයුතු කිරීම |
| 25 | AP18/ LIC/ 02 | ලං.වි.ම. දිගු කාලීන සම්ප්‍රේෂණ සැලැස්ම සමාලෝචනය හා අනුමත කිරීම සහ ක්‍රියාත්මක කිරීමේ කටයුතු නිරීක්ෂණය | යහපත් සම්ප්‍රේෂණ සැලැස්ම අනුමත කිරීම. සැලැස්ම ක්‍රියාත්මකවන බවට වගබලා ගැනීම. |
| 26 | AP18/ LIC/ 03 | අනුමත විදුලි උත්පාදක සැලැස්ම ක්‍රියාත්මක කිරීම නිරීක්ෂණය | අනුමත විදුලි උත්පාදක සැලැස්ම ක්‍රියාත්මක කිරීම නිරීක්ෂණය සහ ප්‍රමාදයන් නිරීක්ෂණය වුවහොත් ප්‍රතිකර්මක ක්‍රියාමාර්ග ගැනීම |

| | යොමුව | කාර්යයන් -2018 | ප්‍රතිඵල |
|---|---|---|---|
| 27 | AP18/ LIC/ 04 | සම්ප්‍රේෂණ කාර්ය සාධන රෙගුලාසි ක්‍රියාත්මක කිරීම | බල උත්පාදක හා සම්ප්‍රේෂණ පද්ධති කාර්ය සාධනය ක්‍රමානුකූලව වැඩිදියුණු කිරීම |
| 28 | AP18/ LIC/ 05 | එදිනෙදා කටයුතු | |
| 29 | AP18/ LIC/ 06 | විදුලිය (බෙදාහැරීමේ) කාර්ය සාධන ප්‍රමිති රෙගුලාසි (විදුලි බලයේ ගුණාත්මකභාවය සහ සැපයුම් ගුණාත්මකභාවය) ක්‍රියාත්මක කිරීම | 2018 වර්ෂය සඳහා (රෙගුලාසිය ප්‍රකාර) හඳුනාගත් කාර්යයන් ක්‍රියාත්මක කිරීම |
| 30 | AP18/ LIC/ 07 | බෙදා හැරීමේ පද්ධතියේ ව්‍යාපාරික සැලැස්ම සැකසීම පිළිබඳ බෙදාහැරීමේ බලපත්‍රලාභීන් සඳහා වූ ප්‍රමිතිගත උපමානයක් සකසා එය නිරීක්ෂණය පිණිස යාන්ත්‍රණයක් පිහිටුවීම | බෙදාහැරීමේ පද්ධතියේ ව්‍යාපාරික සැලැස්ම සැකසීම සහ එහි නිරීක්ෂණ යාන්ත්‍රණය සඳහා ප්‍රමිතිගත උපමානයක් සැකසීම |
| 31 | AP18/ LIC/ 08 | බලපත්‍රකරණය හා නිදහස් කිරීම | විදුලි උත්පාදනය, සම්ප්‍රේෂණය හා බෙදාහැරීම සම්බන්ධ නෛතික අවශ්‍යතාවයන් සහතික කිරීමේ කාර්යය සම්පූර්ණ කෙරෙමින් පවතී. |
| 32 | AP18/ LIC/ 09 | බලපත් තොරතුරු ඉදිරිපත් කිරීමේ පද්ධති පරිපාලනය | බලපත් තොරතුරු ඉදිරිපත් කිරීමේ පද්ධතිය නිසි පරිදි ක්‍රියාත්මකවන බවට වගබලා ගැනීම |
| 33 | AP18/ LIC/ 10 | බෙදාහැරීමේ නීති මාලා නංවාලීමේ හා සමාලෝචනය කිරීමේ මණ්ඩල (DCERP) රැස්වීම හා ආශ්‍රිත කටයුතු | බෙදාහැරීමේ නීති මාලා නිසි පරිදි ක්‍රියාත්මකවන බවට වගබලා ගැනීම |
| 34 | AP18/ LIC/ 11 | ලිහිසි ද්‍රව්‍ය කර්මාන්තය ආශ්‍රිත කටයුතු | වෙළඳපල ක්‍රියාකරුවන්ගේ නෛතික අවශ්‍යතාවය තෘප්ත කෙරෙන බවට වගබලා ගැනීම අංශය පිළිබඳ පාරිභෝගික දැනුවත්භාවය වැඩිදියුණු කිරීම |
| 35 | AP18/ LIC/ 12 | ශ්‍රී ලංකාවේ බලශක්ති අංශයේ හදිසි අවස්ථා සඳහා වූ සූදානම්කාරිත්වය පිළිබඳ අධ්‍යයනය | බලශක්ති අංශයේ හදිසි අවස්ථා සඳහා වූ සූදානම්කාරිත්වය සම්බන්ධයෙන් රජයට උපදෙස් ලබාදීම |
| 36 | AP18/ LIC/ 13 | සම්ප්‍රේෂණ පද්ධති නීති මාලාව ක්‍රියාත්මක කිරීම | සම්ප්‍රේෂණ පද්ධති සැලසුම්කරණය, මෙහෙයවීම හා නඩත්තුව සම්බන්ධ විනිවිදභාවය වැඩිදියුණු වීම |

| නියාමන කටයුතු | | | |
|---|---|---|---|
| | යොමුව | කාර්යයන් -2018 | ප්‍රතිඵල |
| 37 | AP18/RA/01 | 2017 වර්ෂය සඳහා නියාමන ගිණුම් සමාලෝචනය | 2018 වර්ෂයේ විදුලි ගාස්තු තීරණය සම්බන්ධ විනිවිදභාවය හා නිරවද්‍යතාවය වර්ධනය වීම |
| 38 | AP18/RA/02 | 2011 - 2015 කාල පරිච්ඡේදය තුළ විදුලි ගාස්තු බලපෑම පිළිබඳ අධ්‍යයනය සහ ශ්‍රී ලංකාවේ විදුලි පරිභරණය පිළිබඳ රජයට උපදෙස් සැකසීම | ■ 2011-2015 කාල පරිච්ඡේදය පුරා සැලසුම්ගත ප්‍රතිපත්ති ප්‍රතිඵල හා ප්‍රතිවිපාක විෂයයෙහි විදුලි ගාස්තුවල බලපෑම තක්සේරු කිරීම<br>■ සැලසුම්ගත ප්‍රතිපත්තිමය ප්‍රතිඵල හා ප්‍රතිවිපාකයන් සාර්ථක කරගැනීමේදී ඇතිවූ හිදැස් හා හිගයන් ආමන්ත්‍රණය කිරීමේ අපේක්ෂිත 2020 බලශක්ති ක්‍රියාවලිය සැලසුම්කරණය සහ අපේක්ෂිත විදුලි පරිභරණ මට්ටම් (ඉල්ලුම) සහ අවශ්‍ය පද්ධතිමය ව්‍යාප්තිය (සැපයුම)<br>■ අපේක්ෂිත විදුලි පරිභරණ මට්ටම් ළඟා කරගැනීම සඳහා විදුලි සැපයුම සම්බන්ධ ගාස්තු/මිලකරණ ප්‍රතිපත්තියක් සැකසීම<br>■ සහන විදුලි ගාස්තු ලබාදීම සඳහා පුද්ගලික ගෘහස්ත ආදායමේ පර්යන්ත මට්ටම නිශ්චය කරමින් ණීඅවාසි ලබන පාරිභෝගික කණ්ඩායම් හඳුනා ගැනීම සහ විදුලිය පරිභරණය සම්බන්ධයෙන් රජයට උපදෙස් ලබාදීම සඳහා කොමිෂන් සභාව විසින් සලකා බැලීම සහ ගතයුතු ක්‍රියාමාර්ග සම්බන්ධ නිර්දේශ මාලාවක් සැකසීම |
| 39 | AP18/RA/03 | අවාසි ලබන පාරිභෝගික කණ්ඩායම් සම්බන්ධ නීති සැකසීම සහ සහන විදුලි ගාස්තු සම්පාදනය | සහන විදුලි ගාස්තු ලබාදීම සඳහා පුද්ගලික ගෘහස්ථ ආදායම්හි පර්යන්ත මට්ටම නිශ්චය කරමින් අවාසි ලබන පාරිභෝගික කණ්ඩායම් හඳුනා ගැනීම |
| 40 | AP18/RA/04 | සැපයුම් සේවා නීති සංග්‍රහය සැකසීම, සමාලෝචනය සහ ඒ හා අනුගත වීම * විදුලි සම්බන්ධතා ලබා දීම සහ සැපයුම | පාරිභෝගික හිමිකම් හා වගකීම් සහ පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීමේ ක්‍රියා පරිපාටීන් සම්බන්ධයෙන් පාරිභෝගිකයන් වඩ වඩාත් සවිබල ගැන්වීම |
| 41 | AP18/RA/14 | ඛනිජතෙල් නිෂ්පාදන සඳහා වූ අවම ප්‍රමිතීන් නිශ්චය කරන්නාවූ නීති කෙටුම්පත් සැකසීම | සියළු ඛනිජතෙල් නිෂ්පාදන සඳහා වූ අවම ප්‍රමිතීන් නිශ්චය කරන්නාවූ නීති කෙටුම්පත් |

| | යොමුව | කාර්යයන් -2018 | ප්‍රතිඵල |
|---|---|---|---|
| 42 | AP18/RA/05 | බලපත්, නිදහස්කරණයන් සහ අනුමැතීන් සඳහා වූ අයැදුම්පත් සහ ආකෘති පත් සම්බන්ධ නීති සැකසුම | බලපත්, නිදහස්කරණයන් සහ අනුමැතීන් සඳහා වූ අයැදුම්පත් සහ ආකෘති පත් සම්බන්ධ නීති සැකසුම |
| 43 | AP18/RA/06 | ඕනෑම මනුවක ලියාපදිංචිය වෙනස් කිරීමක් සම්බන්ධ සැක සහිත තත්ත්වයන් විමර්ශනය කිරීමේ උපමාන | ඕනෑම මනුවක ලියාපදිංචිය වෙනස් කිරීමට එරෙහිව විමර්ශනය කිරීමේ, නීතිමය කටයුතු සිදු කිරීමේ විෂයයෙහි බෙදාහැරීමේ බලපත්ලාභියා සතු හිමිකම් ආරක්ෂා කරන අතර පාරිභෝගික හිමිකම් ආරක්ෂා කිරීමේ නෛතික අවශ්‍යතාවයන් සමගින් වඩ වඩාත් අනුගත වීම. |
| 44 | AP18/RA/07 | නිදහස් කරන ලද පාර්ශ්වයන් සඳහා වූ මනුගතකරණ හා බලශක්ති ඇස්තමේන්තු නීති මාලාව | (නිදහස් කරන ලද පාර්ශ්වයන්ගේ විදුලිබලය බෙදාහැරීමේ පද්ධතීන්හි) මනුගතකරණයට හා බලශක්ති ඇස්තමේන්තුකරණයට අදාළ නෛතික අවශ්‍යතා සමගින් වඩ වඩාත් අනුගත වීම |
| 45 | AP18/RA/08 | මහජන අදහස් විමසීම් හා මහජනතාව වෙත සවන්දීම් සැසි පැවැත්වීමේ කාර්ය පරිපාටිය | සංවිධානය තුළ කාර්යක්ෂමතාවය වර්ධනය වීම |
| 46 | AP18/RA/09 | කොමිෂන් සභාවේ තීරණ ප්‍රචාරණය කිරීමේ ආකෘතිය | |
| 47 | AP18/RA/10 | නියාමන ලේඛන මත පදනම්ව විදුලි ගාස්තු ගොනුගත කිරීමේ උපමාන සහ ආකෘති සැකසීම | විදුලි ගාස්තු තීරණය කිරීම විෂයයෙහි වඩා වර්ධනය වූ විනිවිදභාවය සහ තොරතුරු කරා ප්‍රවේශ විය හැකි බව |
| 48 | AP18/RA/11 | අවම පිරිවැය දිගු කාලීන විදුලි බල උත්පාදන සැලැස්ම සමාලෝචනය කිරීම සඳහා වූ අවම පිරිවැය දිගු කාලීන විදුලි බල උත්පාදන සැලසුම් කාර්ය පරිපාටිය | අවම පිරිවැය දිගු කාලීන විදුලි බල උත්පාදන සැලැස්ම නිසි කලට ලබාදීම සෑම ආයතනයකම/පුද්ගලයෙකුගේම වගකීම බවට පත් කරමින් අවම පිරිවැය දිගු කාලීන විදුලිබල උත්පාදන සැලැස්ම සමාලෝචන කාර්ය පරිපාටිය |
| 49 | AP18/RA/12 | බලපත් සහ නිදහස්කරණයන් සඳහා අයැදුම්පත් සැකසීමේ කාර්ය පරිපාටිය | නිසි කලට අයැදුම් කිරීම ඒ ඒ ආයතනයේ/පුද්ගලයාගේ වගකීම බවට පත් කරමින් බලපත් හා නිදහස්කරණයන් සඳහා අයැදුම්පත් සකස් කිරීමේ කාර්ය පරිපාටිය සහ බලපත් හා නිදහස්කරණයන් නිකුත් කිරීම |
| 50 | AP18/RA/13 | විදුලි (ප්‍රසම්පාදන) නීති ප්‍රතිශෝධනය නීති තුළ කාල රේඛාය හා ස්විස් අභියෝග කාර්ය පරිපාටීන් ඇතුළත් කිරීම | ප්‍රසම්පාදන කාර්ය පරිපාටිය ක්‍රියාත්මක කිරීමේ කාල රේඛාය සමගින් විදුලි (ප්‍රසම්පාදන) නීති |

| විදුලි ගාස්තු හා ආර්ථික කටයුතු | | | |
|---|---|---|---|
| | යොමුව | කාර්යයන් -2018 | ප්‍රතිඵල |
| 51 | AP18/TEA/01 | විදුලිබලය පරිහරණය කිරීමේ හැකියාව පිළිබඳ සමීක්ෂණය | සමීක්ෂණ ප්‍රතිඵල - දත්ත හා සංඛ්‍යාන |
| 52 | AP18/TEA/02 | විදුලි ගාස්තු ආකෘතිය පිළිබඳ ප්‍රතිපත්ති උපදේශනය | විදුලි ගාස්තු ආකෘතිය පිළිබඳ ප්‍රතිපත්ති උපදේශන ලේඛනය |
| 53 | AP18/TEA/03 | විදුලි වාහන ගාස්තු යෝජනා ක්‍රමය | විදුලි වාහන ආරෝපණය සඳහා නව ගාස්තු යෝජනා ක්‍රමයක් |
| 54 | AP18/TEA/04 | බල උත්පාදන මිශ්‍රකරණයේ කෙටි කාලීන බලපෑම සහ බල උත්පාදන පිරිවැය මත ඉන්ධන මිලෙහි බලපෑම පිළිබඳ ප්‍රතිපත්ති උපදෙස් | බල උත්පාදන මිශ්‍රකරණයේ බලපෑම සහ බල උත්පාදන පිරිවැය මත ඉන්ධන මිලෙහි බලපෑම පිළිබඳ අධ්‍යයන වාර්තාව |
| 55 | AP18/TEA/05 | විදුලි ගාස්තු ක්‍රමවේදය පිළිබඳ පරදුකරුවන්ගේ අදහස් විමසීම | විදුලි ගාස්තු ක්‍රමවේදය සමාලෝචනය හා ක්‍රමවේදය පිළිබඳ පරදුකරු අදහස් ඒකරාශිකරණය |
| 56 | AP18/TEA/06 | දේශීය පාරිභෝගිකයන් සඳහා පරිහරණ කාල (ToU) ගාස්තු මාදිලිය පිළිබඳ ප්‍රතිපත්තිමය උපදෙස් දීම | නව පරිහරණ කාල (ToU) ගාස්තු පිළිබඳ ප්‍රතිපත්තිමය උපදේශයකි |
| 57 | AP18/TEA/07 | විදුලි බලාගාර තාප අනුපාත පරීක්ෂණ | විදුලි ගාස්තු තීරණය කිරීමේදී විදුලි බලාකාර සඳහා වඩාත් සුදුසු කාර්යක්ෂමතා පරාමිතීන් භාවිතය |

| පරිසරය, පුනර්ජනනීය බලශක්ති හා කාර්යක්ෂමතාවය | | | |
|---|---|---|---|
| | යොමුව | කාර්යයන් -2018 | ප්‍රතිඵල |
| 58 | AP/18/EER/1 | බලපත් තොරතුරු ඉදිරිපත් කිරීමේ පද්ධතිය (LISS) භාවිතයෙන් පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය සහ තාප විදුලයේ පාරිසරික කාර්ය සාධනය සම්බන්ධ වෙබ්ගත වාර්තා සැකසීම | 2020 වනවිට මෙගාවොට් 200 හා 2025 වනවිට මෙගාවොට් 1000 මට්ටමේ වහළ මත සවිකරන සූර්ය විදුලි බලාගාර පද්ධති සම්පූර්ණ කිරීම. විදුලි බල උත්පාදන බලපත්ලාභීන් පාරිසරික ප්‍රමිතීන්ට අනුගත විය යුතු වේ. |
| 59 | AP/18/EER/2 | විදුලි උත්පාදනයේ බාහිරතා පිරිවැය ඇස්තමේන්තුගත කිරීම | ශ්‍රී ලංකාවේ විදුලි උත්පාදනයේ බාහිරතා පිරිවැය |
| 60 | AP/18/EER/3 | ශ්‍රී ලංකාවේ සූර්ය විදුලි බල ශක්තියට අදාළ පූර්ණ විභවතාවය ප්‍රයෝජනයට ගැනීම පිළිබඳ පර්යේෂණය | රජයේ ප්‍රතිපත්ති පිළිබඳ උපදෙස් ලබාදීම |

| ආයතනික සන්නිවේදනය | | | |
|---|---|---|---|
| | යොමුව | කාර්යයන් -2018 | ප්‍රතිඵල |
| 61 | AP18/CCO/01 | ප්‍රාදේශීය මහජන අදහස් විමසීම් | ■ ප්‍රාදේශීය මට්ටමේ විදුලිබල හා ජල අංශ ගැටළු හඳුනා ගැනීම.<br>■ අදාළ අංශ වෙත අදාළ නියාමන මෙවලම් නිර්දේශ කිරීම |
| 62 | AP18/CCO/02 | විදුලිබල අංශය ඉලක්ක කරගත් මහජන අදහස් විමසුම | නියාමන මෙවලම්, ප්‍රතිපත්ති, උපදෙස් සැකසීම සඳහා වූ නිශ්චිත ගැටළු සම්බන්ධ කෙටුම්පත් නිර්දේශ |
| 63 | AP18/CCO/03 | දැනුම් මාධ්‍යය | නියාමන මෙවලම්, ප්‍රතිපත්ති, උපදෙස් සැකසීම සඳහා වූ නිශ්චිත ගැටළු සම්බන්ධ කෙටුම්පත් නිර්දේශ |
| 64 | AP18/CCO/04 | අංකිත කාර්ය නියුක්ති වර්ධනය | ■ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව සමග කටයුතු කරන්නාවූ විවිධ සමාජ මාධ්‍ය පිරිස්<br>■ සමාජ මාධ්‍ය මගින් අදහස් දැක්වීම් සඳහා පහසුකම් සැලසීමේ කාර්ය පරිපාටියක් |
| 65 | AP18/CCO/05 | ප්‍රධාන සන්නිවේදන සැලැස්ම | මාධ්‍ය නිවේදන, මාධ්‍ය සාකච්ඡා, දැනුම බෙදාහදා ගැනීමේ ද්‍රව්‍ය (අත් පත්‍රිකා/ රූපවාහිනී, ගුවන් විදුලි, මුද්‍රිත මාධ්‍ය ව්‍යාපාර), ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා |
| 66 | AP18/CCO/06 | තොරතුරු ප්‍රචාරණය | දත්ත ප්‍රචාරණ ලිත, ආයතනික වාර්තා, ආංශික කාර්ය සාධන වාර්තා, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා කාර්ය සාධන වාර්තා, නිල නිවේදන, කාලීන දත්ත ප්‍රචාරණය සහ තොරතුරු දැනගැනීමේ සැලකුම්, දත්ත හා විග්‍රහයන් සත්‍යාපනය කිරීමේ යාන්ත්‍රණය |

| මානව සම්පත් කළමනාකරණය | | | |
|---|---|---|---|
| | යොමුව | කාර්යයන් -2018 | ප්‍රතිඵල |
| 67 | AP18/HR/01 | සේවක කාර්ය සාධන කළමනාකරණය | සේවක කාර්ය සාධනය, කාර්ය සාධනය ඉලක්කගත කාර්ය බලකා නිරවද්‍යතාවය වැඩිදියුණු කිරීම.<br>කුසලතා හා දැනුම සම්බන්ධ ශක්‍යතා වර්ධනය |
| 68 | AP18/HR/02 | ධාරිතා වර්ධනය/ පුහුණුව හා සංවර්ධනය (විදේශීය හා දේශීය) | සේවක අදහස් වඩා හොඳින් සන්නිවේදනය.<br>කාර්ය ප්‍රගතිය. නිපුණතා සංවර්ධනය |

| | යොමුව | කාර්යයන් -2018 | ප්‍රතිඵල |
|---|---|---|---|
| 69 | AP18/HR/03 | සේවක කාර්ය නියුක්තිය හා සුභ සාධනය | සේවක අදහස් වඩා හොඳින් සන්නිවේදනය. කාර්ය ප්‍රගතිය. නිපුණතා සංවර්ධනය |
| 70 | AP18/HR/04 | මානව හිමිකම් දෛනික කාර්යයන් | |
| 71 | AP18/HR/05 | මානව සම්පත් අංශයේ තෘප්තිය පිළිබඳ සමීක්ෂණය | සේවක අදහස් වඩා හොඳින් සන්නිවේදනය. කාර්ය ප්‍රගතිය. නිපුණතා සංවර්ධනය |
| 72 | AP18/HR/06 | රැකියා සංවර්ධන ද්වාරය | සේවක අදහස් වඩා හොඳින් සන්නිවේදනය. කාර්ය ප්‍රගතිය. නිපුණතා සංවර්ධනය |
| 73 | AP18/HR/07 | මානව සම්පත් තොරතුරු පද්ධතිය පේරෝල් පද්ධතිය හා බද්ධ කිරීම | අතින් සිදුකරන දත්ත මාරුකරණයට අදාළව වෙන්කළ කාලය අඩු කිරීම |
| 74 | AP18/HR/08 | ප්‍රාදේශීය පරිපාලන පරීක්ෂණ | සංවිධානයේ කාර්ය පරිපාටීන් සම්බන්ධ සේවක වගවීම වර්ධනය |

| තොරතුරු තාක්ෂණ හා කළමනාකරණ තොරතුරු පද්ධතිය | | | |
|---|---|---|---|
| | යොමුව | කාර්යයන් -2018 | ප්‍රතිඵල |
| 75 | AP18/IT/01 | කාර්යාල ස්වයංක්‍රීයකරණය | කාර්යාල කාර්ය මණ්ඩලය වෙත ලබාදෙන සේවාවන්හි වර්ධනයක් |
| 76 | AP18/ITM/02 | යටිතල පහසුකම් සංවර්ධනය | ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ වර්ධනය වන අවශ්‍යතා ප්‍රමාණය සපුරාලනු පිණිස දෘඩාංග වේදිකාව සහතික කොටඇත. |
| 77 | AP18/ITM/03 | ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම්කරණය සහ ආපදා ප්‍රතිකර්මය (BCP/DR) + ආරක්ෂාව | ව්‍යාපාරික ශක්තිය සාක්ෂාත් කරගනු පිණිස අවශ්‍ය සහාය ලබාදීම සඳහා දෘඩාංග වේදිකාව සහතික කොට ඇත. |
| 78 | AP18/ITM/04 | ව්‍යාපාර යෙදවුම් | කාර්යාලයීය කාර්ය මණ්ඩලය වෙත ලබාදෙනු ලබන සේවාවන්හි වර්ධනයක් |
| 79 | AP18/ITM/05 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ප්‍රතිපත්ති හා විගණනය | කාර්යාලයීය කාර්ය මණ්ඩලය වෙත ලබාදෙනු ලබන සේවාවන්හි වර්ධනයක් |

| මූල්‍ය | | | |
|---|---|---|---|
| | යොමුව | කාර්යයන් -2018 | ප්‍රතිඵල |
| 80 | AP18/FIN/01 | මූල්‍ය නිරීක්ෂණ හා නියාමන අනුකූලතා | අනුකූලතාව |
| 81 | AP18/FIN/02 | රේඛීය අමාත්‍යාංශය වෙත කාර්තුමය වාර්තා සහ මහජනතාව දැනුවත් කිරීම | තොරතුරු |
| 82 | AP18/FIN/03 | අභ්‍යන්තර හා බාහිර විගණන විමසුම්වලට පිළිතුරු ලබාදීම | දෝෂ අවම කිකිරීම |
| 83 | AP18/FIN/04 | 2019 අයවැය සකස් කිරීම | අයවැය |
| 84 | AP18/FIN/05 | ආදායම් රැස් කිරීම නිරීක්ෂණය | නිසි ලෙස ආදයම් රැස්කිරීම |
| 85 | AP18/FIN/06 | අවසන් ගිණුම් සැකසීම | අයෝග්‍ය විගණන මතයක් ලබාගැනීම |
| 86 | AP18/FIN/07 | ප්‍රසම්පාදන කටයුතු | ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙත අගය උපරිම කරනු පිණිස හා පිරිවැය ඉතුරුම් අවස්ථා යථාර්ථයක් කරගනු පිණිස ප්‍රසම්පාදන ක්‍රියාවලිය ප්‍රතිසංවිධානය හා වැඩිදියුණු කිරීම |
| 87 | AP18/FIN/08 | මූල්‍ය වාර්තා | නිසි කලට නිවැරදි මූල්‍ය තොරතුරු ලබාදීම |
| 88 | AP18/FIN/09 | කළමනාකාරිත්වය වෙත මූල්‍ය තොරතුරු ලබාදීම | අයවැය උපයෝජනය උපරිමකරණය |

| අභ්‍යන්තර විගණන | | | |
|---|---|---|---|
| | යොමුව | කාර්යයන් -2018 | ප්‍රතිඵල |
| 89 | AP18/IA/01 | කළමනාකාරිත්වය වෙත ඵලදායී තීරණ ගැනීමේ පහසුකම් සම්පාදනය | කළමනාකාරිත්වය වෙත ඵලදායී තීරණ ගැනීමේ පහසුකම් සම්පාදනය |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } පීආර්ඊ/ඩී/පියූසී/1/17/24 ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2018 සැප්තැම්බර් 06 දින

සභාපති

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව

**ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනතේ 34 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් කොමිෂන් සභාවේ සභාපති වෙත 2018 ජූලි 31 දින නිකුත් කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණන විෂය පථය

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැළසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් හා හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

# 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

---

### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16

---

(i) ප්‍රමිතයේ 34 වන ඡේදය ප්‍රකාරව වත්කමක සාධාරණ වටිනාකම එහි ධාරණ අගයෙන් ප්‍රමාණාත්මක ලෙස වෙනස් වනවිට වාර්ෂිකව ප්‍රත්‍යාගණනය කලයුතු අතර සාධාරණ වටිනාකමෙහි සැලකිය යුතු නොවන තරමේ වෙනස්වීම් පමණක් තිබෙන වත්කම් සෑම වර්ෂ තුනකට හෝ පහකට වරක් ප්‍රත්‍යාගණනය කල යුතු වුවද වත්කම් පන්ති 4 ක් ප්‍රත්‍යාගණනය කර නොතිබුණු අතර වත්කම් පන්ති 2 ක් පමණක් 2011 වර්ෂයේදී අවසන්වරට ප්‍රත්‍යාගණනය කර තිබුණි.

(ii) ප්‍රමිතයේ 51 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීව කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් රු. 49,965,467 ක් වූ දේපල පිරියත උපකරණ සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණද තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 ප්‍රකාරව ප්‍රතිශෝධනය කර නිවැරදි ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19

---

ප්‍රමිතයේ 57 ඡේදය ප්‍රකාරව සේවක පශ්චාත් ප්‍රතිලාභ වෙන්කිරීම සඳහා පුරෝකථනය කල ඒකක බැර ක්‍රමය පදනම් කරගෙන විශ්වාසදායි ඇස්තමේන්තුවක් කලයුතු වුවත් ඊට පටහැනිව අවසානයට ලබාගත් මාසික වැටුප පදනම් කරගෙන ප්‍රතිපත්තියක් හඳුනාගෙන ක්‍රියාත්මක කර තිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

---

2016 වර්ෂයේ ස්ථාවර වත්කම් ඉවත්කිරීමේ ලේඛනයට අනුව පිරිවැය රු.1,664,243 ක් වූ සම්පූර්ණයෙන් ක්ෂය කර අවසන් වූ දේපල පිරියත හා උපකරණ 2017 වර්ෂය තුල ඉවත් කර තිබූ අතර එම වත්කම්වල පිරිවැය, හා සමුච්චිත ක්ෂය ගිණුම්වලින් ඉවත් කර නොතිබුණි.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 46 වන වගන්තිය හා බලපත්‍රලාභීන් වෙත නිකුත් කරනු ලබන විදුලි උත්පාදන බලපත්‍රයෙහි කොන්දේසි අංක 11 පරිදි 2014 හා 2015 වර්ෂවලට අදාළව වාර්ෂික නියාමන බදු ලෙස රු.81,852,700 ක් විදුලිබල මණ්ඩලයෙන්ද 2017 වර්ෂයට අදාළව අනෙකුත් ආයතනවලින් රු.212,962 ක් ද 2017 දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවට ලැබිය යුතුව පැවතුණි.

(ආ) ලිහිසි තෙල් අලෙවිකරන්නන් විසින් අර්ධ වාර්ෂිකව ගෙවිය යුතු විචල්‍ය ලියාපදිංචි ගාස්තු අදාළ කාලපරිච්ඡේදය නිමවී දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වුවද පුද්ගලික සමාගමකින් 2013 හා 2014 වර්ෂ සඳහා පිළිවෙලින් රු.460,780 ක් හා රු.673,918 ක් ලෙස එකතුව රු.1,134,698 ක් සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් 2017 දෙවන අර්ධ වර්ෂය වෙනුවෙන් රු.5,000,000 ක් 2018 ජූනි 30 දින වනවිට ද අයවී නොතිබුණි.

## 2.4 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනත 3(1) හා 3(2) වගන්ති | කොමිෂන් සභාවේ සාමාජිකත්වයේ යම් පුරප්පාඩුවක් ඇති වී මාස 03 ක් ඇතුළත එම පුරප්පාඩුව පුරවනු ලැබිය යුතු වුවත් එක් සාමාජික තනතුරක් 2014 සැප්තැම්බර් 30 දින සිට පුරප්පාඩුව පැවතුණ අතර ඒ හේතුවෙන් එදින සිට කොමිෂන් සභාවේ සාමාජිකත්වය 05 දෙනෙකුගෙන් සමන්විතවී නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.111,090,475 ක අතිරික්තයක් වූ අතර ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.3,082,655 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.114,173,130 ක වර්ධනයක් නිරීක්ෂණය විය. 2016 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී විවල්‍යය ලියාපදිංචි ගාස්තු ආදායම රු.83,069,537 කින් වැඩිවීම හා උපදේශන සේවා වියදම රු.29,068,000 කින් අඩුවීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයට සාපේක්ෂව 2014 වර්ෂයේදී මෙහෙයුම් ප්‍රතිඵලය සියයට 68 කින් වර්ධනය වී තිබුණද 2014 වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂයේදී සියයට 84 කින් හා 2015 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේදී සියයට 176 කින් පිරිහී තිබූ නමුත් නැවත 2017 වර්ෂයේදී එය සියයට 3704 කින් වර්ධනය වී තිබුණි. එසේ වුවද මෙහෙයුම් ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂයවීම් නැවත ගැලපීමේදී 2016 වර්ෂයේ රු.98,274,006 ක්වූ දායකත්වය 2017 වර්ෂයේදී රු.217,476,959 ක් දක්වා එනම් සියයට 121 කින් වර්ධනය වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මුළු ආදායම වූ රු.331,248,532 ක් තුල විදුලිය නියාමනය වෙනුවෙන් ලංකා විදුලිබල මණ්ඩලය, විදුලි පුද්ගලික සමාගම හා විදුලිය නිපදවන්නන්ගෙන් අයකරන ලද වාර්ෂික විවල්‍ය ලියාපදිංචි ගාස්තු රු.132,791,385 ක් වූ අතර එය මුළු ආදායමේ ප්‍රතිශතයක් ලෙස සියයට 40 කි. 2016 වර්ෂයේ එම ආදායම රු. 49,721,848 ක් වූයෙන් එහි වර්ධනය සියයට 167 ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ මුළු වියදම වූ රු.220,158,057 තුල මෙහෙයුම් වියදම රු.114,199,535 ක් විය. ඉකුත් වර්ෂයේ මෙහෙයුම් වියදම රු.103,057,057 ක් වූ හෙයින් එම වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් වියදම සියයට 11 කින් වැඩිවී තිබූ අතර 2016 වර්ෂයේදී රු.40,028,733 ක්වූ උපදේශන සේවා වියදම 2017 දී රු.10,960,733 ක් වූයෙන් එහි අඩුවීම සියයට 73 ක් විය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විදුලිබල අංශය මූලික කරගත් දිගුකාලීන ඉලක්ක 12 ක් මුල් කරගෙන අංශ 10 ක් මඟින් 2017 වර්ෂය තුල රු.249,784,240 ක ප්‍රතිපාදන සහිත ක්‍රියාකාරකම් 86 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ අතර, අංශ 6 ක් යටතේ වූ ඇස්තමේන්තු වටිනාකම රු.22,154,437 ක්වූ ක්‍රියාකාරකම් 11 ක් සම්බන්ධයෙන් අපේක්ෂිත ඉලක්ක කරා ළඟාවීමට අපොහොසත් වී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) පාරිසරික බලපෑම් සමාලෝචනය කිරීම හා කැළණිතිස්ස හා සපුගස්කන්ද තාප බලාගාර වලට අදාලව පාරිසරික කටයුතු අඛණ්ඩව අධීක්ෂණය කිරීම සඳහා කරන ලද සැලසුම් අනුව 2017 මැයි මාසය තුල කෙටුම්පත් පාරිසරික කාර්යසාධන වාර්තාව අධ්‍යයනය කර අවසන් කිරීම හා පරිසර කාර්යසාධන වාර්තාකරණ රාමුවක් හඳුන්වාදීමටත් සැලසුම් කර ඒ සඳහා රු.1,182,000 ක් වෙන්කර තිබුණද මෙම කාර්යය 2017 වර්ෂය තුල අවසන් කර නොතිබුණි.

(ii) මූලික බලශක්ති මූලාශ්‍රවල සිට විදුලිබලය දක්වා බලශක්ති පරිවර්තනය කිරීම සම්බන්ධ බැහැර කිරීමේ පිරිවැය ඇස්තමේන්තු කිරීම සැලසුම් කළ පරිදි 2017 වර්ෂය තුල සිදුකර නොතිබුණි.

(iii) ඛනිජ තෙල් මිල තීරණය කිරීම සඳහා නිර්නායකයක් සකස් කිරීමට 2017 වර්ෂය තුල සැලසුම් කර තිබුණද ඒ සම්බන්ධයෙන් සකස් කළ යුතු තෙල් මිල නිර්ණය කිරීම සඳහා වර්තමානයේ යොදා ගන්නා ක්‍රමවේදයන් පිළිබඳ වාර්තාව හා 2017 අගෝස්තු 31 වන විට තෙල් මිල නිර්ණය කිරීම සම්බන්ධයෙන් වූ අවසන් වාර්තාව සකස් කර නොතිබුණි. කාර්යසාධන වාර්තාවට අනුව 2017 ඔක්තෝබර් 09 දින එම කෙටුම්පත් වාර්තාව පමණක් සකස් කර තිබුණි.

(iv) "යැවුම් විගණනය" (Dispatch Audit) යන කාර්යය මගින් අඩු පිරිවැයට විදුලිය කාර්යක්ෂමව උත්පාදනය කිරීම සඳහා සැලසුම් කර තිබුණි. 2017 ඔක්තෝබර් 31 වන විට අවසන් වාර්තාව (final dispatch audit report ) සකස් කිරීමට සැලසුම් කර තිබූ අතර අදාල කාර්යය 2017 දෙසැම්බර් 31 වන විටත් අවසන් කර නොතිබුණි. කෙසේ වෙතත් ලංකා විදුලිබල මණ්ඩලයෙන් ඉදිරිපත් කළයුතු ස්වයං තක්සේරු වාර්තාව හා මෙහෙයුම් ක්‍රියාවලිය පිළිබඳ වාර්තාව ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය මත මෙම කාර්යය අපේක්ෂිත පරිදි ඉටුකරගත නොහැකි වූ බව කොමිෂන් සභාව සඳහන් කර ඇත.

(v) 2017 වර්ෂය සඳහා සැලසුම් කර තිබූ ලංකා විදුලිබල මණ්ඩලයේ කෙටි කාලීන ණය සම්බන්ධ අධ්‍යනය (Study on Short Term Debt of CEB) සහ ඉඩදිය හැකි ගාස්තු සඳහා අමුද්‍රව්‍ය භාවිතය පිළිබඳ දර්ශකාංක සම්බන්ධ අධ්‍යනය (Study on Indexation of Material used for Allowed Charges) යන ක්‍රියාකාරකම්හි අවසන් වාර්තා පිළිවෙලින් 2017 ඔක්තෝබර් 30 හා 2017 නොවැම්බර් 30 දින වනවිට සකස් කිරීමට සැලසුම් කළද 2017 දෙසැම්බර් 31 දින වනවිටත් එම වාර්තා කෙටුම්පත් මට්ටමේ පැවතුණි. ලංකා විදුලිබල මණ්ඩලයෙන් අවශ්‍ය දත්ත නොසැපයීම මත ප්‍රමාදය සිදුවී ඇති බව කොමිෂන් සභාව සඳහන් කර ඇත.

(vi) 2018 වර්ෂයට අදාලව ඉඩ දෙන ලද ගාස්තු ක්ෂේත්‍ර පිළිබඳ සමාලෝචනය කිරීම (Review of Allowed Charges filed for 2018) යන ක්‍රියාකාරකමෙහි අවසන් තීරණය 2017 දෙසැම්බර් 31 දින වනවිට ලබාදීමට සැලසුම් කර තිබුණද සැලසුම් කළ පරිදි අදාල කාර්යය අවසන් කිරීමට නොහැකි වී තිබුණි.

(vii) ක්‍රියාකාරී සැලැස්මට අනුව කාර්ය මණ්ඩලයේ කාර්යයන් පහසු කිරීමට පද්ධතීන් 06 ක් හඳුන්වා දීමට සැලසුම් කර තිබූ නමුත් එම කාර්යයන්ගෙන් 2017 වර්ෂය තුල කාර්යයන් 4ක් පමණක් සම්පූර්ණ කර නොතිබුණි.

(viii) මානව සම්පත් හා මූල්‍ය අංශයන්හි පරිගණක භාවිතයන් වැඩිදියුණු කිරීම සහ වෙබ් අඩවිය සංවර්ධනය කිරීම යන කාර්යයන් පිළිවෙලින් 2017 ජූලි හා සැප්තැම්බර් යන මාසවලදී අවසන් කිරීමට සැලසුම් කර තිබුණද එපරිදි එම කාර්යයන් අවසන් කර නොතිබුණි.

8

(ix) 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 43 වන වගන්තිය සහ 2013 අංක 31 දරන ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනතේ 13 වන වගන්තිය ප්‍රකාරව සම්ප්‍රේෂණ බලපත්‍රලාභියකු විසින් දීර්ඝ කාලීන අඩුම ආර්ථික පිරිවැය උත්පාදන පිරියත පුළුල් කිරීමේ සැලසුමක් මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතු අතර සම්ප්‍රේෂණ බලපත්‍රලාභියා වූ ලංකා විදුලිබල මණ්ඩලය වර්ෂ 2018-2037 කාලපරිච්ඡේදය සඳහා වූ දීර්ඝ කාලීන අඩුම ආර්ථික පිරිවැය උත්පාදන පිරියත පුළුල් කිරීමේ සැලසුමේ කෙටුම්පත (Least Cost Long term Generation Expansion Plan ) කොමිෂන් සභාවට 2017 මැයි 05 දින ඉදිරිපත් කර තිබුණි. එහෙත් 2017 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මෙහි එය දීර්ඝකාලීන උත්පාදන සැලසුම සමාලෝචනය කිරීම ලෙස දක්වා තිබූ අතර එම සැලසුම සංශෝධන සහිතව 2017 ජුලි 19 දින කොමිෂන් සභාව අනුමත කර තිබුණි. එසේ වුවද සංශෝධිත සැලැස්ම එපරිදි ක්‍රියාත්මක කිරීමට දෙපාර්ශවය එකඟතාවයකට පැමිණ නොතිබුණි.

මේ සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් කරුණු දක්වා ඇත්තේ විදුලිබල මණ්ඩලය විසින් ලිඛිතව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ කරුණුවලට කොමිෂන් සභාව ලිඛිතව පිළිතුරු සපයා ඇති බවත් විදුලිබල හා බලශක්ති අංශය සඳහා වන පාර්ලිමේන්තු අනු කමිටුව මගින් වරින් වර කැඳවන ලද රැස්වීම්වලදී සහ ආර්ථික කළමනාකරණය සඳහා වන අමාත්‍ය මණ්ඩල කමිටු රැස්වීම්වලදී කොමිෂන් සභාවේ නියෝජිතයන් සහභාගි වූ අතර අදාළ පාර්ශව විසින් විමසන ලද කරුණු පැහැදිලි කිරීම් ලිඛිතව හා වාචිකව ලබා දී ඇති බවත් එබැවින් දෙපාර්ශවය අතර එකඟතාවයකට පැමිණ සැලැස්ම ක්‍රියාත්මක කළ නොහැකිවීමේ වගකීම කොමිෂන් සභාව වෙත පැවරීම සාධාරණ නොවන බවත්ය.

(x) 2017 වර්ෂය සඳහා සැලසුම් කර තිබූ බෙදා හැරීමේ ජාල සඳහා සංයුක්ත බැටරි ගබඩා පද්ධතියෙහි තාක්ෂණික ශක්‍යතාවය විශ්ලේෂණය කිරීම (Analyze Technical Feasibility of Integrating Battery Storage System in to Distribution Network for peak saving) යන කාර්යය 2017 දෙසැම්බර් 31 දින වනවිටත් ආරම්භ කර නොතිබුණි.

(xi) විදුලි බිලෙහි ආකෘතිය වෙනස් කිරීම යන කාර්යය (New format for Electricity Bill ) යටතේ විදුලි බිල්පතක ගාස්තු හා වියදම් පිළිබඳ අවම වශයෙන් ඇතුළත් විය යුතු කරුණු තීරණය කිරීම 2017 සැප්තැම්බර් 14 වනවිට සිදුකිරීමට සැලසුම් කළද මේ දක්වා එම කාර්යය ඉටුවී නොතිබුණි.

(xii) ආරක්ෂණ හා තාක්ෂණික කළමනාකරණ සැලසුම සකස් කර ක්‍රියාත්මක කිරීම (Preparation and implementation of Safety and Technical Management Plan) යන කාර්යය යටතේ අදාල සැලසුම සකස් කිරීම සඳහා 2017 මාර්තු වනවිට උපදේශකයකු පත්කර 2017 දෙසැම්බර් 31 දින නිමකිරීමට අපේක්ෂා කළද උපදේශකවරයෙකු පත්කිරීම හෝ අදාල කාර්යය නිමකර හෝ නොතිබුණි.

(ආ) 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනතේ 1 (2) වගන්තිය පරිදි මහජන උපයෝගිතා කර්මාන්ත ලෙස විදුලිබල, ජලසේවා හා ඛනිජ තෙල් යන කර්මාන්ත මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙත පැවරී තිබෙන අතර 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත මගින් මෙම කොමිෂන් සභාවේ සේවය විදුලිබල කර්මාන්තයට ලබාගැනීමට කටයුතු කරනු ලබයි. එසේ වුවද ඛනිජ තෙල් කර්මාන්තයට හා ජලසේවා කර්මාන්තයට කොමිෂන් සභාවේ සේවය ලබාගැනීමට හැකි නීතිමය පසුබිමක් 2018 මැයි මාසය වනවිටත් සකස් වී නොතිබීම හේතුවෙන් කොමිෂන් සභාවේ නියාමන කටයුතු විදුලිබල කර්මාන්තයට පමණක් සීමා වී ඇති අතර 2006 ජූනි 08 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ඛනිජ තෙල් කර්මාන්තයේ ලිහිසි තෙල් සහ ග්‍රීස් වලට අදාළ ඡායා නියාමක වශයෙන් පමණක් කොමිෂන් සභාව කටයුතු කරයි.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) විදුලි ජනන පිරිවැය පිළිබඳව අධ්‍යයනය කිරීම**

විදුලි පාරිභෝගිකයන්ට දරාගත හැකි ගාස්තුවක් යටතේ විදුලිය පරිභෝජනයට අවස්ථාව සැලසෙන අන්දමට විදුලි උත්පාදන පිරිවැයේ සැලකිය යුතු කොටසක් වන මෙහෙයුම් හා නඩත්තු පිරිවැය අඩු කිරීමේ අවස්ථාව සලකා බැලීම හා ඒ සම්බන්ධ ප්‍රමිතීන් ඇති කිරීම සඳහා අධ්‍යයනයක් සිදුකර නිර්දේශ ලබා ගැනීමට කොමිෂන් සභාව විසින් ඉන්දියානු සමාගමක් සමඟ ඇමරිකානු ඩොලර් 36,416 ක්වූ (ආසන්න වශයෙන් රු.5,600,000) වටිනාකමකට 2017 ජූලි 25 දින ගිවිසුමක් අත්සන් කර තිබුණි.

2017 දෙසැම්බර් 25 වන විට එම කාර්යය සම්බන්ධයෙන් අවසාන වාර්තාව ඉදිරිපත් කළයුතු වුවද 2017 දෙසැම්බර් 31 දින වනවිට අදාළ උපදේශන සමාගම විසින් ආරම්භක වාර්තාව පමණක් ඉදිරිපත් කර තිබුණි. 2017 සැප්තැම්බර් 25 දිනට ඉදිරිපත් කළයුතු අතුරු වාර්තාව 2018 ජනවාරි 15 දිනද 2017 නොවැම්බර් 25 දිනට ඉදිරිපත් කළයුතු අවසාන කෙටුම්පත් වාර්තාව 2018 අප්‍රේල් 29 දින ද ලබාදී තිබූ අතර අවසන් වාර්තාව මේ දක්වා ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) **ශ්‍රී ලංකාවේ විදුලිබල පරිභෝජනය සහ ගාස්තු සම්බන්ධ අධ්‍යයනය**

2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 3(1)(අ) වගන්තිය සහ 2009 ජූනි 03 දින විදුලිබල සහ බලශක්ති අමාත්‍යවරයා විසින් කොමිෂන් සභාව වෙත නිකුත් කළ විදුලිබල කර්මාන්තය සම්බන්ධ සාමාන්‍ය ප්‍රතිපත්ති මාර්ගෝපදේශ අනුව කොමිෂන් සභාවට පැවරී ඇති වගකීම් තුළ ශ්‍රී ලංකාවේ විදුලිබල පරිභෝජනය සහ ගාස්තු සම්බන්ධ අධ්‍යයනයක් සිදුකර රජයට ඒ සම්බන්ධ අවශ්‍ය උපදෙස් ලබාදීම යන කාර්යය 2015 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වාම කොමිෂන් සභාවේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ක්‍රියාකාරකමක් ලෙස දක්වා තිබුණි. කොමිෂන් සභාව මේ සම්බන්ධව අධ්‍යයනයක් සිදු කිරීම සඳහා රු. 9,547,300 ක වටිනාකමකට උපදේශන ආයතනයක් සමඟ 2016 ජූලි 01 දින ගිවිසුමකට එළඹ තිබුණි. සති 48 ක ගිවිසුම් කාලයක් තුල නිම කිරිමට සැලසුම් කර තිබූ මෙම කාර්යය 2017 ජූනි 30 වනවිට නිම කළ යුතු වුවත්, 2017 දෙසැම්බර් 31 වනවිටත් එම කාර්යය නිම කිරීමට අදාල උපදේශන සමාගම අපොහොසත්ව තිබුණි. ඒ සඳහා 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වූ විදුලි පාරිභෝජන පිළිබඳ දත්ත ලංකා විදුලිබල මණ්ඩලයෙන් ලබානොදීම මත අධ්‍යයනය ඉදිරියට කරගෙන යාමට නොහැකි වූ බවට කොමිෂන් සභාව හේතු දැක්වුවද කොමිෂන් සභා පනතේ 15(1) (අ) සහ 15(2), 15(3) යන වගන්ති ප්‍රකාරව නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

කොමිෂන් සභාව විසින් ඉහත අධ්‍යයනය තුළින් ජනනය වන තොරතුරු පාදක කරගනිමින් වරප්‍රසාද නොලත් පාරිභෝගික කණ්ඩායම් සම්බන්ධ සහ අඩු ආදායම් මට්ටම්වල පුද්ගලයන් සඳහා සහන ගාස්තු ක්‍රම සම්බන්ධ විධිවිධාන ඇති කිරිම (Regulation on disadvantaged group of consumers and provision of life-line tariffs ) 2017 ක්‍රියාකාරී සැලැස්ම තුළ ඇතුළත් කර තිබූ නමුත් මූලික කාර්යයේ ප්‍රමාදය නිසා මෙම කාර්යය සිදුකිරීමට ද නොහැකිව තිබුණි.

(ඇ) **විචලා ලියාපදිංචි ගාස්තු**

(i) ලිහිසි තෙල් අලෙවි කරන ආයතන 12 ක් විසින් 2017 වර්ෂයේ පළමුවන අර්ධ වර්ෂය සඳහා සහ ආයතන 10 ක් විසින් දෙවන අර්ධ වර්ෂය සඳහා විකුණුම් ආදායම් තහවුරු කරන ලේඛන ඉදිරිපත් කර නොතිබුණු අතර ආයතන 02 ක් පළමුවන අර්ධ වර්ෂය හා එක් ආයතනයක් දෙවන අර්ධ වර්ෂය සඳහා ගාස්තු ගෙවීමට අදාළ පෝරම හෝ විකුණුම් වාර්තා ඉදිරිපත් කර නොතිබීම හේතුවෙන් ලිහිසි තෙල් අලෙවි කරන්නන් විසින් කොමිෂන් සභාවට ගෙවන විචලා ලියාපදිංචි ගාස්තුවල නිවැරදිතාවය තහවුරු කරගත නොහැකි විය. විකුණුම් ආදායම් තහවුරු කිරීමේ ලේඛන ලබාගැනීම සම්බන්ධයෙන් නිසි ක්‍රමවේදයක් කොමිෂන් සභාව අනුගමනය කර නොතිබීම ඒ සඳහා හේතු වී තිබුණි.

(ii) 2006 ජූනි 08 දින අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මහජන උපයෝගිතා කොමිෂන් සභාව ඛනිජ තෙල් කර්මාන්තයේ ලිහිසි තෙල් සහ ග්‍රීස් වලට අදාළ ඡායා නියාමක වශයෙන් කටයුතු සිදු කළද දැනට ක්‍රියාත්මක විචලා ලියාපදිංචි ගාස්තු ගෙවීමේ ක්‍රමවේදය අනුව ලිහිසි තෙල් අලෙවි කරුවන්ගේ අර්ධ වාර්ෂික විකුණුම් ආදායමින් සියයට 0.75 ක වටිනාකම රු.මිලියන 2.5 නොඉක්මවන අවස්ථාවලදී කොමිෂම් සභාව වෙත කිසිදු ආදායමක් නොලැබෙන බැවින් ඇතැම් ලිහිසි තෙල් අලෙවි කරන්නන්ගෙන් ගාස්තු අයකිරීමකින් තොරව නියාමන කටයුතු සිදුකල යුතුව තිබුණි.

**4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විදුලිය උත්පාදනය, සම්ප්‍රේෂණය හා බෙදාහැරීම සම්බන්ධයෙන් බලපත්‍රලාභීන් වෙත නිකුත් කරන ලද බලපත්‍රයේ කොන්දේසි අංක 11 අනුව අදාල වර්ෂය සඳහා වූ බලපත්‍ර ගාස්තු එම වර්ෂයේ ජූනි 30 දිනට හෝ ඊට පෙර කොමිෂන් සභාව වෙත ගෙවිය යුතු වුවද බලපත්‍රලාභීන්ගෙන් සියයට 70 ක් පමණ සමාලෝචිත වර්ෂය සඳහා වූ බලපත්‍ර ගාස්තු 2017 දෙසැම්බර් 31 දින වන විට ද ගෙවා නොතිබුණි.

(ආ) කොමිෂන් සභාව විසින් 2016 දෙසැම්බර් 06 දින රු.1,754,910 ක වියදමින් SAP නමින් නව පරිගණක ගිණුම්කරණ පද්ධතියක් ස්ථාපනය කර තිබූ අතර එම ගිණුම්කරණ පද්ධතිය උපයෝගී කර ගනිමින් කොමිෂන් සභාව 2016 සහ 2017 වර්ෂ සඳහා ගිණුම් පිළියෙල කර තිබූ නමුත් එහි පවතින අඩුපාඩු පහත පරිදි විය.

(i) ගිණුම්කරණ පද්ධතිය ආශ්‍රයෙන් යම් දිනක් සඳහා නිවැරදි ශේෂ පිරික්සුමක් ලබා ගත නොහැකි අතර පද්ධතිය මගින් ලබාදෙන තොරතුරු උපයෝගී කර ගනිමින් ශේෂ පිරික්සුම අතින් (Manually) පිළියෙල කිරීම සිදුකර තිබුණි.

(ii) මූල්‍ය අංශයේ නිලධාරීන්ට මෙම පද්ධතිය සඳහා ඇතුල්වීමේ අවසරය ලබාදී තිබූ අතර අදාළ නිලධාරීන් විසින් පද්ධතියට ඇතුළත් කරන දත්තවල නිවැරදිතාව පරීක්ෂා කිරීම හා එම දත්ත අනුමත කිරීම යන අවස්ථා ඉහළ කළමනාකරණ මට්ටම්වලින් සිදු කිරීම සඳහා ක්‍රමවේදයක් පද්ධතිය තුළ දක්නට නොලැබුණි.

(iii) ගිණුම්කරණ පද්ධතිය මගින් ලබාදෙන ස්ථාවර වත්කම් ලේඛනයෙහි ක්ෂය ගණනය කිරීමේ පහසුකම් සලසා තිබුණද, පද්ධතියට පිවිසි දින දක්වාම ක්ෂය ප්‍රමාණය පෙන්නුම් කරනු ලබන අතර නිශ්චිත කාලපරිච්ඡේදයක් සඳහා ක්ෂය ගණනය කිරීමේ හැකියාවක් නොතිබුණි.

(ඇ) 2017 දෙසැම්බර් 31 දිනට සිදු කල භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව පහත දුර්වලතා නිරීක්ෂණය විය.

(i) කාර්ය මණ්ඩලය වෙත නිකුත් කර තිබූ ජංගම දුරකථන දෙකක් වර්ෂය තුළදී අස්ථානගතව තිබූ අතර ඒ සඳහා මුදල් අයකර ගැනීම් සම්බන්ධ කටයුතු මේ දක්වා සිදුකර නොතිබුණි.

(ii) ප්‍රයෝජනවත් ජීවිත කාලය අවසන් වූ පසු ආපසු භාරදීමේ කොන්දේසිය මත ලබා දී තිබූ ජංගම දුරකථන තුනක් භෞතික භාණ්ඩ සමීක්ෂණය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(iii) භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ලැප්ටොප් පරිගණක 12 ක් හා පුද්ගල පරිගණක 8 ක් වර්තමානයේදී භාවිතයට ගත නොහැකි බව සඳහන් කර තිබූ අතර ඒ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදුකර නොතිබුණි.

**4.4 කාර්ය මණ්ඩල පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 12 හි 9.2(ඩී) හා (ඊ) ඡේද අනුව සංවිධාන ව්‍යුහය සංශෝධනය කර එය රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට යොමු කර අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ආ) ඉහත චක්‍රලේඛයේ 9.3 ඡේදය අනුව බඳවා ගැනීම් හා උසස් කිරීම් සම්බන්ධයෙන් නිසි ක්‍රමවේදයක් පැවතියයුතු අතර එම ක්‍රමවේදය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ එකඟතාවය ඇතිව අදාල අමාත්‍යාංශය වෙත යොමුකර අනුමැතිය ලබාගත යුතු වුවද, කොමිෂන් සභාවේ බඳවා ගැනීම් හා උසස් කිරීම් පටිපාටිය සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ එකඟත්වය හා අදාල අමාත්‍යාංශයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ඇ) 2017 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්යය මණ්ඩලය 51 ක් වූ අතර එදිනට තත්‍ය කාර්යය මණ්ඩලය 43 ක් වූයෙන් පුරප්පාඩු සංඛ්‍යාව 8 ක් විය. තවද අනුමත කාර්ය මණ්ඩලයට ඇතුලත් නොවූ ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් දෙදෙනෙකු තෘතීය මට්ටමේ නිලධාරීන් 3 දෙනෙකු හා ප්‍රාථමික මට්ටමේ නිලධාරීන් දෙදෙනෙකු වශයෙන් නිලධාරීන් 7 දෙනෙකු කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා තිබුණි.

**5. තිරසාර සංවර්ධනය**

**5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම**

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණි.

(අ) ඉහත පරිදි වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳව දැනුවත්වීම මත කොමිෂන් සභාව විසින් සිය විෂය පථයට අනුව ළඟාකර ගතයුතු අරමුණු වශයෙන් තිරසාර සංවර්ධන අරමුණු වන "සියල්ලන් සඳහා දැරිය හැකි, විශ්වාසනීය, තිරසාර සහ නවීන බලශක්ති සැපයුම සහතික කිරීම" යන්න හඳුනාගෙන තිබුණද කොමිෂන් සභාවේ මූලික අරමුණු 12 තිරසාර සංවර්ධන අරමුණු සඳහා අනුපූරක ලෙස සලකා කටයුතු කර තිබුණි. ඒ අනුව තිරසාර අරමුණ හා සම්බන්ධ වන ඉලක්ක, පාදක දත්ත, ඉලක්ක ළඟාවිය යුතු සන්ධිස්ථානයන් මෙන්ම ප්‍රගතිය මැන බැලීම සඳහා වන දර්ශකයන් ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ආයතනයේ අරමුණු තුල තිරසාර අරමුණු ද ඇතුළත් බව සලකා කටයුතු කිරීම නිසා තිරසාර අරමුණුවලට අදාල ඉලක්ක කරා ලඟාවීම සඳහා අදාල කාර්යයන් වාර්ෂික සැලැස්මට ඇතුළත් කර නොතිබූ අතර එම කාර්යයන් ඉටු කිරීමට අවශ්‍ය වන මූල්‍ය ප්‍රතිපාදනයන් වාර්ෂික අයවැය තුළ වෙනමම හඳුනා ගැනීමට නොහැකිව තිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 6.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 2 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 අනුව මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත කෙටුම්පත් වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවද, කොමිෂන් සභාව විසින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 අප්‍රේල් 05 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

### 6.2 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

#### 6.2.1 ප්‍රසම්පාදනයන්

කොමිෂන් සභාව විසින් සමාලෝචිත වර්ෂය තුලදී සිදුකරන ලද ප්‍රසම්පාදනයන්ට අදාලව 2006 ඔක්තෝබර් 05 දිනැති අංක 6 දරන චක්‍රලේඛයෙන් සංශෝධිත 2006 ජනවාරි 25 දිනැති අංක 8 දරන ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතනයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නිර්දේශයන්ට අනුකූලව කටයුතු කර නොතිබූ අවස්ථා පහත පරිදි විය.

(i) 2.12 මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රසම්පාදන කමිටුවල හා තාක්ෂණික ඇගයීම් කමිටුවල සියළුම සාමාජිකයින් එම කමිටුවල පළමු රැස්වීමේදී තම අත්සන් සහිත ප්‍රකාශ පත්‍ර (Sign Declaration) ලබාදිය යුතු වුවද එපරිදි කටයුතු කර නොතිබුණි.

(ii) 5.3.10 මාර්ගෝපදේශය ප්‍රකාරව රු.මිලියන 2 ට අඩු කොන්ත්‍රාත් සම්බන්ධයෙන් ලංසු වලංගු කාලය දින 49 ක් විය යුතු අතර 17 වන මහලේ ලීබඩු හා සවිකිරීම් සඳහා වන පිරිවැය රු.1,240,800 ක් වූ කොන්ත්‍රාත්තුවට අදාලව ලංසු වලංගු කාලය දින 120 කට වඩා වැඩිවිය යුතු බව ලංසු කැඳවීමේ ලේඛනවල සඳහන් කර තිබුණි.

(iii) 5.3.11 මාර්ගෝපදේශය ප්‍රකාරව පිරිවැය රු.900,000 ක් වූ මුහුණු පොත් ඡායාරූප (face book images) 100 ක් හා සජීවීකරණ (animations) 10 ක් සංවර්ධනය කිරීමේ ප්‍රසම්පාදනයට අදාලව ලංසු සුරක්ෂණයක් ලබාගෙන නොතිබුණි.

15

(iv) 6.3.3 මාර්ගෝපදේශය ප්‍රකාරව ලංසු විවෘත කිරීමේ කමිටුව අවම වශයෙන් ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කරනු ලබන සාමාජිකයන් 02 කුගෙන් සමන්විත විය යුතු වුවත් Designing and printing of backdrop for public consultation EV charging station සඳහා වූ ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී ලංසු විවෘත කිරීමේ කටයුත්ත සඳහා එක් පුද්ගලයකු පමණක් සහභාගි වී තිබුණි.

## 6.2.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

සැපයුම්කරු සමඟ එළඹ තිබුණු ගිවිසුම අනුව ලියකියවිලි කළමනාකරණ පද්ධතියක් (Document Management System) ස්ථාපනය කිරීමේ අරමුණෙන් මෘදුකාංග සංවර්ධනය කිරීම සඳහා 2014 නොවැම්බර් 28 දින ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත්තුව 2015 ජනවාරි 14 දිනෙන් ආරම්භකර 2016 ජුනි 13 දිනෙන් අවසන් විය යුතු වුවද අදාළ කාර්යය ඉටු කිරීමට නොහැකි බවත්, අදාළ ගිවිසුම අවලංගු කරන බවත් සැපයුම්කරු විසින් 2017 මැයි 24 දිනැති ලිපියකින් දන්වා තිබුණි. ගිවිසුම අවලංගු කරන අවස්ථාව වනවිට ගිවිසුමේ කාලය අවසන්ව වර්ෂයකට ආසන්න කාලයක් ගතවී තිබුනද ගිවිසුම කඩකිරීම මත ඇතිවූ අලාභ අයකර ගැනීම සම්බන්ධයෙන් වූ කොන්දේසි ගිවිසුමේ ඇතුළත් කර නොතිබීම නිසා ගිවිසුම කඩකිරීම සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීමට නොහැකි වී තිබුණි.

## 6.2.3 ප්‍රමාද වූ ව්‍යාපෘති

කොමිෂන් සභාව පිහිටි ගොඩනැගිල්ලේ 17 වන මහල සඳහා ලීබඩු හා සවිකිරීම් සපයා ගැනීම සම්බන්ධයෙන් වූ කොන්ත්‍රාත්තුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර මුළු පිරිවැය රු.1,240,800 (බදු රහිත) කට පුද්ගලික සමාගමකට ප්‍රදානය කර තිබුණි. 2017 නොවැම්බර් මස 16 වන දින ප්‍රතිග්‍රහන ලිපිය සැපයුම්කරු වෙත යවා තිබූ අතර ලංසු කැඳවීමේ ලේඛනය අනුව වැඩ කරන දින 30ක් ඇතුළත කාර්යය නිමකළ යුතු බව දක්වා තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 දින වනවිටත් කාර්ය සම්පූර්ණ කර නොතිබුණි.

## 6.3 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂයේ අයවැයගත වියදම් හා තත්‍ය වියදම් අතර සියයට 44 සිට සියයට 100 ක් දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ අවධානයට වරින්වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | කාර්ය මණ්ඩල පරිපාලනය | සංවිධාන ව්‍යුහය සඳහා අදාල අනුමැතිය ලබා නොගැනීම හා සේවකයන් බඳවා ගැනීමේ හා උසස් කිරීමේ කටයුතු විධිමත් නොවීම. |
| (ආ) | බලපත්‍ර ගාස්තු හා නියාමන ගාස්තු | ආදායම් අයකිරීම කාර්යක්ෂමව කිරීම කෙරෙහි අවධානය යොමු නොවීම. |
| (ඇ) | ක්‍රියාකාරී සැලැස්ම | ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්ක කරා ලඟා නොවීම. |

එච්.එම්.ගාමිණී විජේසිංහ

විගණකාධිපති

# මූල්‍ය ප්‍රකාශනය

**ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව**
**2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය**

| | සටහන් | 2017 රු. | 2016 රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | 1 | 28,237,012 | 29,475,844 |
| කෙරෙමින් පවත්නා ප්‍රාග්ධන කාර්යයන් | 1.1 | 10,110,684 | 3,234,750 |
| ආපදා ණය | | 2,519,949 | 3,151,618 |
| සමස්ත ජංගම නොවන වත්කම් | | **40,867,645** | **35,862,212** |
| **ජංගම වත්කම්** | | | |
| ආයෝජන | 2 | 152,076,267 | 94,090,625 |
| භාණ්ඩ වට්ටෝරු | 3 | 558,211 | 431,740 |
| ලැබිය යුතු දෑ | 4 | 163,412,727 | 112,603,999 |
| තැන්පතු, අත්තිකාරම් හා පූර්ව ගෙවීම් | 5 | 9,699,826 | 7,187,935 |
| මුදල් හා මුදල් සමාන දේ | | 8,617,950 | 8,384,737 |
| සමස්ත ජංගම වත්කම් | | **334,364,981** | **222,699,036** |
| **සමස්ත වත්කම්** | | **375,232,626** | **258,561,248** |
| **අරමුදල් හා වගකීම්** | | | |
| **අරමුදල්** | | | |
| සමුච්චිත අරමුදල | 6 | 317,343,957 | 205,943,678 |
| ප්‍රති-ඇගයුම්කරණ සංචිත | | 3,027,878 | 3,027,878 |
| | | **320,371,835** | **208,971,556** |
| **පාරිතෝෂික ප්‍රතිපාදන** | | | |
| පාරිතෝෂික ප්‍රතිපාදන | | 14,576,749 | 11,674,734 |
| | | **14,576,749** | **11,674,734** |
| **ජංගම වගකීම්** | | | |
| **ගෙවිය යුතු ගිණුම්** | 7 | 27,930,742 | 26,530,908 |
| විගණකාධිපතිවරයාගේ ගාස්තු | 8 | 1,753,300 | 784,050 |
| සුරැකුම් තැන්පතුව - ලං.වි.ම. | | 10,600,000 | 10,600,000 |
| සමස්ත වගකීම් | | **40,284,042** | **37,914,958** |
| | | **375,232,626** | **258,561,248** |

05 සිට 12 දක්වා පිටුවල දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනයන්හි අත්‍යවශ්‍ය කොටසක් වේ. මෙකී මූල්‍ය ප්‍රකාශන සකසා ඉදිරිපත් කිරීම ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා සාමාජිකයන්ගේ වගකීම වේ.

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙනුවෙන්

සාලිය මැතිව්
සභාපති

සංජය ගම්ගේ
නියෝජ්‍ය සභාපති

දමිත කුමාරසිංහ
අධ්‍යක්ෂ ජනරාල්

ඩී.එස්.ජයපාල
අධ්‍යක්ෂ - මුදල්

**ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව**
**2017 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන**
**විස්තරාත්මක ආදායම් ප්‍රකාශනය**

| | Notes | 2017<br>Rs | 2016<br>Rs |
|---|---|---|---|
| **ආදායම** | | | |
| විචල්‍ය ලියාපදිංචි ගාස්තුව | **9** | 132,791,385 | 49,721,848 |
| වාර්ෂික නියාමන ගාස්තු | **10** | 188,280,911 | 172,712,742 |
| බලපත් ඉල්ලුම්පත්‍ර ගාස්තුව | **11** | 195,000 | 160,000 |
| වෙනත් ආදායම් | **12** | 9,981,236 | 6,872,685 |
| **සමස්ත ආදායම** | | **331,248,532** | **229,467,275** |
| **වියදම්** | | | |
| පුද්ගලික පඩිනඩි | **13** | 94,986,858 | 89,449,178 |
| උපදේශන සේවා | | 10,960,733 | 40,028,734 |
| මෙහෙයුම් වියදම් | **14** | 114,199,535 | 103,057,057 |
| මූල්‍ය පිරිවැය | **15** | 10,931 | 14,961 |
| **සමස්ත වියදම** | | **220,158,057** | **232,549,930** |
| **වසර සඳහා වූ මෙහෙයුම් අතිරික්තය/(හිඟය)** | | **111,090,475** | **(3,082,655)** |

05 සිට 12 දක්වා පිටුවල දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශනයන්හි අත්‍යවශ්‍ය අනිවාර්ය කොටසක් වේ.

## ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව
## 2017 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය

| | 2017 Rs | 2016 Rs |
|---|---|---|
| **මෙහෙයුම් කටයුතුවලින් උත්පාදිත මුදල්** | | |
| වසරේ මෙහෙයුම් අතිරික්තය / (හිඟය) | 111,090,475 | (3,082,655) |
| **ගැළපුම් කළා** | | |
| ක්ෂය වීම් | 11,399,626 | 11,907,483 |
| පාරිතෝෂික ප්‍රතිපාදන | 2,983,015 | 2,181,812 |
| ස්ථාවර වත්කම් වැය කිරීමෙන් ලද ආදායම | (90,460) | (25,217) |
| පෙර වර්ෂ කාල පරිච්ඡේදය සඳහා ගැළපීම | 309,804 | (85,356) |
| පොළී ආදායම | (9,791,261) | (6,570,707) |
| රජයේ ප්‍රතිපාදන ක්‍රමක්ෂය වීම | | (238,422) |
| | 10,931 | 14,961 |
| | **115,912,130** | **4,101,899** |
| **කාරක ප්‍රාග්ධන විචලනයන්** | | |
| භාණ්ඩ වට්ටෝරු ලේඛනයන්හි (ඉහළ)/ පහළ යාම | (126,471) | (371,528) |
| තැන්පතු (ඉහළ)/ පහළ යාම | 231,689 | (257,889) |
| ලැබිය යුතු දෑ (ඉහළ)/ පහළ යාම | (49,546,847) | (3,033,364) |
| ගෙවිය යුතු දෑ (ඉහළ)/ පහළ යාම | (1,990,075) | (6,176,292) |
| ලබාදෙනු ලබන ප්‍රතිපාදන (ඉහළ)/ පහළ යාම | 969,250 | 44,050 |
| අත්තිකාරම්, පූර්ව ගෙවීම් හා ආපදා ණය (ඉහළ)/ පහළ යාම | (2,111,912) | (1,571,163) |
| **කාරක ප්‍රාග්ධනයේ ශුද්ධ විචලනයන්** | **(52,574,366)** | **(11,366,186)** |
| **මෙහෙයුම් කාර්යයන් මගින් උත්පාදිත/ භාවිත කෙරෙන මුදල්** | **63,337,764** | **(7,264,287)** |
| **ආයෝජන කාර්යයන්ගෙන් උත්පාදිත මූල්‍ය ප්‍රවාහය** | | |
| ස්ථාවර වත්කම් අපහරනයෙන් ලද ආදායම | 90,460 | 25,217 |
| ස්ථාවර වත්කම් මිලදී ගැනීම | (9,803,793) | (12,968,020) |
| සිදු කෙරෙමින් පවත්නා කටයුතුවලට එක් කිරීම් | (3,843,024) | |
| ලද පොළිය | 8,127,846 | 3,818,859 |
| ස්ථාවර තැන්පතු ආපසු ගැනීම | 64,500,000 | 101,000,000 |
| පාරිතෝෂික ආයෝජන ඉහළ යාම | (2,084,109) | (1,406,902) |
| ස්ථාවර තැන්පතු/භාණ්ඩාගාර බිල්පත් හා ඇමතුම් තැන්පතුවල ආයෝජනය කරන ලද | (120,000,000) | (125,000,000) |
| **ආයෝජන කාර්යයන්ගෙන් උත්පාදිත (භාවිත කෙරෙන) ශුද්ධ මූල්‍ය ප්‍රවාහය** | **(63,012,620)** | **(34,530,846)** |
| **මූල්‍ය කටයුතුවලින් උත්පාදිත මුදල් ප්‍රවාහය** | | |
| මූල්‍ය පිරිවැය | (10,931) | (14,961) |
| පාරිතෝෂික ගෙවීම් | (81,000) | |
| **මූල්‍ය කාර්යයන්ගෙන් උත්පාදිත (භාවිත කෙරෙන) ශුද්ධ මූල්‍ය ප්‍රවාහය** | **(91,931)** | **(14,961)** |
| වර්ෂය ආරම්භයේදී මුදල් හා මුදල් සමාන දේ | 8,384,737 | 50,194,831 |
| **වර්ෂය අවසානයේදී මුදල් හා මුදල් සමාන දේ** | **8,617,950** | **8,384,737** |
| **මුදල් හා මුදල් සමාන දේ** | | **8,384,737** |
| අතැති හා බැංකුගත මුදල් | **8,617,950** | **8,384,737** |

**ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව**
**2017 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන**
**සම කොටස් විචලනයන් පිළිබඳ ප්‍රකාශනය**

| | සමුච්චිත අරමුදල | ප්‍රති ඇගයුම්කරණ සංචිත | ADB- TA ආධාර | එකතුව |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| 2017 ජනවාරි 1 දිනට ශේෂය | **205,943,678** | **3,027,878** | **-** | **208,971,556** |
| | | | | - |
| ආදායම් ප්‍රකාශනයේ අතිරික්තය | 111,090,475 | | | 111,090,475 |
| පෙර වසර ගැළපුම් | 309,804 | | | 309,804 |
| **2017 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **317,343,957** | **3,027,878** | | **320,371,835** |

# සාමාන්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති

**1. සාමාන්‍ය**
සංගත ජාතික ප්‍රතිපත්තියකට අනුකූලව යම් උපයෝගිතා කර්මාන්තයන් නියාමනය කරනු පිණිස ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව ස්ථාපනය කරන ලදී.

උක්ත ප්‍රතිපත්තියට අනුකූලව, 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත නීතිගත කිරීමත් සමගින්, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙත ශ්‍රී ලංකාවේ විදුලිබල කර්මාන්තය නියාමනය කිරීමේ බලය පවරන ලදී.

**2. සැකසුම් පදනම**

**2.1** මූල්‍ය ප්‍රකාශනයන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ගිණුම්කරණ ප්‍රමිතීන්, 2002 අංක 35 දරන මහජන උපයෝගිතා කොමිෂන් සභා පනතේ හා 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති පනතේ අවශ්‍යතාවයනට අනුකූල වන පරිදි සකසා ඇත.

**2.2** ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශනයන් ඓතිහාසික පිරිවැය සම්මුතිය යටතේ සකසා ඇත.

**2.3** මූල්‍ය කාල පරිච්ඡේදය
කොමිෂන් සභාවේ මූල්‍ය කාල පරිච්ඡේදය ලිත් වර්ෂය වනු ඇත.

**3. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති යොදා ගැනීම**

කොමිෂන් සභාව විසින් පහත සඳහන් නව හා ප්‍රතිශෝධිත ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS) යොදාගෙන ඇති අතර, මෙකී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති නිරූපණය වන පරිදි අදාළ තැන්හි කොමිෂන් සභාවේ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රතිශෝධනය කර ඇත.
නව හා ප්‍රතිශෝධිත ප්‍රමිති යොදා ගැනීම තුළ ඉදිරිපත් කිරීමේ ක්‍රමය වෙනස් කිරීමට සහ මූල්‍ය ප්‍රකාශන තුළ අතිරේක අනාවරණයන් සිදු කිරීමටද සිදු විය.

කොමිෂන් සභාව වෙත අදාළ වන්නාවූ නව හා ප්‍රතිශෝධිත ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පහත පරිදි වේ.

LKAS 1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
LKAS 2 වට්ටෝරු භාණ්ඩ
LKAS 8 ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්කම් සහ දෝෂ
LKAS 10 ශේෂ පත්‍ර දිනයෙන් පසු සිදුවන සිදුවීම්
LKAS 16 දේපළ, පිරියත හා උපකරණ
LKAS 20 රජයේ ප්‍රතිපාදන සඳහා ගිණුම්කරණය සහ රජයේ ආධාර අනාවරණය
LKAS 18 ආදායම්
LKAS 26 විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් මගින් ගිණුම්කරණය හා වාර්තාකරණය
LKAS 24 ආශ්‍රිත පාර්ශ්ව අනාවරණයන්
LKAS 37 ප්‍රතිපාදන, අවිනිශ්චිත වත්කම් හා වගකීම්

**4. සන්සන්දනාත්මක තොරතුරු**

අන් අයුරකින් ප්‍රකාශිත නම් විනා, කොමිෂන් සභාව විසින් යොදාගනු ලැබ ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති පෙර වසරේ යොදා ගන්නා ලද ඒවා හා අනුරූපී වේ. පවත්නා වර්ෂයේ ඉදිරිපත් කිරීම හා අනුගත වනු පිණිස අවශ්‍ය තැන්හි පෙර වසරේ සංඛ්‍යා හා වාක්‍යාංශ ප්‍රති-සැකසුම්කරණය කරන ලදී.

**5. ශේෂ පත්‍ර දිනයෙන් පසු සිදුවන සිදුවීම්**

ශේෂ පත්‍ර දිනයෙන් පසු සිදුවන සියළු වැදගත් සිදුවීම් සලකා බලන ලදුව මූල්‍ය ප්‍රකාශනවල අදාළ සටහන්හි නිසි ගැලපීම් හා නිරාවරණයන් සිදුකර ඇත.

**6. වත්කම් තක්සේරුකරණය හා ඒවාහි මිනුම්කරණ පදනම්**

**6.1** දේපළ, පිරියත හා උපකරණ

දේපළ, පිරියත හා උපකරණ පහත දී ඇති පරිදි පිරිවැය/අඩුකළා සමුච්චිත ක්ෂය වීම හා ප්‍රති ඇගයුම්කරණ ලාභාලාභ ලෙස සටහන් කෙරේ. දේපළ, පිරියත හා උපකරණවල පිරිවැය වූකලි වත්කම් ඒවාහි අපේක්ෂිත උපයෝජනය සඳහා ක්‍රියාකාරී තත්ත්වයට ගෙන එනු පිණිස වැය වූ යම් වියදමක් වේනම් ඒවාද සමගින් ඒවා මිලදී ගැනීමට හෝ ගොඩනැගීමට වැයවූ පිරිවැය වේ.

**6.2** දේපළ, පිරියත හා උපකරණ ප්‍රති ඇගයුම්කරණය
ප්‍රති ඇගයුම්කරණය අවශ්‍ය වන්නේ නම් කමිටුව පත් කිරීමෙන් සිදු කෙරෙනු ඇත. කමිටුව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පත් කරනු ඇත.

**6.3** ක්ෂය වීම්
දේපළ, පිරියත හා උපකරණ පිරිවැය මත සරල මාර්ගික ක්ෂය වීම් ප්‍රතිපාදන ගණනය කෙරේ. තාක්ෂණික සාධක සලකා බලමින් පවත්නා ප්‍රයෝජනවත් කාලය සමාලෝචනය කරමින් උපකරණවල ක්ෂය වීම් අනුපාතය ප්‍රතිශෝධනය කර ඇත. ප්‍රතිශෝධිත ප්‍රයෝජනවත් කාලය කොමිෂන් සභාව විසින් අනුමත කර ඇත. ඒ අනුව, වත්කම්හි ක්ෂය වීම් අනුපාත පහත පරිදි වේ:

| | | |
|---|---|---|
| 1. | ගෘහභාණ්ඩ හා සවිකුරු | 20% |
| 2. | පරිගණක හා කාර්යාලයීය උපකරණ | |
| | මල්ටි මීඩියා ප්‍රොජෙක්ටරය | 25% |
| | ඩෙස්ක්ටොප් පරිගණකය | 25% |
| | ජංගම දුරකථන | 33 1/3% |
| | අතේ ගෙනයා හැකි දෘඪ තැටිය | 33 1/3% |
| | එල්.ටී.ඕ. ටේප් ධාවකය | 33 1/3% |
| | එල්.ටී.ඕ. ටේප් | 33 1/3% |
| | යූ.පී.එස්. | 50% |
| 3. | වාහන | 20% |
| 4. | මෘදුකාංග | 33 1/3% |

පවත්නා වර්ෂයේ දේපළ, පිරියත හා උපකරණ මිලදී ගත් දින සිට ක්ෂය වීම් ගණනය අදාළ වේ.
ඒ ඒ මූල්‍ය වර්ෂාවසානයේදී අවශ්‍ය වේනම්, වත්කම්හි ප්‍රයෝජනවත් ජීව කාලය, අවශේෂ අගයන් සහ ක්ෂය වීම් ක්‍රමද සමාලෝචනය කොට ප්‍රති ඇගයුම් කෙරේ.

**කෙරෙමින් පවත්නා ප්‍රාග්ධන කාර්යයන්**

වර්ෂය තුළ දරන ලදුව වාර්තා කරනු ලබන දිනය වනවිට සම්පූර්ණ කර නොමැති ප්‍රාග්ධන වියදම් කෙරෙමින් පවත්නා ප්‍රාග්ධන කාර්යයන් වශයෙන් පෙන්නුම් කෙරෙන අතර, වර්ෂය තුළ සම්පූර්ණ කොට පරිහරණය කිරීම සඳහා පවත්නා ප්‍රාග්ධන වත්කම් දේපළ, පිරියත හා උපකරණ වෙත මාරු කෙරෙනු ඇත.

**7. වට්ටෝරු භාණ්ඩ**

වට්ටෝරු භාණ්ඩ අවම මිලට තක්සේරු කෙරේ. එක් එක් වට්ටෝරු භාණ්ඩ කාණ්ඩයෙහි පිරිවැය පහත පදනමින් තීරණය කෙරේ.
ලිපි ද්‍රව්‍ය - මිලදී ගන්නා අවස්ථාවේ වටිනාකම

**8. ආයෝජන**

කොමිෂන් සභාව වෙත ලැබෙන ප්‍රතිලාභ උපරිම කරනු පිණිස කොමිෂන් සභාව විසින් එහි අතිරික්ත ආදායම ලංකා බැංකුවේ ස්ථාවර තැන්පතුවක් ලෙස ආයෝජනය කරනු ලබයි.

**9. ලැබිය යුතු දෑ**

ලැබිය යුතු දෑ ඒවා උපලබ්ධි කිරීමට ඇස්තමේන්තුගත ගණන් අනුව ප්‍රකාශ කෙරේ. අයහපත් හෝ සැක සහිත ණය සඳහා කිසිදු ප්‍රතිපාදනයක් සිදු නොකෙරේ.

**10. අත්තිකාරම් හා පෙර ගෙවීම්**

අත්තිකාරම් ගිණුම තුළ කාර්ය මණ්ඩලය වෙනුවෙන් වූ වෛද්‍ය රක්ෂණය සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙත ගෙවනු ලබන රක්ෂණ වාරිකයෙන් කොටසක් අන්තර්ගත වේ. මෙම රක්ෂණාවරණය 2015 සැප්තැම්බර් මස 30වන දින දක්වා බල පැවැත්වෙන බැවින්, වාරිකය සමානුපාතික පදනමින් ගෙවනු ලබන සේ සැලකීම අවශ්‍ය වේ.

**11. මුදල් හා මුදල් සමාන දේ**

මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ මුදල් හා මුදල් සමාන දේ බැංකුවේ හා අත රැඳි මුදල්වලින් සමන්විත වේ.

**12. විශ්‍රාම ප්‍රතිලාභ සැලැස්ම - පාරිතෝෂික.**

**12.1** සේවය ආරම්භ කළ දින සිට වසරකට අඩ මසක වැටුපක් ගණනය කෙරෙන පරිදි විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් ගිණුම්කරණය හා වාර්තාකරණය සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති හා අනුගතව කොමිෂන් සභාව විසින් ගන්නා ලද ප්‍රතිපත්තිමය තීරණයකට අනුව සේවකයෙකු වසරක සේවා කාලයක් සම්පූර්ණ කළ පසු විශ්‍රාමික පාරිතෝෂික ගිණුම්ගත කිරීම සඳහා වූ සම්පූර්ණ ප්‍රතිපාදන සලසා ඇත.

1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනත ප්‍රකාර, සේවකයෙකුගේ පාරිතෝෂික වගකීම ඉස්මතුවනුයේ කොමිෂන් සභාව තුළ ඔහු වසරක සේවා කාලයක් සම්පූර්ණ කළ පසුව පමණි. එබැවින්, පාරිතෝෂික පනත ප්‍රකාර පාරිතෝෂික ප්‍රතිපාදන සම්පාදනය කර ඇත.

බැරකම් සඳහා වූ ප්‍රතිපාදන ශේෂ පත්‍ර දිනයෙන් පසුව බාහිර වශයෙන් ආයෝජනය කර ඇත.

**12. 2** සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල
සුදුසුකම් ලත් සියළු සේවකයන් වෙනුවෙන් අදාළ ව්‍යවස්ථා සහ රෙගුලාසි ප්‍රකාර දායකත්වයන් ලබාදී ඇත.

2013 ඔක්තෝබර් මස 1වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි සේවක අර්ථසාධක අරමුදලේ සේවායෝජකයාගේ දායකත්වය 12% සිට 15% දක්වාද සේවාදායකයාගේ දායකත්වය 8% සිට 10% දක්වාද ඉහළ නංවන ලදී.

**13. බැරකම් හඳුනා ගැනීම**

පවත්නා වගකීම් පියවීමක් මගින් ආර්ථික ප්‍රතිලාභ අත්කර දෙන පරිදි සිදුවන සම්පත් පිටතට ඇදී යාමක් සිදු කෙරෙන අතර, එකී පියවීම සිදු කෙරෙන ප්‍රමාණය විශ්වසනීය පරිදි මිනිය හැකි වීමේ වැඩි ශක්‍යතාවයක් පවත්නා විටදී ශේෂ පත්‍රය තුළ බැරකමක් හඳුනාගනු ලබයි. ගෙවිය යුතු දෑ ඒවාහි පිරිවැයට අනුව ප්‍රකාශ කෙරේ.

**14. ආදායම් හඳුනා ගැනීම**

**14. 1 විචල්‍ය ලියාපදිංචි (බලපත්) ගාස්තු**

ශ්‍රී ලංකා රජය සමග එක්ව ක්‍රියාත්මක කරන ලද, ලිහිසි ද්‍රව්‍ය ගිවිසුමේ, 2 වගන්තිය ප්‍රකාර, ලිහිසි ද්‍රව්‍ය වෙළඳපල සහභාගිකරුවන් විසින් දෙවසරකට වරක් රුපියල් විසි පන් ලක්ෂයක් (රු. මිලියන 2.5ක්) හෝ එම කාල පරිච්ඡේදය සඳහා ඉන්වොයිසිගත සමස්ත අලෙවියෙන් 0.75%ක් හෝ යන දෙකෙන් වැඩි අගය ගෙවිය යුතු වේ. එක් එක් වර්ෂයේ ජනවාරි මස පළමුවැනිදාට හෝ එදිනට ප්‍රථම රුපියල් විසි පන් ලක්ෂයක් (රු. මිලියන 2.5ක්) ද ජූනි මස 30වන දිනට හෝ එදිනට ප්‍රථම තවත් රුපියල් විසි පන් ලක්ෂයක් (රු. මිලියන 2.5ක්)ද ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නමට බැරවන සේ ගෙවිය යුතු වේ. දෙවසරක කාලය තුළ වෙළඳපල සහභාගිකරුගේ ඉන්වොයිසිගත සමස්ත අලෙවියෙන් 0.75%ක ප්‍රමාණය රුපියල් විසිපන් ලක්ෂය ඉක්මවන්නේ නම්, එම කාල පරිච්ඡේදය අවසන් වී දින 30ක් ඇතුළත එම අතිරේක මුදල මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙත ගෙවිය යුතු වේ.

**14. 2 වාර්ෂික නියාමන ගාස්තුව**

2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 46 වගන්තිය ප්‍රකාර, වාර්ෂික නියාමන ගාස්තුවක් පැනවීමේ බලය කොමිෂන් සභාව සතුවන අතර, එය සෑම බලපත්ලාභියෙකු වෙතින්ම අදාළ වර්ෂයේ තිස්වන දිනට පෙර අයකරගත යුතුය. මෙම පනත 2009 අප්‍රේල් මස 8වන දින සහතික කරන ලදුව එදින සිට කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරන ලදී.

**14. 3 බලපත් අයදුම්පත්‍ර ගාස්තුව**

බදු පැනවීමට අමතරව, ශ්‍රී ලංකා විදුලිබල පනතේ 11 වගන්තිය ප්‍රකාර, විදුලිබලය උත්පාදනය, සම්ප්‍රේෂණය හෝ බෙදාහැරීම සඳහා බලපත්‍රයක් අයදුම් කිරීමේදී අයදුම්පත් පිරිසැකසුම්කරණ ගාස්තුවක් අයකර ගැනීමේ බලය කොමිෂන් සභාව සතු වේ.

**14. 4 පොළී ආදායම**

පොළී ආදායම උපචිත පදනම මත ගණනය කරන ලදී. අදාළ ගනුදෙනුව ආශ්‍රිත ආර්ථික ප්‍රතිලාභ කොමිෂන් සභාව වෙත ගලායාමේ වඩාත් ඉහළ හැකියාවක් පවත්නා විට පමණක් ආදායම හඳුනාගනු ලබයි. එබැවින්, 2006 අංක 10 කරන දේශීය ආදායම් පනතේ 133 (1) වගන්තිය ප්‍රකාර ඊක රඳවාගැනීමේ බද්දක් අවසාන බද්ද වශයෙන් අඩු කිරීමෙන් පසුව මූල්‍ය ප්‍රකාශනය තුළ ශුද්ධ පොළිය දක්වා ඇත.

**15.**

**15. 1 රජයේ ප්‍රතිපාදන**

කොමිෂන් සභාව විසින් සිය ආදායම ප්‍රකාර ඇස්තමේන්තුගත වැය ආවරණය කිරීමට තීරණය කර ඇති බැවින්, සමාලෝචිත වර්ෂය තුළ කිසිදු රජයේ ප්‍රතිපාදනයක් ලබා නොමැත.

**16. වියදම් හඳුනාගැනීම**

කොමිෂන් සභාව විසින් අනුමත අයවැය වෙන් කිරීම මත පදනම්ව ආදායම් ප්‍රකාශනය තුළ වියදම් හඳුනාගනු ලබයි.

**17. අනාවරණයන්**

සී.ඒ. (රිට් අයැදුම්පතත) 08/2013 සඳහා ලං.වි.ම. සුරැකුම් තැන්පතුව රු. මි. 10.6

# ආශ්‍රිත පාර්ශ්ව අනාවරණයන්

| නම | තනතුර | වෙනත් තනතුරු | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාර නිර්දේශිත ආශ්‍රිත පාර්ශ්ව සබඳතාවයන් |
|---|---|---|---|
| සී.එන්.එස්.ඩබ්. මැතිව් මහතා | සභාපති | නැත | සම්බන්ධ නොවේ |
| සංජය ගමගේ මහතා | නියෝජ්‍ය සභාපති | සාමදාන විනිශ්චයකාර, නිල නොලත් මහේස්ත්‍රාත් | සම්බන්ධ නොවේ |
| මහාචාර්ය රාහුල අත්තලගේ මහතා | කොමිෂන් සභා සාමාජික | අධ්‍යක්ෂ - එන්වයර්න් සස්ටේනබිලිටි ග්ලෝබල් පුද්ගලික සමාගම,<br><br>අධ්‍යක්ෂ - පොලිපෝ පුද්ගලික සමාගම (මොරටුව විශ්වවිද්‍යාලය නියෝජනය කරන) | සම්බන්ධ නොවේ<br><br>සම්බන්ධ නොවේ |
| ප්‍රසාද් ගල්හේන මහතා | කොමිෂන් සභා සාමාජික | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික<br><br>1. සීමාසහිත ව්‍යාපාර කළමනාකරණ ජාතික පාසැල් සමාගම<br><br>2. එස්.එල්.ටී. විෂන් කෝන් පුද්ගලික සමාගම | සම්බන්ධ නොවේ<br><br>සම්බන්ධ නොවේ |

**සටහන 01**
**ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව**
**2017 දෙසැම්බර් 31 දිනට දේපළ, පිරියත හා උපකරණ**

| | ගෘහභාණ්ඩ හා සවිකරු රු. | පරිගණක හා කාර්යාලයීය උපකරණ රු | වාහන රු. | මෙවලම් රු. | මෘදුකාංග රු. | එකතුව රු. |
|---|---|---|---|---|---|---|
| වසර ආරම්භයේදී | 14,809,649 | 32,475,215 | 32,869,060 | 30,305 | 8,436,577 | 88,620,806 |
| වසර තුළ එක් කිරීම් | 86,678.00 | 9,479,115 | - | | | 9,565,793 |
| සිදු කෙරෙමින් පවතින කටයුතුවලින් මාරු කළ | | | | | 595,000 | 595,000 |
| වසර තුළ බැහැර කිරීම් | | (123,132) | | | | (123,132) |
| වර්ෂාවසානයේදී | **14,896,327** | **41,831,198** | **32,869,060** | **30,305** | **9,031,577** | **98,658,467** |
| ක්ෂය වීම් | | | | | | |
| වසර ආරම්භයේදී | 12,104,677 | 19,120,854 | 23,197,086 | - | 4,722,344 | 59,144,961 |
| වසර සඳහා අයකිරීම් | 1,370,396 | 5,006,917 | 3,573,882 | | 1,448,432 | 11,399,626 |
| පෙර වසර සඳහා ගැලපීම් | | | | | | - |
| බැහැර කිරීම මත ක්ෂය වීම | | (123,132) | | | | (123,132) |
| වර්ෂාවසානයේදී | **13,475,073** | **24,004,638** | **26,770,968** | - | **6,170,776** | **70,421,455** |
| 2017 දෙසැම්බර් 31 දිනට ශුද්ධ පොත් අගය | **1,421,254** | **17,826,560** | **6,098,092** | **30,305** | **2,860,801** | **28,237,012** |

**සටහන 1:1 ඉටු කෙරෙමින් පවත්නා ප්‍රාග්ධන කටයුතු**

| | |
|---|---|
| HRIS | 1,120,000 |
| වෙබ් අඩවිය | 1,520,000 |
| ලිහිසි ද්‍රව්‍ය | |
| IRS | 780,000 |
| 17වන මහල බෙදා වෙන් කිරීම (partitioning) | 6,189,226 |
| DMS | 501,458 |
| | 10,110,684 |

**ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව**
**2017 ජනවාරි 1 දින සිට දෙසැම්බර් 31 දින දක්වා**
**මූල්‍ය ප්‍රකාශන සටහන්**

| | 2017<br>Rs | 2016<br>Rs |
|---|---|---|
| **02. ආයෝජන** | | |
| ස්ථාවර තැන්පතු | 140,000,000 | 84,500,000 |
| පාරිතෝෂික අරමුදලේ ආයෝජන | 12,076,267 | 9,590,626 |
| | **152,076,267** | **94,090,626** |
| **03. භාණ්ඩ වට්ටෝරු** | **558,211** | **431,740** |
| **04. ලැබිය යුතු දෑ** | | |
| විවල්‍ය ලියාපදිංචි ගාස්තුව | | |
| චෙව්රන් ලුබ්‍රිකන්ට්ස් සමාගම | 34,756,463 | 4,000,000 |
| ලංකා අයි.ඕ.සී. සමාගම | 9,005,070 | 4,000,000 |
| මැක්ලරන්ස් ලුබ්‍රිකන්ට් | 4,136,360 | 2,781,804 |
| ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව | 10,000,000 | 4,000,000 |
| ලාෆ්ස් | 3,868,641 | 2,050,106 |
| ඉන්ටර්ඕෂන් සර්විසස් සමාගම | 550,862 | 570,545 |
| ඇසෝෂියේටඩ් මෝටර්වේස් | 1,224,691 | 1,342,347 |
| ටී.වී.එස්. ලංකා පුද්ගලික සමාගම (භාරත් ඛනිජතෙල් සංස්ථාව) | 2,439,180 | 2,561,130 |
| යුනයිටඩ් මෝටර්ස් | 3,000,000 | 862,263 |
| ටොයොටා ලංකා පුද්ගලික සමාගම | 5,270,334 | 3,488,915 |
| එන්.එම්.ඩිස්ට්‍රිබියුටර්ස් පුද්ගලික සමාගම | 1,542,306 | 1,834,698 |
| | **75,793,907** | **27,491,808** |
| වාර්ෂික නියාමන ගාස්තු | 83,215,750 | 82,074,700 |
| ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලිය | 4,144,525 | 2,882,644 |
| වෙනත් ලැබිය යුතු දෑ | 258,544 | 154,847 |
| | **163,412,726** | **112,603,999** |
| **05. තැන්පතු, අත්තිකාරම් හා ගෙවීම්** | | |
| තැන්පතු | | |
| තැන්පතු ඩයලොග් ඇක්සියාටා පී.එල්.සී. | 1,500 | 1,500 |
| බී.ඕ.සී. ප්‍රොපර්ටි ඩිවලප්මන්ට් සමාගම | 826,571 | 826,571 |
| ගර්ල් ෆ්‍රෙන්ඩ්ලි ඇසෝෂියේෂන් | 35,000 | 25,000 |
| ස්ථාවර වත්කම් සඳහා ප්‍රතිපාදන සැලසීමේ තැන්පතු | - | 241,689 |
| | **863,071** | **1,094,760** |
| අත්තිකාරම් හා පූර්ව ගෙවීම් | | |
| අත්තිකාරම් | 1,268,636 | 222,563 |
| තැපැල් දෙපාර්තමේන්තුව | 26,840 | 26,840 |
| පූර්ව ගෙවීම් | 5,990,083 | 4,278,597 |
| | **7,285,559** | **4,528,000** |
| ආපදා ණය | 1,432,596 | 1,453,075 |
| උත්සව අත්තිකාරම් | 118,600 | 112,100 |
| සමස්ත තැන්පතු, අත්තිකාරම් හා පූර්ව ගෙවීම් | **9,699,826** | **7,187,935** |

**ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව**
**2017 ජනවාරි 1 දින සිට දෙසැම්බර් 31 දින දක්වා**
**මූල්‍ය ප්‍රකාශන සටහන්**

| | 2017<br>Rs | 2016<br>Rs |
|---|---|---|
| **06. සමුච්චිත අරමුදල** | | |
| 2017 ජනවාරි 1 දිනට ශේෂය | 205,943,678 | 207,128,049 |
| 17/12/31 දිනට අතිරික්තය/(හිඟය) | 111,090,475 | (3,082,655) |
| පෙර වසරේ ගැළපීම් (6.1) | 309,804 | 1,898,284 |
| | **317,343,957** | **205,943,678** |
| **6.1 පෙර වසරේ ගැළපීම් පිළිබඳ අනාවරණය 2016** | | |
| **කාණ්ඩය** | **Total** | **2016** |
| මල් | (7,038) | (7,038) |
| වෙනත් දීමනා | (255,575) | (255,575) |
| විවල්‍ය ලියාපදිංචි ගාස්තුව | 968,587 | 968,587 |
| විගණන ගාස්තුව | (349,275) | (349,275) |
| මුද්‍රණ | 3,399 | 3,399 |
| අත්තිකාරම් කපා දැමීම් | (55,000) | (55,000) |
| විදේශ සංචාර | 465 | 465 |
| සන්නිවේදන | 4,242 | 4,242 |
| **එකතුව** | **309,804** | **309,804** |
| **07. ගෙවිය යුතු ගිණුම** | | |
| මුද්‍රණ හා වෙළඳ දැන්වීම් | 814,000 | 1,552,440 |
| සන්නිවේදන | 283,394 | 347,792 |
| මල් සැරසිලි | 8,863 | 1,825 |
| වෙනත් දීමනා | 2,821,754 | 2,682,665 |
| පුවත්පත් | 16,130 | - |
| අතිකාල | 93,078 | 98,760 |
| ප්‍රවාහන | 8,754 | 3,712 |
| ගමන් වියදම් | 17,250 | 11,000 |
| සුභ සාධන හා මහජන සම්බන්ධතා | 541 | 25,938 |
| කාර්යාල ගොඩනැගිල්ල නඩත්තු කිරීම | 44,457 | 180 |
| කාර්යාල වාහනය නඩත්තු කිරීම | 4,110 | - |
| දායක මුදල් | | 458,896 |
| ජලය | 26,238 | 13,883 |
| විදුලි බලය | 101,629 | 78,626 |
| මහජනතාව දැනුවත් කිරීම් | 12,122,017 | 11,220,931 |
| උපදේශන | 7,691,607 | 9,744,663 |
| ගෙවිය යුතු මුද්දර ගාස්තු | 3,700 | 3,750 |
| සනීපාරක්ෂක සේවා | 59,400 | 7,500 |
| තැපැල් | 840 | - |
| රක්ෂණ | 223,120 | 36,660 |
| ගෙවිය යුතු ඉටු කෙරෙමින් පවත්නා ප්‍රාග්ධන කටයුතු | 3,389,909 | 241,689 |
| රඳවා ගත් මුදල් | 199,951 | |
| | **27,930,742** | **26,530,908** |

**ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව**
**2017 ජනවාරි 1 දින සිට දෙසැම්බර් 31 දින දක්වා**
**මූල්‍ය ප්‍රකාශන සටහන්**

| | 2017 Rs | 2016 Rs |
|---|---|---|
| **08. විගණකාධිපති ගාස්තු** | | |
| ඉදිරියට ගෙන ආ ශේෂය | 784,050 | 740,000 |
| වසර තුළ ගෙවීම් (2015) | (257,025) | (466,200) |
| 2017 වසර සඳහා ප්‍රතිපාදන | 877,000 | 270,000 |
| 2015 හා 2016 සඳහා අව-ප්‍රතිපාදනයන් | 349,275 | 240,250 |
| | **1,753,300** | **784,050** |
| **09. විචල්‍ය ලියාපදිංචි ගාස්තු** | | |
| ලංකා අයි.ඕ.සී. සමාගම | 16,619,342 | 8,000,000 |
| චෙව්රොන් ලුබ්‍රිකන්ට් ලංකා | 68,710,988 | 8,000,000 |
| මැක්ලරන්ස් ලුබ්‍රිකන්ට් | 8,916,953 | 4,139,478 |
| ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව | 10,000,000 | 7,946,172 |
| ලාෆ්ස් ලුබ්‍රිකන්ට් සමාගම | 5,704,891 | 3,460,653 |
| ඉන්ටර්ඕෂන් සර්විසස් සමාගම | 550,862 | 938,372 |
| ඇසෝෂියේටඩ් මෝටර්වේස් | 2,239,299 | 2,640,331 |
| ටී.වී.එස්.ලංකා පුද්ගලික සමාගම | 4,418,050 | 4,699,430 |
| යුනයිටඩ් මෝටර් | 3,000,000 | 1,787,883 |
| ටොයොටා ලංකා පුද්ගලික සමාගම | 10,223,572 | 6,690,205 |
| එන්.එම්. ඩිස්ට්‍රිබියුටර්ස් පුද්ගලික සමාගම | 2,407,428 | 1,419,324 |
| | **132,791,385** | **49,721,848** |
| **10. වාර්ෂික නියාමන ගාස්තු** | | |
| උත්පාදන | 62,820,911 | 61,320,742 |
| සම්ප්‍රේෂණ | 23,820,000 | 21,360,000 |
| බෙදාහැරීම | 101,640,000 | 90,032,000 |
| | **188,280,911** | **172,712,742** |
| **11. බලපත් අයැදුම්පත්‍ර ගාස්තු** | 195,000 | 160,000 |
| | **195,000** | **160,000** |
| **12. වෙනත් ආදායම්** | | |
| පොළිය | 9,791,261 | 6,570,707 |
| නිදහස් කිරීමේ ගාස්තු | 25,000 | 34,000 |
| විවිධ ආදායම් | 74,515 | 4,340 |
| ආදායම: ස්ථාවර වත්කම් බැහැර කිරීම | 90,460 | 25,217 |
| රජයේ ප්‍රදානයන් ක්‍රමක්ෂය වීම | - | 238,422 |
| | **9,981,236** | **6,872,685** |
| **13. පුද්ගල පිරිවැය** | | |
| පුද්ගල පඩිනඩි | | |
| කොමසාරිස්වරයාගේ පාරිශ්‍රමිකය | 1,536,000 | 1,536,000 |
| වැටුප් | 51,164,567 | 49,412,573 |
| වෙනත් දීමනා | 29,020,401 | 26,050,042 |
| අතිකාල | 1,067,992 | 1,375,340 |
| සේවක අර්ථසාධක අරමුදලට දායකත්වය | 7,679,819 | 7,411,170 |
| සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට දායකත්වය | 1,535,064 | 1,482,241 |
| පාරිතෝෂික වියදම | 2,983,015 | 2,181,812 |
| | **94,986,858** | **89,449,178** |

**ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව**
**2017 ජනවාරි 1 දින සිට දෙසැම්බර් 31 දින දක්වා**
**මූල්‍ය ප්‍රකාශන සටහන්**

| | 2017 Rs | 2016 Rs |
|---|---|---|
| **14. මෙහෙයුම් පිරිවැය** | | |
| පුහුණු හා ගමන් වියදම් - විදේශීය හා දේශීය | | |
| විදේශීය හා දේශීය පුහුණු | 5,216,288 | 4,770,568 |
| විදේශ ගමන් වියදම් | 1,582,179 | 1,287,084 |
| අනියම් / දෛනික | 4,746,276 | 3,793,995 |
| ගමන් (දේශීය) | 888,602 | 1,060,798 |
| | **12,433,345** | **10,912,446** |
| පරිභෝජනය කෙරෙන ද්‍රව්‍ය | | |
| ලිපිද්‍රව්‍ය | 732,306 | 532,483 |
| ඉන්ධන හා වාහන ගාල් කිරීමේ | 4,638,271 | 4,380,115 |
| පරිභෝජනය කෙරෙන ද්‍රව්‍ය | 66,142 | 143,663 |
| විනෝද | 490,332 | 194,929 |
| | **5,927,051** | **5,251,190** |
| **කොන්ත්‍රාත් සේවා** | | |
| ප්‍රවාහන හා වාහන කුලී | 12,428,538 | 13,044,068 |
| පුවත්පත් හා තැපැල් ඇතුළු සන්නිවේදන | 3,763,979 | 3,342,035 |
| මුද්‍රණ හා දැන්වීම්කරණ | 5,186,356 | 3,483,284 |
| සමීක්ෂණ | | 744,337 |
| ගොඩනැගිලි බදුකුලී හා ගාස්තු අනුපාත | 16,720,783 | 10,872,744 |
| විදුලි බලය | 1,187,768 | 1,041,868 |
| වෛද්‍ය | 5,082,875 | 4,722,692 |
| ජලය | 274,352 | 260,230 |
| රක්ෂණය | 1,248,463 | 844,082 |
| දායක මුදල | 152,965 | 458,896 |
| සනීපාරක්ෂක සේවා | 1,413,670 | 1,029,604 |
| නීති හා පරීක්ෂණ ගාස්තු | 1,616,392 | 41,000 |
| | **49,076,141** | **39,884,840** |
| **වෙනත් සේවා** | | |
| මහජනතාව දැනුවත් කිරීමේ පිරිවැය | 30,614,279 | 28,905,096 |
| විගණකාධිපති ගාස්තු | 877,000 | 270,000 |
| සුභසාධන හා මහජන සම්බන්ධතා | 45,653 | 471,912 |
| මල් සැකසුම් | 113,397 | 95,578 |
| සේවක දායකත්වය | 759,585 | |
| පාරිභෝගික උපදේශන කමිටු වියදම් | | |
| idla (SAARC) වැඩසටහන | | 2,563,814 |
| සෆිර් (SAFIR) වැඩසටහන | 230,350 | |
| විවිධ හා වෙනත් | 54,914 | 179,843 |
| | **32,695,178** | **32,486,243** |
| ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා සහ නඩත්තු හා ක්ෂය වීම් | | |
| වාහන නඩත්තු | 767,363 | 804,832 |
| කාර්යාල ගොඩනැගිලි නඩත්තු | 72,613 | 380,673 |
| පරිගණක, උපකරණ සහ මෘදුකාංග නඩත්තුව | 1,828,218 | 1,429,352 |
| ක්ෂය වීමේ ගාස්තු | 11,399,626 | 11,907,483 |
| | **14,067,820** | **14,522,339** |
| සමස්ත මෙහෙයුම් පිරිවැය | **114,199,535** | **103,057,057** |
| **15. මූල්‍ය පිරිවැය** | | |
| **බැංකු ගාස්තු** | 5,972 | 10,680 |
| විනිමය මාරු කිරීමේදී සිදුවන අලාභ | 4,959 | 4,281 |
| | **10,931** | **14,961** |

# 2017 වර්ෂය සඳහා වූ විගණන කමිටු වාර්තාව

### විගණන කමිටුවේ සංයුතිය

2010 දෙසැම්බර් මස 14 දිනැති රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරන ලද අංක පීඞී/55 දරන චක්‍රලේඛය තුළ ලබාදී ඇති නියමයන් මත පදනම්ව, කොමිෂන් සභාව විසින් විගණන කමිටුව සඳහා පහත සඳහන් සාමාජිකයන් හා නිලධාරීන් පත් කරන ලදී.

| **සාමාජිකයාගේ නම** | විගණන කමිටුවේ දරන තත්ත්වය | නියෝජනය / තනතුර |
|---|---|---|
| **ප්‍රසාද් ගල්හේන මහතා** | විගණන කමිටුවේ සභාපති | ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ සාමාජික |
| **සංජය ගමගේ මහතා** | විගණන කමිටුවේ උප සභාපති | ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ නියෝජ්‍ය සභාපති |
| **ජානකී විතානගම මහත්මිය** | විගණන කමිටුවේ ලේකම් | ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ ලේකම් |
| **එම්.ආර්.වී.ආර්.මීපුර මහතා** | නිරීක්ෂක - මුදල් අමාත්‍යාංශය | අධ්‍යක්ෂ - රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව |
| **ටී.ආර්.එම්.වීරරත්න මහත්මිය** | නිරීක්ෂක - විගණකාධිපති දෙපාර්තමේන්තුව | විගණන අධිකාරී |
| **එන්.ජී.මධුසංක මහතා** | නිරීක්ෂක - ජ්ඛීය අමාත්‍යාංශය | ගණකාධිකාරී - ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය |
| **කේ.ජී.කීර්තිසේන මහතා** | කැඳවුම්කරු | අභ්‍යන්තර විගණක - ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව |
| **දමිත කුමාරසිංහ මහතා** | ආරාධනය පරිදි | අධ්‍යක්ෂ ජනරාල් - ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව |
| **බී.එස්.ජයපාල මහතා** | ආරාධනය පරිදි | මුදල් අධ්‍යක්ෂ - ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව |

ඉහත නම් සඳහන් නිලධාරීන්ගේ සහභාගිත්වය සහිතව 2017 වර්ෂය තුළ විගණන කමිටු රැස්වීම් පහක් පැවැත්විණි. විගණන කමිටුව විසින් ඉටුකරන ලද ප්‍රධාන කාර්යයන් අතරින් සමහරක් පහත විස්තර කර ඇත.

- අභ්‍යන්තර විගණකවරයාගේ වාර්ෂික විගණන සැලැස්ම තීරණය හා සමාලෝචනය.
- අභ්‍යන්තර පාලන පද්ධතිය බල ගැන්වීම සඳහා පාලක පද්ධති හඳුන්වා දීම.
- 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනත සහ 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත යටතේ කොමිෂන් සභාව වෙත පවරා ඇති කාර්යයන් ඉටු කරනු පිණිස සිදුකර ඇති ආයෝජන වෙතින් උපරිම ප්‍රතිලාභ ලබාගැනීම පිණිස අවශ්‍ය කරන්නාවූ ක්‍රමෝපායන් සම්බන්ධයෙන් කාලීන මාර්ගෝපදේශ හා උපදෙස් ලබාදීම.
- රජයේ නීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ හා අනුගතවන බවට වගබලා ගනිමින් කාර්ය සාධනය, පිරිවැය ඵලදායකත්වය හා නාස්තිකාර වියදම් පිටු දැකීම සමාලෝචනය.
- විගණකාධිපති ගිණුම් මගින් පෙන්වා දී ඇති ඌණතා හා අඩු ලුහුඩුකම් නිවැරදි කරන බවට වගබලා ගැනීම.
- ගාස්තු හා අයකිරීම් නිසි කලට රැස් කෙරෙන බවට වූ වාර්තා සමාලෝචනය හා යාවත්කාලීන කිරීම.
- වත්කම් සංරක්ෂණය සඳහා පද්ධති පාලනය හඳුන්වා දීම.
- අභ්‍යන්තර විගණකවරයාගේ නිරීක්ෂණ හා නිර්දේශ මත පදනම්ව සුදුසු තීරණ ගැනීම.

# 2017 වර්ෂය තුළ පවත්වන ලද විගණන කමිටු රැස්වීම් පිළිබඳ විස්තර

| කමිටු සාමාජිකයාගේ නම | කමිටුවේ දරන තත්ත්වය | 2017 Jan 19 | 2017 Feb 01 | 2017 June 15 | 2017 Sep 21 | 2017 Dec 21 | Total |
|---|---|---|---|---|---|---|---|
| ප්‍රසාද් ගල්හේන මහතා | සභාපති | 1 | 1 | 1 | 1 | 0 | 04 |
| සංජය ගමගේ මහතා | නියෝජ්‍ය සභාපති | 1 | 1 | 1 | 1 | 1 | 05 |
| ජානකී විතානගම මහත්මිය | ලේකම් | 1 | 1 | 1 | 1 | 1 | 05 |
| කේ.ජී.කීර්තිසේන මහතා | කැඳවුම්කරු | 1 | 1 | 1 | 1 | 1 | 05 |
| ටී.ආර්.එම්.වීරරත්න මහත්මිය | නිරීක්ෂක | 1 | 1 | 1 | 1 | 1 | 05 |
| එම්.ආර්.වී.ආර්. මීපුර මහතා | නිරීක්ෂක | 1 | 1 | 1 | 1 | 1 | 05 |
| එන්.ජී.මධුසංක මහතා | නිරීක්ෂක | 1 | 1 | 1 | 1 | 1 | 05 |
| දමිත කුමාරසිංහ මහතා | ආරාධිත | 1 | 1 | 1 | 1 | 0 | 04 |
| බී.එස්.ජයපාල මහතා | ආරාධිත | 1 | 1 | 1 | 1 | 1 | 05 |

විගණක විසින් ඉස්මතු කරන ලද විගණන විමසුම් පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා ලේකම්වරයාගේ සභාපතිත්වයෙන් ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේදී (රේඛීය අමාත්‍යාංශයේදී) විගණන හා කළමනාකරණ කමිටු 04ක් පවත්වන ලදී. අමාත්‍යාංශය හා විගණකාධිපතිවරයා විසින් ලබාදුන් නිර්දේශ හා නියෝග ක්‍රියාත්මක කරන ලදී. විගණන කමිටුවේ ඉහත රැස්වීම්වලට අමතරව, කොමිෂන් සභාවේ මූල්‍ය හා භෞතික ප්‍රගතිය පිළිබඳ සමාලෝචනය කොට විගණකාධිපති හා කොමිෂන් සභාවේ අභ්‍යන්තර

ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යංශය විසින් පවත්වන ලද විගණන හා කළමනාකරණ කමිටු පිළිබඳ විස්තර

| කොමිෂන් සභාව නියෝජනය කරමින් සහභාගිවූවන් | පවත්වන ලද විගණන හා කළමනාකරණ කමිටු පිළිබඳ විස්තර | | | | |
|---|---|---|---|---|---|
| | 2017 මාර්තු 16 | 2017 ජූලි 21 | 2017 ඔක්. 03 | 2017 දෙසැ. 28 | Total |
| දමිත කුමාරසිංහ මහතා (අධ්‍යක්ෂ ජනරාල්) ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව | 1 | 1 | 1 | 0 | 3 |
| ජානකී විතානගම මහත්මිය (ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ ලේකම්) | 1 | 1 | 1 | 1 | 4 |
| කේ.ජී.කීර්තිසේන මහතා (අභ්‍යන්තර විගණක) ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව | 1 | 1 | 1 | 0 | 3 |
| බී.එස්.ජයපාල මහතා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ මුදල් අධ්‍යක්ෂ | 1 | 1 | 1 | 1 | 4 |

**ප්‍රසාද් ගල්හේන මහතා**
**සභාපති**
**විගණන කමිටුව**
**ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව**
**2018.03.15**

**PUBLIC UTILITIES COMMISSION OF SRI LANKA**
6th Floor, BOC Merchant Tower, St. Michael's Road, Colombo 3, Sri Lanka.
E-mail: info@pucsl.gov.lk
Telephone: +9411 239 2607/8 Fax: +9411 239 2641
www.pucsl.gov.lk

Designed & Produced by
The Extrem Media
etm.ceylon@gmail.com , +94 114 994 377 , +94 716 826 037